# බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාව
# මහා සභා රැස්වීමේ වාර්තාව.
# 2019.12.17

වර්ෂ 2019 ක් වූ දෙසැම්බර් මස 17 වන අඟහරුවාදා දින පෙ.ව. 09.30 ට බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේ දී පැවැත්වූ දෙසැම්බර් මස මහා සභා රැස්වීමේ වාර්තාවයි.

**සහභාගීත්වය.**

01. ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා
02. ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා
03. ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා
04. ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා
05. ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා
06. ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා
07. ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා
08. ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා
09. ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා
10. ගරු මන්ත්‍රීනි එම්. ගයාත්‍රි කාංචනා මැතිණිය
11. ගරු මන්ත්‍රීනි ඩී.ජී. වාසනා උදයංගනී මැතිණිය
12. ගරු මන්ත්‍රී යූ.එල්. තුසිත චාමින්ද මැතිතුමා
13. ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා
14. ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා
15. ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා
16. ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා
17. ගරු මන්ත්‍රීනි පී. ටෙක්ලා ශ්‍යාමලී මැතිණිය
18. ගරු මන්ත්‍රීනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය
19. ගරු මන්ත්‍රීනි ඒ.ආර්.එස්. සංජීවනී අතුකෝරල මැතිණිය
20. ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා
21. ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා
22. ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා

මීට අමතරව ප්‍රාදේශීය සභා ලේකම් එල්.එච්. අනිල් රංජන් මහතා ද සහභාගී විය.

**<u>ආගම සිහි කිරීම හා සභාව පිළිගැනීම.</u>**

ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සියලුම ගරු සභිකවරුන්, ලේකම්තුමා ප්‍රධාන නිලධාරීන් හා මාධ්‍යවේදීන් පිළිගැනීමෙන් අනතුරුව පළමුව ආගම සිහිපත් කරන ලදී. ඉන් අනතුරුව විනාඩියක නිශ්ශබ්දතාවය රැකීමෙන් රට වෙනුවෙන් සටන් වැද මියගිය රණවිරුවන් හා මියගිය සභිකවරුන්, නිලධාරීන් හා සේවකයන් සිහිපත් කරන ලදී.

( ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා සභාවට සහභාගි වීම සිදුවිය. )

**<u>(අ) පසුගිය රැස්වීමේ වාර්තාව සම්මත කිරීම</u>**

**<u>1) 2019.11.19 දින පැවති මහා සභා රැස්වීමේ වාර්තාව සම්මත කිරීම</u>**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** 2019.11.19 දින පැවති මහා සභා රැස්වීමේ වාර්තාව කියෙව්වා සේ සලකා, විරෝධතා හෝ නිවැරදි කිරීම් තිබේ නම් ඉදිරිපත් කරන්න. නැත්නම් 2019.11.19 දින පැවති මහා සභා රැස්වීමේ වාර්තාව ලියා ඇති පරිදි ස්ථිර කරන ලෙස යෝජනා කරන්න. සංශෝධන තිබේ නම් ඉදිරිපත් කරන්න.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** 2019.11.19 දින පැවති මහා සභා රැස්වීමේ වාර්තාව සංශෝධනවලට යටත්ව සභා සම්මත කිරීමට මම යෝජනා කරනවා.

**ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** සංශෝධන තිබේ නම් ඉදිරිපත් කරන්න.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, සුභ උදෑසනක් වේවා. 2019.10.22 දින පැවති මහා සභා රැස්වීමේ වාර්තාවේ අඩුපාඩු කිහිපයක් ගිය සභාවේදී පෙන්වලා දුන්නා. 2019.11.19 සභා වාර්තාවේ ඒකේ සමහර දේවල් නිවැරදි කිරීම හරියාකාරව සිදු වෙලා නෑ.

2 වෙනි පිටුව.

" 1999 දී මම ලංකාවෙන් ශක්තිමත්ම තරුණයා තෝරන තරඟයට ඉදිරිපත් වුණා රටවල් 160 ක් එක්ක." ඒක " 1999 දී මම ලංකාවෙන් ශක්තිමත්ම තරුණයා තෝරන තරඟයට ඉදිරිපත් වුණා රටවල් 168 ක් එක්ක." ලෙස සංශෝධනය විය යුතුයි.

"මම හිතන්නේ ඒක රටවල් 160 ක් ඔස්සේ සජීවීව විකාශය වුණා." ඒක "මම හිතන්නේ ඒක රටවල් 168 ක් ඔස්සේ සජීවීව විකාශය වුණා." ලෙස සංශෝධනය විය යුතුයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** තවත් සංශෝධන තිබේද?.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** 2019.11.19 දින පැවති මහා සභා රැස්වීමේ වාර්තාව සංශෝධනවලට යටත්ව ඒකමතිකව සභා සම්මත විය.

( ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා සභාවට සහභාගි වීම සිදුවිය. )

**(ආ) සභාපතිවරයා විසින් කරනු ලබන විශේෂ නිවේදන**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මේ වර්ෂයේ අවසාන මහා සභා රැස්වීම මේ. එතනදී මේ දක්වා අපිට කරන්න බැරි වෙච්ච ගොඩක් දේවල් තියෙනවා. ඒක අවංකවම අපි පිළිගන්න ඕන කාරණාවක්. ඒ වගේම කරපු දේවලුත් සෑහෙන්න ප්‍රමාණයක් තියෙනවා. මේ අවුරුද්දේ අඩුපාඩුකම් සිද්ධ වුණානම් මේ වර්ෂයේදී ඒවා ඉවර කර ගෙන ලබන වර්ෂය මුල ඉඳන් අපි සක්‍රීයව යමු. ඊයේ මම ලේකම්තුමා එක්කත් සෑහෙන්න වෙලාවක් සාකච්ඡා කරා. අපි ඉලක්ක වලට යන්න තියෙන කාලය පිළිබඳව සාකච්ඡා කළේ. අපි ආදායම් ප්‍රවර්ධන කටයුතු සඳහා මූලික තැනක් දෙන්න තමයි සිද්ධ වෙලා තියෙන්නේ. කොළඹින් අපිට ලැබිය යුතු මුද්දර ගාස්තු පිළිබඳව අපි ලබන සතියේ ක්‍රියාත්මක වෙන්න ඕන. ඒ වගේම මේ අවස්ථාවේදී මම ස්තුතිවන්ත වෙනවා අපේ ලේකම්තුමාට. මොකද එතුමා සෑම ආයතනයකටම ගිහිල්ලා අපිට එන්න ඕන මුද්දර ගාස්තු පිළිබඳව හොයලා බලලා ගාල්ල දිස්ත්‍රික්කයේ අනෙකුත් පළාත් පාලන ආයතන වලටත්, ඒ මුදල් ඉක්මනින් ලබා ගන්න තත්ත්වයක් ඇති කළා. පළාත් ආදායම් එකට, දේශීය ආදායම් එකට ඒ සියලු තැන්වලට ගිහින් හොයලා බලලා අපිට ඉදිරි වර්ෂයේදී කෝටි හයක විතර මුදලක් දළ වශයෙන් ලබා ගන්න පුළුවන් තත්ත්වයක් ඇති වෙලා තියෙනවා. ඒක තුළ ප්‍රාදේශීය සභාව වශයෙන් මීට වැඩිය වැඩි සේවයක් ලබන වර්ෂයේදී කරන්න අපිට හැකියාව ලැබේවි. ඒ වගේම සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලය ඉදිවෙමින් පවතිනවා. අපිට ඒකත් ලබන වර්ෂයේ මුල් මාස හය ඇතුළත පළවෙනි තට්ටුවේ වැඩ අවසන් කරලා විවෘත කරලා සායනයේ වැඩ කටයුතු පටන් ගන්න පුළුවන් කියන හැඟීමක් තියෙනවා. ඒ වගේම පොළ භූමියේ සැලසුම් කටයුතු සම්පූර්ණයෙන්ම අවසන් කරලා තියෙනවා. ඒකට වෙනත් ආයතනයකින් ණය අරගෙන හරි ඒ වැඩ පිළිවෙල ආරම්භ කරන්න බලාපොරොත්තු වෙනවා.

ඊළඟට අපේ ඊළඟ ඉලක්කය වන්නේ සභා ගොඩනැගිල්ල හා ආදාහනාගාරය ඉදිකිරීම. එකේදී අපි බලාපොරොත්තු වෙනවා වැවිලි කර්මාන්ත අමාත්‍ය රමේෂ් පතිරණ මැතිතුමාගේ දායකත්වය මත, මැදිහත්වීම මත ඒ ඉඩම පුළුවන් තරම් ඉක්මනට ලබා ගෙන ඒ කටයුත්ත ආරම්භ කරන්න. කසළ ප්‍රතිචක්‍රීකරණයට ලක්ෂ 90 ක බර්නර් එකක් ගෙනල්ලා සවි කරනවා. ඒක බලන්න අනුරාධපුරයේ යන්න දිනයක් තීරණය කර ගන්න ඉන්නේ. පසුගිය දවස්වල අධික වර්ෂාව නිසා අපිට යන්න බැරි වුණා. මන්ත්‍රීවරු සියලුදෙනා ගිහින් ඒකේ තත්ත්වය නිරීක්ෂණය කරමු. මුලින් නිලධාරීන් ගිහින් ඒක බලල ඇවිල්ලා සුදුසු නම් ඊළඟට මන්ත්‍රීවරුන්ට ඒක බලන්න යන්න චාරිකාවක් සූදානම් කරන්න අපි බලාපොරොත්තු වෙනවා.

ඒ වගේම අද පෙරවරු 10.30 ට එනවා කිව්වා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලයෙන්. එතුමන්ලාට අවස්ථාවක් ඉල්ලුවා නව ආහාර ප්‍රඥප්තිය පිළිබඳව මන්ත්‍රීවරුන්ව දැනුවත් කරන්න. මොකද 2020 වර්ෂයේ නව ආහාර ප්‍රඥප්තිය එළි දැක්වෙනවා. හෝටල් හිමියන් හා ආහාර නිෂ්පාදකයින් සඳහා මාස 06 ක කාලයක් ලබා දෙනවා තියෙන අඩුපාඩුකම් සම්පූර්ණ කර ගන්න. ඉතිං එතනදී අපි බලාපොරොත්තු වන්නේ අපෙනුත් සිදුවන සේවයක් විදියට ප්‍රාදේශීය සභාව මැදිහත් වෙන්න. ආහාර කියන්නේ වර්තමානයේ විශේෂ ඉල්ලුමක් තියෙන දෙයක්. ඒ නිසා ඒක පිරිසිදුව පරීක්ෂාකාරී ආකාරයෙන් දෙන්න ඕන. ඉතිං ඒකට හෝටල් හිමියන් දැනුවත් කිරීමේ වැඩසටහනක් පැවැත්වුවා. සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලයෙන් ඒක කරේ මේ ස්ථානයේ. ඉතිං එතනදීත් ඔවුන් දැනුවත් කරා. ඊට අමතරව මන්ත්‍රීවරුන්ව දැනුවත් කරන්න අද පෙරවරු 10.30 ට වේලාව ඉල්ලුවා. මම පෙරවරු 10.30 ට ඔවුන් ආවම ඒ අවස්ථාව ලබා දෙනවා. ජනවාරි පළවෙනිදා දානමය කටයුත්තක් කාර්යාල පරිශ්‍රයේ සිදු වෙනවා. ඒ සඳහා සියලුම මන්ත්‍රීතුමන්ලාට, මන්ත්‍රීතුමියන්ලාට ආරාධනා කරනවා. ඉතිං ඒ ටික තමයි ප්‍රධාන වශයෙන් සඳහන් කරන්න ඕන.

( ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා සභාවට සහභාගි වීම සිදුවිය.)

**(ඇ) ප්‍රාදේශීය සභාව අමතා එවන ලද සංදේශ, පෙත්සම්, පැමිණිලි හා සන්නිවේදන සභාව ඉදිරියේ තැබීම. ඃ-**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ- 01.** සහස්‍රා නැණපහන අධ්‍යාපන සේවයට සහයෝගය ලබා ගැනීම සඳහා. (සහස්‍රා යෞවන සමාජයේ සභාපතිතුමා හා සහස්‍රා බෞද්ධ සංසදයේ සභාපතිතුමා)

ඒක ගැන සභා යෝජනා යන කොට සාකච්ඡා කරමු.

( ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා , ගරු මන්ත්‍රී යූ.එල්. තුසිත චාමින්ද මැතිතුමා සභාවට සහභාගි වීම සිදුවිය. )

**02.** අප ජලවාහිනි පද්ධතිය නැවත සකස් කර ගැනීම සඳහා අනුමැතිය ලබා ගැනීම. (ශෂිනිකා අරුණෝදි ධර්මසිරි මිය, ගල්කැටිය ගොඩකන්ද, වී.සී. පාර, කලේගාන, ගාල්ල.)

මේ පිළිබඳ තාක්ෂණ නිලධාරී පරීක්ෂා කරලා වාර්තාවක් ලබා ගෙන අවශ්‍ය ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට මම යෝජනා කරනවා.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**03.** ප්‍රජා ශාලා ගොඩනැගිල්ලක් ඉදිකිරීමට සභාවට අයත් බිම් කොටසේ ඉඩ පහසුකම් සලසා ගැනීම සඳහා. (කලේගාන ප්‍රදේශයේ ගම්වාසීන්)

මේ ලිපිය සම්බන්ධව සභාව දැනුවත් කරන්න ඕන. මේක ගැන මම සඳහන් කරන්නම්. ඔය සඳහන් කරේ මෙතන එහා පැත්තේ ඉඩම පිළිබඳව. ඇත්තටම එතන පර්චස් 7.2 ක් තියෙන ඉඩමක්. ඕක අපිත් කලින් ඉල්ලුවහම අපේ මුදල් යොදවන්න එපැයි කියන මට්ටමේ තමයි තිබුණේ. ඒ නිසා තමයි අපි ඒක පැත්තකට තිබ්බේ. නමුත් වර්තමානයේ "සපිරි ගමක්" වැඩසටහන යටතේ ග්‍රාම සේවක කොට්ඨාශයකට ලක්ෂ 20 ක මුදලක් වෙන් වෙනවා. එතකොට මෙතන මේ ඉඩම කලේගාන දකුණ වසමට අයිතියි. නමුත් මෙතනින් එහා ඔක්කොම කලේගාන උතුරට අයිතියි. මේ වසම් දෙකටම පොදු ස්ථානයක් නෑ කිසිම රැස්වීමක් තියන්නවත්, නිලධාරියෙකුට ඉන්නවත්. ඊයේ පැවති රැස්වීමේදී සියලු නිලධාරීන්, සියලු සංගමයන්, සංවිධාන එකමුතුව තීන්දු කරා ඒ ලැබෙන ලක්ෂ 20 ප්‍රතිපාදන වලින් වසම් දෙකේම ප්‍රතිපාදන එකට යොදවලා ලක්ෂ 40 ක් ලබා දෙන්න එකඟ වුණා. මෙතන ඒ ගොඩනැගිල්ල ලක්ෂ 40 කින් ඉදිකරන්න ඒ දෙගොල්ලොම එකඟ වුණා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් ලිඛිත උපදෙස් ලබා ගන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අපි අයිතිය දෙන්නේ නෑ. අපේ අයිතිය යටතේ ඉදිකරන්නේ ඒ අයගේ ප්‍රතිපාදන වලින්. දැන් එහෙම කරපු ගොඩක් තියෙනවානේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** නැහැ සභාපතිතුමා. එහෙම කිසි ප්‍රශ්නයක් නෑ. එහෙම දෙන්න පුළුවන්ද කියලා උපදෙස් අරගන්න. අවසරය ලිඛිතව ගන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අපි විධිමත් සභා තීන්දුවක් ලබන සභාවේදී අරගමු.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** එහෙම නෙමෙයි සභාපතිතුමා ඒ වැඩේ කරන්න නම් තීරණයක් ගන්න. අපේ විරෝධතාවයක් නෑ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා පළාත් පාලනයෙන් ලිඛිත උපදෙස් ගන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අපි ලිඛිතව යෝජනාව හදලා ඉදිරිපත් කරන්නම්.

ප්‍රජා ශාලා ගොඩනැගිල්ලක් ඉදිකිරීමට සභාවට අයත් කලේගාන වී. සී. පාරේ ඇති බිම් කොටසේ ඉඩ පහසුකම් සැලසීම සම්බන්ධව පළාත් පාලන දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගෙන අවශ්‍ය ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට මම යෝජනා කරනවා.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මට පෙනී යනවා මාධ්‍යවේදී මහත්වරු වතුරවල ඡායාරූප ගන්නවා. වීඩියෝ කරනවා. වතුරවල පැහැයේ වෙනසක් බව මට පේනවා. මේ වතුර මමත් පානය කරා ඇවිල්ලා. මේක අපේ වැරැද්දක් නෙමෙයි. හැම කුණු ගොඩක්ම බේරුවල බොක්කෙන් වගේ බහින්නේ බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාවෙන්. මේ ජල සම්පාදන මණ්ඩලයෙන් ගන්න වතුර. අපි වතුර ලබා ගන්නේ ළිං වලින් නෙමෙයි. මේ ජල සම්පාදන මණ්ඩලයෙන් ජලය ටැංකියට ගන්නේ. ටැංකිය බලන්න පුළුවන් ඕනනම්. සීල් ටැංකියක් තියෙන්නේ.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** වතුර ගැන කතා කරපු නිසා මේ ප්‍රශ්නය කතා කරන්නේ. ජස්ටින් කන්ද ප්‍රදේශයට දැන් දින තුනක ඉඳලා වතුර නෑ. මිනිස්සුන්ට බොන්නවත් වතුර ටිකක් නැති නිසා මම යෝජනාවක් හැටියට මේ වෙලාවේ කරනවා සභාවේ වතුර බවුසරය යොදා ගන්න. ජල සම්පාදන මණ්ඩලයෙන් වතුර ලබා දෙන්නම් කිවුවා ඒ ප්‍රදේශයට වතුර බෙදාදීමේ වැඩපිළිවෙලක් හදන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක කරන්න පුළුවන්. ගිංතොටත් නෑ.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** පහුගිය සෙනසුරාදා මළගෙයක් වුණා ගිංතොට. ඒ මරණේ හෝදන්නවත් වතුර නෑ. අන්තිමට නගර සභාවෙන් වතුර බවුසරයක් ගෙන්න ගත්තේ. මරණේ හෝදන්නවත් වතුර ටිකක් නෑ. ඒ වගේ තත්ත්වයක් තියෙන්නේ.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** එහෙට දවස් තුනක ඉඳන් වතුර නැහැ. බොන්නවත් වතුර නෑ. වතුර බවුසරයක් අරන් බෙදාගෙන යන්න කියන්න හවස් වෙනකන් ඉන්නේ නැතුව. සභාවේ දෙන්නෙක් යැව්වා නම් හරි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** දැන් කොහොමවත් වතුර බවුසරයක් යවන්න වෙන්නේ දෙකෙන් පස්සේ. කුණු එකතු කරන්න ට්‍රැක්ටර් ගියානේ.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, මේ ජල ප්‍රශ්නය අද ඊයේ තියෙන එකක් නෙමෙයි. අපි කවුරුත් දන්නවානේ. මේ ප්‍රශ්නයට පැහැදිලිවම මම කියන්න කැමතියි කරුණාකරලා මේ බෝපෙ පෝද්දල තියෙන ජලය පිටතට යවන්න එපා. මේක නවත්වන්න. ටැංකි තුනක් තියෙන්නේ බෝපෙ පෝද්දල. මේ බෝපෙ පෝද්දල ටැංකි තුනක් තියාගෙන මේ වතුර ටික අහංගමට, වැලිගමට යනවා. අවුරුදු හතරක් තිස්සේ මේ වෙන සිද්ධියක්. මෙහෙම වුණාම අද අපි දුක් විඳිනවා. ගිය පළාත් පාලන මැතිවරණයේදී අපි ගෙයින් ගෙට යනකොට අපිට කිවුවේ වතුර නෑ කියලා. අපි පොරොන්දු වුණා ඒ මිනිස්සුන්ට වතුර ටික අරන් දෙනවා කියලා. මේක වහාම නවත්වන්න ඕන. අපි කොච්චර කිවුවත් මේ කාරණය ඉෂ්ඨ කරන්නේ නෑ. අද අපිට මළ ගෙදරකට යන්න බෑ, මඟුල් ගෙදරකට යන්න බෑ. වහාම කරුණාකරලා බෝපෙ පෝද්දල තියෙන වතුර ටික බෝපෙ පෝද්දල ජනතාවට දෙන්න. ඊට එහාට දෙන්න යන්න එපා. කෙලින්ම කියන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අපි කණ්ඩායමක් විදියට ගිහින් ඕක කිවුවානේ. වක්වැල්ලට ඕක ඉදිරිපත් කරානේ.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** හොඳම විස ඳුම තමයි සුගත් මන්ත්‍රීතුමා අපි කියලා තියෙනවා, ඒ දවස්වල අපි කියලා තියෙනවා අපිට තියෙන්නේ ගිහිල්ලා වක්වැල්ල වට කරන්න කියලා. අපේ බෝපෙ පෝද්දල බල ප්‍රදේශයේ තියෙන ගඟෙන් ජලය බෙදා හරිනවා. ගාල්ල නගර සභා බල ප්‍රදේශයේ පැය 24 ම වතුර තියෙනවා. ඉල්ලන හැමෝටම අලුතෙන් වතුර දෙනවා. ඉල්ලන පරක්කුවෙන් වතුරත් දෙනවා. අපේ බලප්‍රදේශයට වතුරත් නෑ.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** මෙතුමා දන්නවා සම්පූර්ණ සිද්ධිය. අපේ විජේසිංහ මන්ත්‍රීතුමා ඒකේ වැඩ කරේ.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** අපි කට්ටිය ගිහින් ඒක වටකරමු. එතකොට ඉහලින් ඒවි.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** අපි ඒකට එකඟයි පැහැදිලිවම.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** මම කිවුවේ දැනට නැති එක.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** සභාවක් විදියට අපිට එහෙම බලපෑමක් කරන්න බැරිනම් අපි මේ සභාවේ ඉන්න එක තේරුමක් නෑ. සභාවක් විදියට බෝපෙ පෝද්දල ජනතාවට ඒ සේවය කරන්න බැරිනම් අපි මේ සභාවේ ඉන්න එක තේරුමක් නෑ පැහැදිලිවම.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, මම හිතන්නේ මාධ්‍යවේදීන් සඳහා මේ සභාවෙන් ලිඛිත දැනුම් දීමක් කරනවා කියලා පහුගිය සභා වාර වලදී දැනුම් දුන්නා. නමුත් අද වෙනතුරු ඒ අයට ලිඛිත දැනුම් දීමක් කරේ නෑ කියනවා. ඒ සඳහා සභාවේ තීරණය මොකක්ද කියලා දැන ගන්න කැමතියි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** හතර දෙනෙක් ඉන්නවා. මම දන්නේ නෑ දැනුවත් කිරීමක් නොකර ආවද කියලා.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** මාධ්‍යවේදීන් කියනවා ඒ අයට ලිඛිත දැනුම් දීමක් කරේ නෑ කියලා. අපි දිගටම ඒ ගැන පැහැදිලි කිරීමක් කරා. ඇත්තටම බෝපෙ පෝද්දල සභාව ගැන අපි ලැජ්ජ වෙන්න ඕන ඒ කාරණය සම්බන්ධව.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** දුරකථන ඇමතුම් වලින් පණිවිඩය ලැබිලා තියෙනවා.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** ඒ වුණාට මම යෝජනා කරේ ලිඛිතව යවන්න කියලා. දුරකථන ඇමතුම මතක හිටින්නේ නෑ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒ අයගේ ලිපිනයන් අරගෙන ලිඛිතව යවන්න. ඒක ටෙල්සි භාර ගන්න. දැන් මෙතන ඉන්නේ හතර දෙනයිනේ. නම් අරගන්න අනෙක් අයගෙත්. ලිඛිතව දැනුම් දෙන්න. දැනුම් දීලා කියනවා ආවේ. දුරකථන ඇමතුමක් හරි දීලා දැනුම් දුන්නා. අඩුපාඩුවම කියන්න එපා. දැනුම් දීමක් කරලා තියෙනවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** අපිට ලිඛිතව දැනුම් දුන්නහම අපි එදාට වෙන වැඩක් දා ගන්නේ නැනේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ලිපිනය ඉල්ලගෙන ලියුමක් දාන්න.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** සභාපතිතුමනි, මේ වතුර බොන්නේ නෑ කවුරුවත්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** වතුර බෝතල් ගේන්න යැවුවා.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** ජල සම්පාදන මණ්ඩලයේ ඇති නොසැලකිල්ල හින්දා තමයි මේ තත්ත්වයට පත් වෙලා තියෙන්නේ. අපි වතුර එකක්වත් ඒ අයගෙන් අරගෙන නෑ. අද වෙනකම් මම ගිහිල්ලා මගේ එක්කෙනෙක්ට වතුර දෙන්න කියලා නෑ. ඒ නිසා මම බය නැතුව කතා කරනවා. ඒ අයට ඕන අයට ඒ ඒ ආකාරයෙන් සිද්ධ කරලා ජල සම්පාදන මණ්ඩලය මේ බෝපෙ

පෝද්දල විනාශයක් බවට පත් කරලා තියෙනවා. එම නිසා මේ බෝපෙ පෝද්දල ජනතාවට ඉතා විශාල අසාධාරණයක් සිදු වෙනවා කියන එක මේ අවස්ථාවේ මම සඳහන් කරන්න කැමතියි.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** මේ වතුර පරිභෝජනයට නුසුදුසු මට්ටමක තියෙයි කියලා උපකල්පනයක් තියෙනවා නම් කරුණාකරලා මේ මාධ්‍යවේදී මහත්වරු මේක මාධ්‍ය මගින් ප්‍රචාරණය කරන්න කටයුතු කරන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔය ජලය පානය කරන්න එපා. අපි ජල බෝතල් ගේන්න යැවුවා.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා, මේකට එකපාරටම ජල සම්පාදන මණ්ඩලයට චෝදනාව නගන්න එපා. ටැංකිවල දීර්ඝකාලීනව වතුර අපි පාවිච්චි කරලා වතුර අඩු වෙච්ච වෙලාවක ජල සම්පාදන මණ්ඩලයෙන් වතුර එනකොට අර සියලු මඩ ටික ටැංකියේ කැලතෙනවා. එහෙම සිද්ධියක්ද දන්නේ නෑ. ටැප් එකෙන් එන වතුර වෙනම වීදුරුවකට අරගෙන බලන්න. පාරේ ලයින් එකකින් ගන්න පුළුවන්නම් හරි. එහෙම ප්‍රශ්න වෙනවා. අපේ ගෙවල්වලත් එහෙම සිද්ධි අනන්තවත් වෙනවා. ඒක නිසා අපේ සභාව හැල්ලුවට ලක් වෙනවා ජල සම්පාදන මණ්ඩලයට ඒ පැත්ත නොබලා චෝදනා කිරීම නිසා. ඒ ටැංකි දීර්ඝකාලීනව පාවිච්චි කිරීමේදී ටැංකිවල මඩ තැන්පත් වෙනවා. ඒක අපි හැමෝම දන්නවා. ටැංකියේ වතුර ඉවර වෙලා වතුර ආයෙම එනකොට වතුර වැටිලා ටැංකියේ සියලු මඩ ටික කැලතෙනවා. එහෙම සිද්ධියක්ද දන්නේ නෑ. ඒක නිසා ඒ ගැන පොඩ්ඩක් හොයා බලලා ඔය සම්බන්ධව කටයුතු කරන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒ ටැංකිය සම්බන්ධව ගුණසේකර මහත්තයා පරීක්ෂාවක් කරන්න.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** වක්වැල්ලේ වතුර නැහැයි කියලා බීක්කෙන් වතුර ගන්න විදියට ලේස්ති කරන්න කිවුවා. එතකොට වතුර නොමිලේ ලබා දෙන්නම් කිවුවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කලින් යෝජනාව වෙනත් පැත්තකට ගියා. සභාව සතු ඉඩම් වල වර්තමානයේ යෝජනා අනුව ක්‍රියාත්මක වන ව්‍යාපෘති සඳහා, ප්‍රජා ශාලා සඳහා කොයි කොට්ඨාශයක වුණත් ඉදිකරන්න තීන්දු කරනවා පළාත් පාලන කොමසාරිස්ගේ අනුමැතියට යටත්ව.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** ඉක්මනට ගන්න ඕන.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** එහෙම අනුමැතියක් දෙන්න පුළුවන්ද?.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එහෙම බැරි වෙන එකක් නෑ. සභා තීන්දුවක් යැව්වහම බැරි වෙන එකක් නෑ.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, හදිසි අමතර කරුණක් ඉදිරිපත් කරන්න තියෙනවා. සියලු මන්ත්‍රීවරුන්ගෙන් හා මන්ත්‍රීවරියන්ගෙන් අවසරයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අමතර කාරණාවකට ඉඩක් නෑ. වුට්ටක් ඉන්න. න්‍යාය පත්‍රය ගිහිල්ලා ඉඩ දෙන්නම්.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** න්‍යාය පත්‍රයට අනුව තමයි ලිපි සාකච්ඡාව.

**04.** නරාවල සිට්ට්‍රස් වතුයාය ආශ්‍රිතව කටුපොල් වගා කිරීම සම්බන්ධව (ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා)

නරාවල සිට්ට්‍රස් වතුයායේ නැවතත් කටු පොල් වගාව සීඝ්‍රයෙන් සිදු වෙමින් පවතිනවා. මේක මම හිතන්නේ දිස්ත්‍රික් සම්බන්ධීකරණ මට්ටමින් ගාල්ල දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේදී තීන්දුවක් ගත්තා. අමාත්‍යාංශ මට්ටමිනුත් තීන්දුවක් ගත්තා. මම හිතන්නේ නීතියක් හැටියට ක්‍රියාත්මක නොවුණත් පොදු තීන්දුවක් ගත්තා මේ සම්බන්ධව ක්‍රියාත්මක කරනකම් කටුපොල් වගාව නතර කිරීම සඳහා මේ ප්‍රදේශයේ. නමුත් දැන් වතු පාලන අධිකාරිය විසින් දිගින් දිගටම ඒ ප්‍රදේශවල වතුවල කටුපොල් වගාව සිදු කරමින් පවතිනවා හොර රහසේ. ප්‍රශ්නය තියෙන්නේ කටු පොල් වගාව ඉතා අහිතකර තත්ත්වයක් තමයි තියෙන්නේ භූමියට, වැඩ කරන ජනතාවට. හේතුව කටුපොල් වලින්

විශාල වශයෙන් ජල පද්ධතියට හානි සිදු වෙනවා කියලා සාධක තියෙනවා. ඒ වගේමයි ගරු සභාපතිතුමනි වතුවල වැඩ කරන කම්කරු ජනතාවගේ රැකියා සම්බන්ධව බරපතල ගැටළුවක් පැන නගිනවා මේකෙන්. මොකද මේකට යන ශ්‍රමදායකත්වය අඩුයි. ඒ නිසාම රැකියාවල ප්‍රශ්නයක් ඇති වෙනවා. ඒ නිසා අපි කියන්නේ දැනට තියෙන ප්‍රමාණයට අමතරව නැවත හා නව වගාකිරීම් සම්බන්ධයෙන් අපි අමාත්‍යාංශ මට්ටමින් තීන්දුවක් අර ගන්නා තෙක් මේක හොර රහසේ වගා කරන එක තහනම් කරන්න. මොකද ජනතාවගේ ලොකු විරෝධතාවයක් තියෙනවා මේකට.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** චනක මන්ත්‍රීතුමා ඊයේ සිදු වුණේ මොකක්ද?.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** සාකච්ඡාව තිබුණේ මෙහෙමයි සභාපතිතුමනි, මේක පාර්ලිමේන්තුවේ හෝ අමාත්‍යාංශ මට්ටමින් නීතියක් බවට පත් කරලා නෑ. හැබැයි දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු මට්ටමින් යෝජනා කරලා තියෙනවා. ගාල්ල විතරක් නෙමෙයි කලුතර වගේ වගා කරන හැම දිස්ත්‍රික්කයකම වගේ මේ තීරණය ගත්තා. මේකේ බලපෑම් කිහිපයක් තියෙනවා. පාරිසරික බලපෑම් වගේම සමාජ ජීවිතයටත් බලපෑමක් තියෙනවා. ඉතාම අඩු ශ්‍රමයක් යොදවන්නේ. රැකියා සම්බන්ධයෙන් අර්බුදයක් තියෙනවා. ජීවත් වීම සඳහා අර්බුදයක් පැන නැගිලා තියෙනවා ජනතාවට. ඒ නිසා තීන්දුවක් අරගෙන ක්‍රියාත්මක වෙලා තියෙද්දි මේ මොහොතේ අධිකරණ තීන්දුවක් දීලා තියෙනවා නීත්‍යානුකූල නොවේ, බලයක් නෑ කියලා. ඒ මතයේ සිට ඒක පාවිච්චි කරමින් හොර රහසේ ජනතාවගේ විරෝධය නොතකා වතු සමාගම් ක්‍රියාත්මක වෙනවා. ඒ අයට මේක අධික ලාභ ලබන ව්‍යාපෘතියක්. ඒක වෙන්න පුළුවන්. අපි, රටේ කෘෂිකාර්මික දෙයක් ක්‍රියාත්මක කරන්න ඕන ජනතාවගේ වුවමනාවන් සලකාගෙන, ජනතාවගේ ජීවිත සම්බන්ධව තක්සේරුවක් කරලා. ඒ නිසා මම යෝජනා කරනවා වහාම මේකට ක්‍රියාත්මක වෙන්න. මේ මොහොතේ මේක පහසු වේවි. මොකද වැවිලි කර්මාන්ත අමාත්‍යවරයා වන්නේ අපේ අක්මීමන ආසනය නියෝජනය කරන රමේෂ් පතිරණ මැතිතුමා. එතුමා සමග මේක සෘජුවම සාකච්ඡා කරන්නත් පුළුවන් අපිට සභාවක් හැටියට යෝජනා කරලා. ඊට අමතරව එතුමාට ඉක්මනින් මේක දැනුම් දීලා මේකට ක්‍රියාත්මක වෙන්න කියන්න ප්‍රදේශයේ ජනතාව ගැන හිතලා. වගාව ගැන හිතලා. රටේ පරිසරය ගැන හිතලා. මේකට වහාම ක්‍රියාත්මක වෙන්න යෝජනා කරන්න කියන ඉල්ලීම කරනවා. මේ ලිපිය මම ඔබතුමාට යොමු කරනවා.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, ඊයේ වන විටත් පැළ ඉන්දනවා කියලා පැමිණිලි ආවා. මගේ කොට්ඨාශයේ නිසා එහිදි මම පොලීසියට දැනුම් දීලා ඒක නැවැත්වීමට කටයුතු කරත්, අපේ ආසනයේ සංවිධායක වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාට දැනුම් දුන්නට පස්සේ එතුමා කිවුවේ සාකච්ඡාවක් කරලා තියෙනවා ඒ සාකච්ඡාව තුළ දැනට ගෙනාපු පැළ ටික ඉන්දන්නේ කියලා. තහනම් කරලා තිබුණත් උසාවි නියෝගයක් අරගෙන තියෙනවා දැනට ගෙනාපු පැළ ටික ඉන්දන්න. ඒ උසාවි නියෝගය තුළ කිසිම කටයුත්තක් කරන්න විදියක් නෑ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඒ ගෙනාපු පැළ කොච්චරද, ඒ නිර්ණායක මුකුත් නෑ.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** ඒ නිර්ණායක, නීතිමය කටයුතු ඒ අය බලයි.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** හිටවන එක නතර කර ගන්නයි වුවමනාව තියෙන්නේ. ඒක නතර වෙන්නේ නැනේ.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** ඉස්සරහටත් පැළ ගේන්න පුලුවන්.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** පැහැදිලිව අහගන්න. ගෙන්වපු පැළ ටික තමයි ඉන්දන්නේ. අපිවත්, ආණ්ඩුවවත් දීපු නියෝගයක්වත් නෙමෙයි. උසාවියෙන් ඒ අය ගනිපු තීන්දුවක් තමයි මේක. ඒකෙන් බලරහිත කරලා තියෙනවා තහනම.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මන්ත්‍රීතුමා අපි ඒ යෝජනාව වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාටයි, දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවටයි යොමු කරමු.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඉක්මනින් ඒකට ක්‍රියාමාර්ගයක් ගන්න.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** දැනට පැළ ඉන්දලා ඉවරයි ඉතිං. පහුගිය දවස් වෙන කොට පැළ ඉන්දලා ඉවරයි. උසාවි නියෝගය නිසා තහනම් කරන්න බෑ කියලා කියන්නේ. ලංකාවට ගෙන්වපු පැළ ටික ඉන්දන්න අයිතිය දීලා තියෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** නරාවල සිට්ට්‍රස් වතුයාය ආශ්‍රිතව කටුපොල් වගා කිරීම සම්බන්ධව ගරු වැවිලි කර්මාන්ත හා සුළු අපනයන භෝග සංවර්ධන අමාත්‍යතුමා වෙත හා දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව වෙත යොමු කොට අවශ්‍ය ඉදිරි ක්‍රියාමාර්ග ගන්නා ලෙස දැනුවත් කිරීමට මම යෝජනා කරනවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**(ඇ) යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න** ඃ- නැත

**(ඉ) යථා පරිදි කල් දී ඇති යෝජනා**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමාගේ යෝජනා**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ- 01.** 2020 වර්ෂය සඳහා කාරක සභා පත්කිරීමට යෝජනා කරමි.

I. මුදල් හා ප්‍රතිපත්ති සැකසුම් කමිටුව

II. තාක්ෂණික සේවා කමිටුව

III. නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටුව

IV. පරිසරය සහ පහසුකම් කමිටුව

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කමිටු සඳහා ගියවරත් නව දෙනෙක් පත් කර ගත්තා. එක්සත් ජාතික පක්ෂය ගියසැරෙත් වැලකී සිටියා පත්කිරීම් සම්බන්ධව. මම ගිය සැරේ පත්කරපු සාමාජිකයෝ සමග වෙනස්කම් කරලා මේ විදියට යෝජනා කරනවා.

I. මුදල් හා ප්‍රතිපත්ති සැකසුම් කමිටුව

01. ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා
02. ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා
03. ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා
04. ගරු මන්ත්‍රීනි එම්. ගයාත්‍රි කාංචනා මැතිණිය
05. ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා
06. ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා
07. ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා
08. ගරු මන්ත්‍රීනි ජී. ටෙක්ලා ශ්‍යාමලී මැතිණිය
09. ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා

ගිය සැරේ ඉඳපු අයගෙන් අනිල් මන්ත්‍රීතුමයි, විශ්වජිත් මන්ත්‍රීතුමයි අයින් කරා දෙන්නා දෙන්නා ඉඳපු අයගෙන්. එක්සත් ජාතික පක්ෂයෙන් හුසේන් කියාස් මන්ත්‍රීතුමයි, ටෙක්ලා ශ්‍යාමලී මන්ත්‍රීතුමියයි මුදල් හා ප්‍රතිපත්ති සැකසුම් කමිටුව වෙනුවෙන් යෝජනා කරා.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** මුදල් කමිටුවට අබේසේකර මන්ත්‍රීතුමාව දාලා මාව තාක්ෂණික සේවා කමිටුවට දාන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කමක් නැහැ ඒක වෙනස් කරන්නම්.

I. මුදල් හා ප්‍රතිපත්ති සැකසුම් කමිටුව

01. ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා
02. ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා
03. ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා

04. ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා
05. ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා
06. ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා
07. ගරු මන්ත්‍රීනි එම්. ගයාත්‍රි කාංචනා මැතිණිය
08. ගරු මන්ත්‍රීනි ජී. ටෙක්ලා ශ්‍යාමලී මැතිණිය
09. ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා

II. තාක්ෂණික සේවා කමිටුව

01. ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා
02. ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා
03. ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා
04. ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා
05. ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා
06. ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා
07. ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා
08. ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා
09. ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා

III. නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටුව

01. ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා
02. ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා
03. ගරු මන්ත්‍රීනි ඩී.ජී. වාසනා උදයංගනී මැතිණිය
04. ගරු මන්ත්‍රී යූ.එල්. තුසිත චාමින්ද මැතිතුමා
05. ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා
06. ගරු මන්ත්‍රී කේ.යූ.ජී. යසරත්න මැතිතුමා
07. ගරු මන්ත්‍රීනි ඒ.ආර්.එස්. සංජීවනී අතුකෝරල මැතිණිය
08. ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා
09. ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා

IV. පරිසරය සහ පහසුකම් කමිටුව

01. ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා
02. ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා
03. ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා
04. ගරු මන්ත්‍රී යූ.එල්. තුසිත චාමින්ද මැතිතුමා
05. ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා
06. ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා
07. ගරු මන්ත්‍රීනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය
08. ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා
09. ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා

ඒ නම් යොදලා එම යෝජනාව සංශෝධනය කරනවා.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** එම සංශෝධනය මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** උපසභාපතිතුමා නැද්ද?

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** උප සභාපතිතුමා ප්‍රධාන දෙකට ඉන්නවා. ගිය සැරේ හිටියෙත් නැහැ. මුදල් හා ප්‍රතිපත්ති සැකසුම් කමිටුවටයි, තාක්ෂණික සේවා කමිටුවටයි ඉන්නවා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා සුභසාධන හා පුස්තකාල සේවා නැද්ද?

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටුවට ඒක අයිති වෙන්නේ.

එක් කාරක සභාවක් සඳහා සාමාජිකයන් නමයක් වන ලෙස ඉහත පරිදි කාරක සභා පත්කිරීමේ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**02.** 2020 වර්ෂය සඳහා රු. 200,000.00 ට අඩු වියදම්වලට බැඳීමට අවසර දීමේ බලතල ගරු සභාපතිතුමාට පැවරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, අපි ඒ යෝජනාවට එකඟ නෑ. සභාවට දාලා සභාවේ අනුමැතිය අරගෙන කරන්න ඕන. නැත්නම් ලක්ෂ දෙකක් කියන කොට ලොකු මුදලක්. අපේ විරෝධතාවයක් නෑ සේවක පඩි වගේ දේවල් ගැන. ඒවා අපිට ප්‍රශ්නයක් නෑ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මේ අවසර ඉල්ලන්නේ ගෙවීමට නෙමෙයි. අපි හිතමු වීදි පහන් වලට මිල ගණන් කැඳවන්න වෙනවා හදිසියේ. ඒකට අවසර දීමේ බලය මේ. නැතුව ගෙවීමට බලයක් නෙමෙයි මේ ඉල්ලන්නේ.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** ගෙවීම් සඳහා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ගෙවීම් සභාවට දාන්න ඕන කොහොමත්. මෙහෙම ගැටළුවකුත් තියෙනවා. අපි හිතමු දැන් වාහන වල අළුත්වැඩියාවක් ආවා. දැන් අපි මිල ගණන් කැඳවලා ඉංජිනේරු වාර්තා ඔක්කොම අරගෙන තමයි අදාළ ආයතනයට ඇනවුම දෙන්නේ. ඊට පස්සේ ඒක අළුත්වැඩියා කරලා දෙනවා. ඊට පස්සේ අපිට මාසයක් ඉන්න වෙනවා සභාවට දාලා ඒක ගෙවන්න.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා විශේෂ සභාවක් කැඳවන්න එවේලේම.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එකින් එක ගෙවීමකට විශේෂ සභාවක් කැඳව කැඳවා ඉන්න බැනේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ගරු සභපතිතුමනි, උදාහරණයකට බැකෝ එකේ අළුත්වැඩියාවේ අනූ එක්දාහේ ගෙවීම පිළිබඳව අපේ විරෝධතාවයක් තියෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මුදල් කමිටුවට දාලනේ ඒක ගෙව්වේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මුදල් කමිටුවට දාලා නෙමෙයි ගෙවලා තියෙන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** නැත්නම් මොකක්ද? මුදල් කමිටුවට දාලා තමයි ගෙවලා තියෙන්නේ. කමිටුවට දාලා ගෙවලා තියෙන්නේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** කමිටුවට දාලා, කමිටු වාර්තාව සභාවට දාලා ඕන ගෙවන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කමිටුවට දාලා ගෙවලා තියෙන්නේ. මේ සියළු දේවල් කොහොමත් සභාවට දාලා සභා තීන්දුවක් ගන්නවා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** මුදල් කමිටුව නියෝජනය කරද්දි අපි බලන්නේ ගෙවීම් ක්‍රියාවලිය නිවැරදිද කියන එක. තාක්ෂණික කාරණා සම්බන්ධව අපිට අවබෝධයක් නැනේ. ඒ සම්බන්ධව අදාළ තාක්ෂණ නිලධාරීන් විසින් නිර්දේශ කොට අනුමත කරන ලද ඒවාට ගෙවීමේ ක්‍රමවේදය අනුව බලලා තමයි අපි අනුමැතිය ලබා දෙන්නේ මුදල් කමිටුවේදී. අබේසේකර මන්ත්‍රීතුමා කියපු තාක්ෂණික කාරණා සම්බන්ධයෙන් අපි බැඳී සිටින්නේ නෑ. ඒකට මුදල් කමිටුව තීරණය කරන්න ඕන මුදල් කමිටුවට පැවරිච්ච බලය පිළිබඳව.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මේක තේරුම් ගන්න ඕන. මෙතන කාරණා දෙකක් තියෙන්නේ. එහෙමනම් ඉතිං දෙවැනි යෝජනාව ඕන නැනේ. මේක බලන්නේ නැතුවද දන්නේ නෑ කෑ ගහන්නේ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** පළවෙනි කාරණාව තියෙන්නේ ලක්ෂ දෙකට අඩු ඒවා. දෙවැනි කාරණාවේ තියෙන්නේ ලක්ෂ දෙකට වැඩි ඒවා. ඔබතුමා උදාහරණයට ගත්තේ වාහන අළුත්වැඩියාව. සේවා හා මිලදී ගැනීම් සම්බන්ධව සභා අනුමැතිය ගන්න ඕන. වැටුප් හා වේතන සම්බන්ධයෙන් ප්‍රශ්නයක් නෑ. පුනරාවර්තන වියදම් වලදී, සේවා සම්බන්ධ වියදම් වලදී ඔය ප්‍රශ්නය පැන නගින්නේ නෑ. අනිවාර්යයෙන්ම ඒවා කරන්න ඕන. ප්‍රශ්න පැන නගින්නේ මිලදී ගැනීම් වලදී. එවැනි කටයුත්තක් සිදු කරන්න ගියොත් කොහොමද ඒක කරන්නේ. ඔබතුමා විසින් වියදම් වලට බැදීමට අවසර දෙනවා. ඒවාට මොකක් හරි සීමාවක් තියෙන්න ඕන. වියදම් සීමාව ගැන ප්‍රශ්නයක් නෑ. මේකේ වපසරිය කුමක්ද?. මිලදී ගැනීම්ද? සේවාද?.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම කාරක සභා අවස්ථාවක් යෝජනා කරනවා මේ ගැන සභාව දැනුවත් කරන්න.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

<u>කාරක සභා අවස්ථාව</u>

කාරක සභා අවස්ථාවේදී කළමනාකරණ සහකාර එච්. අයි. රමේශ් මයා විසින් පහත අදහස් දක්වන ලදී.

- වියදමක අවස්ථා හතර

කාරක සභා අවස්ථාවේදී ලේකම් එල්. එච්. අනිල් රංජන් මයා විසින් පහත අදහස් දක්වන ලදී.

- මුදල් රෙගුලාසි 135 අනුව බලතල පැවරීම සිදු කරන බව.
- සභාවට පැවරී ඇති බලතල පැවරීම මේ යටතේ සිදු කරන බව.
- මේ සියලු දේවල් ප්‍රසම්පාදන ක්‍රියාවලියට ඇතුළත් බව.
- මීට අමතරව ගරු මන්ත්‍රීවරුන්ට මේ සම්බන්ධව ඇති ප්‍රශ්න සාකච්ඡා කරන ලදී.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** කාරක සභා අවස්ථාව අවසන් කිරීමට මම යෝජනා කරනවා.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** මෙහෙම දෙයක් තියෙන්නේ මෙතනදී. දැන් කමිටු පත්කරලා තියෙනවානේ. අදාළ කමිටුවට යොමුකරවන්න ඕන. කමිටුවෙන් තමයි ඒක සම්මත වෙන්න ඕන. සම්මත වුණාට පස්සේ තමයි සභාපතිතුමාට වියදම් දරන්න බලතල හම්බ වෙන්නේ. ඊට පස්සේ ඒක සභාවට දාන්නත් ඕන. යම් කිසි විගණන විමසුමක් ආවම කමිටුවේ සාමාජිකයෝ තමයි අහුවෙන්නේ. සභාවට දැම්මම සභාවේ අය. ඒකට කමිටුවේදී විරුද්ධ වෙන්නත් පුළුවන්. සභාවේදී විරුද්ධ වෙන්නත් පුළුවන්. ඒක නිසා මේකේ සම්පූර්ණ වගකීම යන්නේ සභාපතිතුමාට මෙතනදී. වියදමක් දැරුවට පස්සේ ගෙවන්න කමිටුවට දාන්න ඕන. කමිටුවේදී ඕන නම් විරුද්ධ වෙන්නත් පුළුවන්. එතකොට ඔයගොල්ලෝ බේරිලා. ඊට පස්සේ සභාවට දාන්න ඕන. එතකොටත් විරුද්ධ වෙන්න පුළුවන්. එතකොට විගණනයට අහුවෙන්නේ නෑ.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා මේක ඇවිල්ලා මහජන සේවාව පැය විසිහතරම සපයන තැනක්. එතකොට මේ මහජන සේවය නිසි පරිදි ලැබුණොත් තමයි මන්ත්‍රීවරු විදියට ඇවිල්ලා හැමදේම අනුමත කරන්න හරි විරුද්ධ වෙන්න හරි අවස්ථාව ලැබෙන්නේ. එතකොට මේ වෙන් කරන මුදල් මහජන සේවයට අවශ්‍ය දේවල් වලට සපයන්න තමයි තීන්දු ගන්නේ. සාමාන්‍යයෙන් ආයතනයක කාර්යක්ෂමතාවය වැඩි කරලා මහජන සේවය ඉෂ්ඨ කරන්න ආයතනයක ප්‍රධානියාට සාමාන්‍යයෙන් අභිමතය තියෙනවා මුදල් වියදම් කිරීම සම්බන්ධව මුදල් රෙගුලාසි යටතේ. ඉතිං මම හිතනවා මේ සේවාව කළ යුතුයි කියලා. දැන් රුපියල් ලක්ෂයකින් කරන්න පුළුවන් දේ අඩුයි. ට්‍රැක්ටර් රථයක් සේවා කරන්න රුපියල් හැට දහසකට වැඩි මුදලක් යනවා කිව්වා. බැකෝ එකක ටයර් ගන්න බෑ ලක්ෂයකින්. ඒ නිසා මහජන සුභ සිද්ධිය උදෙසා කැපවෙන මන්ත්‍රීවරයෙක් විදියට මේ යෝජනාව ස්ථිර කරන්න මම යෝජනා කරනවා අනුමැතිය

දෙන්න කියලා. රුපියල් ලක්ෂ දෙකකට වියදමකට අනුමැතිය දුන්නට මුදල් කමිටුවට ඇවිත් තමයි ඒක නිර්දේශ වෙන්නේ. එක් ගැටළුවක් වෙන්නේ නෑ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

**03.** 2020 වර්ෂය සඳහා රු. 200,000.00 ට වැඩි වියදම්වලට බැඳීමට අවසර දීමේ බලතල මුදල් හා ප්‍රතිපත්ති සැකසුම් කමිටුවට පැවරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

**04.** 2020 වර්ෂය සඳහා සේවක මණ්ඩලයේ හා මන්ත්‍රී මණ්ඩලයේ වැටුප් හා දීමනා ගෙවීම් අනුමත කිරීමේ බලතල ගරු සභාපතිතුමාට පැවරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

**05.** 2020 වර්ෂය සඳහා රු. 200,000.00 ට අඩු අනෙකුත් ගෙවීම් අනුමත කිරීමේ බලතල ගරු සභාපතිතුමාට පැවරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

**06.** 2020 වර්ෂය සඳහා රු. 200,000.00 ට වැඩි අනෙකුත් ගෙවීම් අනුමත කිරීමේ බලතල මුදල් හා ප්‍රතිපත්ති සැකසුම් කමිටුවට පැවරීමට යෝජනා කරමි.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

**07.** 2020 වර්ෂය සඳහා ටෙන්ඩර් මණ්ඩල බලතල මුදල් හා ප්‍රතිපත්ති සැකසුම් කමිටුවට පැවරීමට යෝජනා කරමි.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

**08.** 2020 වර්ෂය සඳහා ගිණුම් අතර මුදල් මාරු කිරීමේ බලතල මුදල් හා ප්‍රතිපත්ති සැකසුම් කමිටුවට පැවරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

**09.** 2020 වර්ෂය සඳහා කර්මාන්ත ඇස්තමේන්තු අනුමත කිරීමේ බලතල තාක්ෂණික සේවා කමිටුවට පැවරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

**10.** 2020 වර්ෂය සඳහා නිවාස හා ප්‍රජා සංවර්ධන විෂයන් සම්බන්ධව සේවා අවශ්‍යතාවය මත තීන්දු තීරණ ගැනීමේ බලතල නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටුව වෙත පැවරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

**11.** පරිසරය සහ පහසුකම් විෂයයන් සම්බන්ධව සේවා අවශ්‍යතාවය මත තීන්දු හා තීරණ ගැනීමේ බලතල පරිසරය සහ පහසුකම් කමිටුව වෙත පැවරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** පරිසර කමිටුව මාසෙකට දවසක්වත් කැඳවන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මාස දෙකකට සැරයක්වත් කැඳවමු අඩුම තරමේ. ඒක කැඳවමු. නැත්නම් කමිටු වලට නිකං පත් කර ගන්න එකේ තේරුමක් නෑ.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**12.** කාරක සභා සතු බලතල විශේෂ වූ සේවා අවශ්‍යතාවයන් මත අදාළ කාරක සභාවේ ආවරණ අනුමැතියට යටත්ව ක්‍රියාත්මක කිරීමට ගරු සභාපතිතුමා වෙත බලතල පැවරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**13.** ලබුදූව වෙළඳ සංකීර්ණයේ කඩ කාමර සඳහා තක්සේරු දෙපාර්තමේන්තුව මඟින් ලබා දී ඇති 2018 වර්ෂයේ නව තක්සේරුව මත 2020 වර්ෂය සඳහා කඩ කාමර බදු මුදල් අයකිරීමටත්, 2018 හා 2019 වර්ෂවල හිඟ කඩ කාමර බදු මුදල් අයකිරීමටත් යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** නව තක්සේරුවේ වර්තමාන ගණන් දීලා තියෙනවා. වෙනස්කම ඕනනම් පෙන්වන්න පුළුවන්.

| කඩ කාමර අංක | කඩ කාමර 2013 වර්ෂයේ නව තක්සේරුව රු. | 2018 වර්ෂයට අදාළව නව තක්සේරුව | නව තක්සේරුවෙන් වැය වූ මුදල (එක් කඩ කාමරයකට) | 2018 හා 2019 වසර සඳහා අය කර ගත යුතු මුදල |
|---|---|---|---|---|
| 01 - 16 | 4500 | 6000 | 1500 | 576000 |
| 17 - 21 | 4500 | 5850 | 1350 | 162000 |
| 22 | 3750 | 4650 | 900 | 21600 |
| 23 - 24 | 6500 | 8350 | 1850 | 88800 |
| 25 - 45 | 3750 | 4650 | 900 | 237600 |
| 36 - 40 | 3250 | 4175 | 925 | 111000 |

ඒ හිඟ මුදල් 2018 ජනවාරි මස ඉඳන් අයකරන්න වෙනවා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, මේක පසුදාතම් කරලා අනුමත කරන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අවුරුදු පහෙන් පහට තමයි තක්සේරුව එන්නේ. 2013 තක්සේරුවෙන් තමයි මේ වෙනකම් අය කරේ. 2018 තක්සේරුව එන්නේ දැන්. ඒකයි ප්‍රශ්නය තියෙන්නේ. ඒ ගොල්ලෝ දන්නවා හැබැයි අවුරුදු පහෙන් පහට මිල ගණන් වැඩි වෙනවා කියලා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** මේ ලිපි යොමු කරලා තියෙන්නේ 2018 ඔක්තෝම්බර් මාසයෙයි, 2019 අගෝස්තු මාසයෙයි. ඒ ලිපි යොමු කරලා ඒක ගෙන්න ගන්න ඒ අය කාලසීමාවක් ගත්තා. 2018 සිට ක්‍රියාත්මක වෙනවා කියනවා. නමුත් අපි 2018 සිට මේ දක්වා ගිවිසුම් ගහලා කඩ හිමියන් එක්ක, ඒ කඩ හිමියෝ ඒ ගෙවීම් කරලා තියෙනවා. දැන් මේක නැවත පසුදාතම් කරලා අය කිරීමේ සාධාරණ හැකියාව පිළිබඳ අපිට ප්‍රශ්නයක් තියෙනවා. කලින් දැනුවත් කරලා නැනේ. අදාළ කාලසීමාවේ තක්සේරුව අනුව අයකරනවා කියලා නැනේ.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** පහුගිය කාලේ මේ කඩ කාමර පිළිබඳ සභාවේ ලොකු අර්බුද තිබුණා. ඊට පස්සේ තමයි පහුගිය සභාවල මේ සම්බන්ධව හුගක් සාකච්ඡා කරලා, විගණනයෙන් ඇවිත් පරීක්ෂා කරලා තක්සේරුව කරේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මටත් ගැටළුවක් මතු වෙනවා. මොකද මේ ගාණට එකඟ වෙලා ඉඳලා මේ කඩ කාමර ගන්න අය 2018 න් පස්සේ ගෙවලා ඇති. එතකොට ඒ අයට මතුවෙන ගැටළුව මොකක්ද මේකෙදි.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, මම මෙහෙම යෝජනා කරනවා මේකට. මේක විමසා බලන්න. තක්සේරුව 2018.01.01 දින සිට කරා වුණත් පහුගිය කාලේ ගිවිසුම අනුව අපි අය කරලා තියෙනවා. ඒ ගිවිසුමට එහා ගිහිල්ලා හිඟ මුදලක් අපිට අය කරන්න පුළුවන්ද?.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කාරක සභාවක් කරලා අපි ඔය ප්‍රශ්නය ගැන සාකච්ඡා වෙන්න ඕන. එක පාර කරාම අපිටත් ගැටළුවක් වෙනවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ගරු සභපතිතුමා මීට ඉස්සරත් මේ වගේ තිබුණ හිඟ මුදල් අය කරා. අවුරුදු පහකින් තක්සේරුව එන බව ඒ අය දන්නවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අබේසේකර මන්ත්‍රීතුමා අළුතෙන් ගිවිසුම්ගත වෙච්ච අයටයි ඔය ප්‍රශ්නය තියෙන්නේ. මේක පසුදාතම් තක්සේරුවක් නෙමෙයි මේ යන්නේ. අවුරුදු පහෙන් පහට තක්සේරුව කරනවා. 2013 දී තමයි අන්තිම තක්සේරුව කරලා තියෙන්නේ. දැන් 2018 තක්සේරුව ආවේ. ඒකේ ප්‍රමාදයක් වෙලා තියෙනවා. තක්සේරු කරලා එවීමේ ප්‍රමාදයක් තියෙනවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඒ අය දන්නවා මේක අවුරුදු පහෙන් පහට එන බව.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මමත් පුද්ගලිකව එකඟ නෑ 2018 ඉඳන් ගෙවන්න කියන එකට.

**ගරු මන්ත්‍රීනි එම්. ගයාත්‍රි කාංචනා මැතිණිය ඃ-** ගරු සභාපතිතුමනි, මමත් ඒ සම්බන්ධයෙන් කතා කරන්න ඕන. ඒ තක්සේරුව මම අනුමත කරනවා. අපිට ආදායමක් ලැබෙනවා. ඒක විය යුතුයි. වසර පහෙන් පහට ඒක අලුත් කිරීම නීතියට අනුව සාධාරණයි කියලා මම හිතනවා. හැබැයි මම කියනවා ඒක එයාලට දැනුම් දෙන්නේ නැතුව හිඟ මුදල් අය කිරීමේදී ලොකු ගැටළුවක් ඇති වෙන්න පුළුවන්. මම හිතන්නේ ඒක අපි කඩ හිමියන්ට දැනුම් දීලා කරොත් හොඳයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක මන්ත්‍රීතුමිය අපිට ආවේ ගිය සතියේනේ. මේක තක්සේරු දෙපාර්තමේන්තුවෙන් ආවේ ගිය සතියේ. අපි දැන් මේක ඒ අයට දැනුම් දෙනවා. අපිට මේ වෙලාවේ කරන්න පුළුවන් එකම දෙයයි දැන් තියෙන්නේ. හිඟ මුදල කොටස් වශයෙන් ගෙවන්න ඒ අයට සහනයක් දෙන්න ඕන.

**ගරු මන්ත්‍රීනි එම්. ගයාත්‍රි කාංචනා මැතිණිය ඃ-** ගරු සභාපතිතුමා, ඒ අය දන්නවාද අවුරුදු පහෙන් පහට වැඩි වෙන බව.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒ අය දන්නවා.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** ඒ අය ගෙවලා තියෙනවානේ. වැඩි වෙන මුදල විතරයි ඒ අයට ගෙවන්න සිද්ධ වෙන්නේ. අවුරුදු පහෙන් පහට කඩවල් තක්සේරු කරන බව ඒ අය දන්නවා.

**ගරු මන්ත්‍රීනි එම්. ගයාත්‍රි කාංචනා මැතිණිය ඃ-** අතරමගදී වැඩි වීමක් වුණොත් ගෙවන්න ඒ අය ගිවිසුම් අත්සන් කරලා තියෙනවාද?

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම කාරක සභා අවස්ථාවක් යෝජනා කරනවා.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

<u>කාරක සභා අවස්ථාව</u>

කාරක සභා අවස්ථාවේදී මිශ්‍ර ආදායම් ලිපිකරු එච්. එම්. සේපාලිකා මෙය විසින් පහත අදහස් දක්වන ලදී.

- අවුරුදු පහෙන් පහට තක්සේරුව මගින් කඩ කුලිය වැඩි කරන බව ගිවිසුමේ සඳහන්ව ඇති බව.
- අවුරුදු පහෙන් පහට අළුත්වෙන තක්සේරුව අනුව කඩ කුලී ගෙවීමට ගිවිසුම අනුව බැඳී ඇති බව.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කාරක සභා අවස්ථාව අවසන් කිරීමට මම යෝජනා කරනවා.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා මේ කඩ කාමර ගැන කතා කරපු වෙලාවේ මම කතා කරන්නේ. මස් කඩ වලින් දැන් සියලු අයකිරීම් කරනවාද මේ කාලය තුළ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මාස තුනක විතර එක්කෙනෙක්ගේ ගෙවන්න තියෙනවා.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** අපි ඒ පිළිබඳව පියවරක් ගමු.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එයා දිගින් දිගට මාස තුනක් විතර හිඟ තියාගෙන යනවා. පොලීසියේ පැමිණිලිත් දැම්මා. ඊට පස්සේ යන්තම් මාස දෙකක් ගෙව්වා. දැන් අපි අයකරාට නෛතික බලයකින් අපිට අයිති තැනකුත් නෙමෙයි මේ. අපි හරිනම් ඒවා හදලා දීලා තමයි ගන්න ඕන. එහෙම නැති තැනකින් ගන්නේ. ඇත්ත කතාව ඒක. අපි පොලීසිය ලව්වා තමයි අල්ලන්න ඕන. ඒ මස් කඩ හදලා දීලා තමයි අය කරන්න ඕන.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** අනෙකුත් ව්‍යාපාරික ස්ථානත් එහෙම විය යුතුයි එහෙමනම්. බෝපෙ පෝද්දල මස් කඩ තහනම් කරන්න යෝජනාවක් ගේනවා මම. ඒක නීත්‍යානුකූලව ගේන්නම් ලබන සභාවේදී. මෙහෙම ගේන්න බැනේ.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** වෙළඳ සංකීර්ණයේ යෝජනාවේදී ගරු සභාපතිතුමා මේ තක්සේරු මිල ගණන් වලට පෙට්ටි කඩ කාමරයක්වත් ගන්න බෑ. මම නම් කියන්නේ මේ තක්සේරු කරන ගණන් මිම් වැරදියි. නේවාසික කාමරයක් ඉල්ලුවත් රුපියල් 6000 ක් වත් ඉල්ලනවා. ඔය වගේ තැනක 6000 යි තියෙන්නේ. මේක යෝජනා කරනවා වැඩි වුණ එක හොඳයි. හැබැයි ඊළඟ අවුරුදු පහ එනකොට මීට කලින් මේ වාර්තා ගන්න කටයුතු කරන්න. එතකොට මේ හිඟ මුදල් ගන්න ප්‍රශ්න එන්නේ නෑ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** හැබැයි මෙහෙම දේකුත් තියෙනවා.

**ගරු මන්ත්‍රීනි එම්. ගයාත්‍රි කාංචනා මැතිණිය ඃ-** ගරු සභාපතිතුමා මටත් දෙයක් කියන්න තියෙනවා. දැන් ඔය කඩ කාමර කුලී වැඩි කරා වගේ සභාවෙනුත් අඩුපාඩුකම් ගොඩක් සිදු වෙලා තියෙනවා. ඒ නිසා මේ මිනිස්සු ගොඩක් අඩුපාඩුකම් මැද්දේ, සැහෙන්න අපහසුතා මැද්දේ තමයි ඔය කඩ කාමර ටික කරගෙන යන්නේ. මම හිතනවා මේ තක්සේරු වටිනාකම වැඩි කරා වගේම ඒ ටිකත් කරලා දෙන්න කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** දැන් ලයිට් ටික හැදුවා. දැන් කලර් වොෂ් කරන්න ඉන්නේ.

**ගරු මන්ත්‍රීනි එම්. ගයාත්‍රි කාංචනා මැතිණිය ඃ-** ගලවන් ඇවිල්ලා විතරයි තියෙන්නේ. කීපයක්ම හදලා නෑ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒ කියන්නේ

**ගරු මන්ත්‍රීනි එම්. ගයාත්‍රි කාංචනා මැතිණිය ඃ-** තිබුණ පරණ ලයිට් ටික ගලවලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** නෑ හදලා තියෙන්නේ.

**ගරු මන්ත්‍රීනි එම්. ගයාත්‍රි කාංචනා මැතිණිය ඃ-** නෑ මම පෙරේදත් ගියා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම කියන්නේ ප්ලෑෂ් ලයිට් ටික.

**ගරු මන්ත්‍රීනි එම්. ගයාත්‍රි කාංචනා මැතිණිය ඃ-** ගොඩක් අඩුපාඩු තව තියෙනවා. කඩ කුලී වැඩි කරන කොට ඒ ප්‍රශ්න ඒවී. ඒවාටත් විසඳුම් දෙන්න ඕන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඊයේ අපි සාකච්ඡා කරා. ජනවාරි මුල් සතියේ කලර්වොෂ් එක කරනවා. සම්පූර්ණයෙන්ම තීන්ත ආලේප කරනවා. ඔබතුමා මතුකරපු හින්දා කියනවා නෙමෙයි. ඊයෙත් කතා කරා. ජනවාරි මුල් සතියේ සම්පූර්ණයෙන්ම කලර්වොෂ් කරනවා. යෝජනා ගෙනල්ලා ස්ථිර කරලා තියෙන්නේ. ඉස්සරහ තියෙන අලංකාරයට හයි කරපු ලයිට් ටිකත් මේ සතියේම රෙපෙයාර් කරනවා. තවත් අඩු පාඩු මොනවාද දන්නේ නෑ තියෙන්නේ.

**ගරු මන්ත්‍රිනි එම්. ගයාත්‍රි කාංචනා මැතිණිය ඃ-** ගරු සභාපතිතුමා, පෙරේදා මට දැනුම් දුන්නා. අපේ කම්කරුවෙක් දැනට එතනට දාලා තියෙනවා. වැඩ කරන්නේ නෑ කියලා පෙරේදත් මට කතා කරලා කිව්වා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එයාවත් අයින් කරලා වෙන කෙනෙක් දානවා.

**ගරු මන්ත්‍රිනි එම්. ගයාත්‍රි කාංචනා මැතිණිය ඃ-** ඒක අපිට පැහැදිලිවම පේනවා. දවස් ගණකින් තමයි ඔන්න ඊයේ එතන අතු ගෑවේ. මම එතන හිටියා. තණකොළ වැවිලා පාරේ අඩි තුනක විතර ප්‍රමාණයකින්. ඒ වැඩ ටික සභාවක් විදියට කරන්න වේවි. නැත්නම් ලොකු ගැටළුවක් ඇති වේවි මේ තක්සේරුවේ වැඩි වීමත් එක්ක. ඒ ගැන හොයා බලන්න කියලා ඉල්ලා සිටිනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මන්ත්‍රීතුමිය ඔතනට දාපු හොඳ සේවකයා අයින් කිරීම තමයි ගැටළුව වුණේ.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** පහුගිය කාලේ ඔය වෙළඳ සංකීර්ණය පිළිබඳව ගැටළු බොහොමයක් මම සාකච්ඡා කරා ඒ වෙළඳසැල් හිමියන් සමඟ. එතකොටත් දිගින් දිගට කියපු අඩුපාඩුව තමයි නිසි පරිදි ශුද්ධ පවිත්‍ර කරන්නේ නෑ කියන එක. ඊළඟට වීදි පහන්වල තියෙන ගැටළු. ඒවා නිසියාකාරව සිද්ධ වෙන්නේ නෑ කිව්වා. ඒ කාරණා අපේ බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාව හැටියට අපේ පැත්තෙන් ඉටු විය යුතු දේවල් ඒ වෙළඳසැල් හිමියන්ට ලබා දෙන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම යෝජනා කරනවා මේකේ තියෙන සියලු අඩුපාඩුකම් ඉවර වුණාට පස්සේ තමයි මේ අයට මේක දැනුම් දෙන්න ඕන, දැනුවත් කිරීම කරන්න ඕන. නැත්නම් මේකේ ඇති වැඩක් නැති වෙනවා. නැත්නම් මේකේ බනින එක තමයි සිද්ධ වෙන්නේ. මේ තියෙන අඩුපාඩු ටික අපි සතියක් හරි දෙකක් හරි ඇතුළත ඉවර කරලා කඩ හිමියන් දැනුවත් කරන්න. මොකද ඒක අනිවාර්යයෙන්ම කරන්න තාක්ෂණ නිලධාරීන්ට සම්පූර්ණ බලය ලබා දෙනවා එතුමාගේ අධීක්ෂණය යටතේ. ඒක කරන්න. එක්කෝ ඒ වැඩේ පටන් අරගෙන හරි දැනුවත් කරන්න. නැත්නම් අපිට ලොකු චෝදනාවක් එනවා. මේක ඇරපු ගමන් වැඩක් වෙන්නේ නැතුව.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, ගරු මන්ත්‍රිවරුනි ඇත්තටම හොඳ කරුණක්, මාතෘකාවක් කතා කරේ. ලබුදූව හන්දිය රාත්‍රී කාලයට ඉතාම කළුවරයි. මන්ත්‍රීතුමිය කියපු කතාව ඇත්ත. ජනතාවට ගමන් බිමන් යන්න සුදුසු මට්ටමක නෑ. නාගරික ප්‍රදේශයක් ඒ හරිය. මම ගරු නගරාධිපතිතුමාගෙනුත් ඉල්ලීමක් කරා මීට පෙරත් නගර සභාවේ දාන වීදි පහන් කිහිපයක් ලබුදූව මංසන්දියේ නගර සභාවට අයිති කොටසේ සවිකරලා දෙන්න කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මේකේ තියෙනවා පනහක් මිලදී ගන්න යෝජනා කරලා.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** නගර සභාවේ නගරාධිපතිතුමාගෙන් මම ඉල්ලීමක් කරා. එතුමාගේ කොට්ඨාශයේ මාර්ගයෙන් එපිට වීදි ලාම්පු 10 ක් 15 ක් එතුමා සවි කරලා දෙන්නම් කිව්වා. සභාවක් හැටියට ඒ යෝජනාව කරලා නගරාධිපතිතුමාට යවන්න නගර සභා කොට්ඨාශයේ වීදි පහන් සවි කරන්න. ඒ නිසා නගර සභාවට ඉල්ලීම් කරලා යවමු. මන්ත්‍රීතුමිය කියපු කරුණු වලට අපි එකඟයි. ඇත්තටම රාත්‍රී කාලයේ ඒ හරියේ යන්න සුදුසු මට්ටමක නෑ. පුළුල් මාර්ග නිසා දැනට තියෙන වීථි පහන් වලින් ආලෝකය මදි. ඒ නිසා ඒ වීදි පහන් සවි කරන්න කියන යෝජනාව මම කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**14.** වීදි පහන් නඩත්තුව වෙනුවෙන් 2004, 2011, 2012 යන වර්ෂයන්ට අදාලව ලංකා විදුලි බල මණ්ඩලයෙන් අප ප්‍රාදේශීය සභාවට ලැබිය යුතු හිඟ මුදලවන රු.858,816.00 ක මුදල ප්‍රතිපූර්ණය කළ නොහැකි බවට ලංකා විදුලි බල මණ්ඩලය විසින් දන්වා ඇති බැවින් එම හිඟ මුදල් පොත්වලින් කපා හැරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මේ ලැබෙන ඒවා නෙමෙයි. ඉල්ලලා ගන්නේ. මෙතෙක් කාලයක් දුන්නේ නෑ. දැන් ගන්නවා දිගටම. මේ පරණ ඒවා වගයක් 2004, 2011, 2012 වර්ෂවල. ඒවාට ඒ අයට ගෙවන්න විදියක් නෑ කිව්වා. ඇත්තටම අපි හොයලා ගනිපු දෙයක් මේක. කලින් ගෙවලා තිබුණේ නෑ. අපි හයි කරන වීදි පහන් වලට විදුලිබල මණ්ඩලයෙන් අපිට ගෙවනවා යම් ප්‍රමාණයක්. ඒකට ලේකම්තුමාට ස්තුතිවන්ත වෙනවා. එතුමා ආවට පස්සේ තමයි ඒක හොයලා ලබා ගත්තේ. මේ වර්ෂ තුන සඳහා ගැටළුවක් තියෙනවා. ඒක පොත් වලින් කපා හරින්න ඕන.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** දැනට ගෙවනවාද?

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** දැන් ඒවා ඔක්කොම ගෙවනවා.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**15.** ප්‍රධාන කාර්යාලයේ හා උප කාර්යාලයේ සේවක මණ්ඩලයන් වෙනුවෙන් ස්ත්‍රී පුරුෂ ලෙස වෙන් වෙන් වශයෙන් භාවිතා කළ හැකි වැසිකිළි පද්ධති දෙකක් අලුතෙන් ඉදිකිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක සභා අරමුදලින් නෙමෙයි නාගරික සංවර්ධන අධිකාරියේ ගිණුමේ මුදල් වලින් මුදල් අරන් කරන්න තමයි යෝජනා කරලා තියෙන්නේ.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**16.** බල ප්‍රදේශයේ ප්‍රධාන මංසන්ධි වෙත යෙදීම සඳහා අධි වෝල්ටීයතාවයකින් යුතු එල්. ඊ. ඩී කොබ්රා වීදි පහන් 50ක් ඒ සඳහා අවශ්‍ය නැම් පයිප්ප කට්ටල සමඟ මිලදී ගැනීමට යෝජනා කරමි.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**(තේ පානය සඳහා සභාව කල් තබන ලදී.)**

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා දැන් ඔය බෝජුන්හල් ඉදිරිපිට ඉන්නවා යාචකයෝ සෑහෙන්න ප්‍රමාණයක්. ඒ අය මත්ද්‍රව්‍ය පාවිච්චි කරන්න තමයි එතනට මුදල් හොයන්න ඇවිල්ලා ඉන්නේ. ඒ අයට මොකක් හරි ක්‍රියාමාර්ගයක් ගන්න කියලා මම ඉල්ලා සිටිනවා. පාරිභෝගිකයන්ටත් කරදරයි. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව ඉස්සරහ ඉන්න ගොඩක් යාචකයෝ මුදල් හොයාගෙන යනවා අතනට කසිප්පු, ඒ වගේ දේවල් පානය කරන්න. ඒ වගේ අයට මොකක්හරි ක්‍රියාමාර්ගයක් ගන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** යාචකයොන්ටද?

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** ඒ අය ඉන්නේ මත්ද්‍රව්‍ය වෙනුවෙන් මුදල් හොයන්න ඇවිල්ලා. පාරිභෝගිකයොන්ටත් ඒක ලොකු කරදරයක්. මත්ද්‍රව්‍ය කියන එකට මම තදින්ම විරුද්ධයි.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** තොටගොඩ, කුරුන්ද කන්ද කියන්නේ කසිප්පු තිප්පොලක්. තව වෙනතුරු පොලීසිය කිසි දෙයක් කරන්නේ නැහැ. ඒ නිසා ඔබතුමාගේ යෝජනාව පිළිබඳව මම ස්තුතිවන්ත වෙනවා. අද තොටගොඩ, ලබුදූව කියන ප්‍රදේශවල හවසට දරුවෙකුට පාරට යන්න බෑ. කසිප්පුකාරයෝ මහ මඟ. ඒවා ඉදිරියෙන් ඉන්නේ කීයක් හරි හොයාගෙන කසිප්පු පානය කරන්න යන්න. ගරු සභාපතිතුමනි, වහාම ක්‍රියාමාර්ග ගන්න. අදාළ පොලීසිය දැනුවත් කරන්න. නියෝජ්‍ය පොලිස්පතිතුමා දැනුවත් කරන්න. ජනාධිපතිතුමා දැනුවත් කරලා මේවාට වහාම වැටලීම් කරලා නවත්වන්න කියන්න. මේවා මහා විනාශයක් ගමට. අවට නිවෙස් හිමියන් බය කරගෙන මේවා කරන්නේ. විරෝධතාවයක් එනකොට අවට නිවෙස් හිමියන් බය කරනවා. ඒ නිසා ඇත්තටම වගකීමක් තියෙනවා ගරු සභාපතිතුමනි, වහාම පොලිස්පතිතුමා දැනුවත් කරන්න. ආරක්ෂක ලේකම්තුමා, ජනාධිපතිතුමා දැනුවත් කරලා වහාම වැටලීම් කරලා මේවා ඉවත් කරන්න කියලා මම ඉල්ලා සිටිනවා.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** එක පාරක් සම්බන්ධීකරණ කමිටුවේදී සුරාබදු දෙපාර්තමේන්තුව නියෝජනය කරපු නිලධාරිතුමා ප්‍රකාශ කරා කසිප්පු වගේ දේවල් මාසයක් ඇතුළත නතර කරනවා ඕක ඔහොම කතා කරලා වැඩක් නෑ කියලා. අද වෙනකන් ගනිපු ක්‍රියාමාර්ගයක් නෑ එතුමා. දෙවැනි සම්බන්ධීකරණ කමිටුවේදීත් කතා කරා ඒ ගැන. නමුත් අද වෙනකම් ක්‍රියාත්මක වෙලා නෑ.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, ඔය සුරාබදු එකේ නිලධාරියා ගැන විශ්වාසයෙන් කියන්නේ. වගකීමෙන් කියන්නේ. කසිප්පුකාරයාගේ ජීම් එකේ සෙල්ලම්කරනවා හැන්දෑවට ඇවිල්ලා. ඔන්න ඕකයි තත්වේ. සම්බන්ධීකරණ කමිටුවේදී කිවුවා දුරකථන ඇමතුමක් දීලා එවෙලෙම වටලනවා කියලා. පට්ටපල් බොරු. මුන් ඔක්කොම වක්‍රව කසිප්පුකාරයොත් එක්ක සම්බන්ධයි. ඔන්න ඕකයි ඇත්ත.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මින් ඉදිරියට සම්බන්ධීකරණ කමිටුවලට සියලු මන්ත්‍රීවරු කැඳවනවා. එතකොට කතා කරන්න. ඉස්සරහට සම්බන්ධීකරණ කමිටුව රැස්වෙනවා. අපේ නායකත්වය යටතේ සම්බන්ධීකරණ කමිටුව පැවැත්වෙන්නේ. එතකොට ඒක මතුකරලා තීන්දු ගන්න කියමු. සභාවට තීන්දුවක් ගන්න බෑ. අපිට ඕක කතා කරන එක විතරයි පුළුවන්.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** යෝජනා කරලා යවන්න පුළුවන්.

**ගරු මන්ත්‍රීනි එම්. ගයාත්‍රි කාංචනා මැතිණිය ඃ-** ගරු සභාපතිතුමනි, මටත් තියෙනවා ඒ සම්බන්ධව කාරණාවක් කතා කරන්න. ලබුදූවේ බස් නැවතුම්පොළක් තියෙනවා. මම හිතනවා සියලු දෙනාම මේ ප්‍රශ්නය ගැන දැනුවත් විය යුතුයි. අම්බලන්වත්ත පාරේ බස් නැවතුම්පොළක් තියෙනවා. ඒකේ දැන් යාචකයෝ දෙන්නෙක් නතර වෙලා උයාගෙන කනවා.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** දක්ෂිණපාය ඉස්සරහද?.

**ගරු මන්ත්‍රීනි එම්. ගයාත්‍රි කාංචනා මැතිණිය ඃ-** ඔව් දක්ෂිණපාය ළඟ. එතන යාචකයෝ දෙන්නෙක් නතර වෙලා උයාගෙන කනවා. එක්කෙනෙක් මත්ද්‍රව්‍ය පාවිච්චි කරනවා අපි පැහැදිලිවම දැක්කා. ඒ බස් නැවතුමේ දැන් කිසිම කෙනෙක් නතර වෙන්නේ නෑ. සියලුම මගීන් එළියට වෙලා ඉන්නවා. සම්බන්ධීකරණ කමිටුව ඒ සම්බන්ධව ක්‍රියාමාර්ගයක් ගනීවි කියලා මම හිතනවා. ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නිලධාරිනියන්ට කිවුවම කියනවාලු අපි බස් නැවතුම්පොළේ හිටියට ඒක දැක්කේ නෑ කියලා. මාස දෙකක් විතර වෙනවා ඒ අය පදිංචි වෙලා. ලොකුම කරදරයක් වෙලා තියෙනවා ජනතාවට ඒ අය. සම්බන්ධීකරණ කමිටුවේදී හරි කතා කරලා ඒකට විසඳුමක් ලබා දෙන්න කියලා මම ඉල්ලා සිටිනවා.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** කාංචනා මන්ත්‍රීතුමියගේ යෝජනාව මම අනුමත කරනවා. බොජුන්හලට ගියහම ඒකේ වැඩකරන සේවක සේවිකාවෝ කියනවා මේ යාචකයන් බස් නැවතුම්පොලේ නැවතිලා උයා පිහාගෙන කනවා ලොකු කරදරයක් කියලා. ඔය කතාවම තමයි අපිට කියන්නේ සැහෙන්න කාලයක් තිස්සේ. ඒකට එන පාරිභෝගිකයන්ට ඒක අපහසුතාවයක්. ඇවිල්ලා අත දික් කරනවා එතන ඉඳන් කන ජනතාවට. එතකොට ඒ මිනිස්සුත් අපහසුතාවයට පත් වෙනවා. ඉතිං වහාම ක්‍රියාමාර්ගයක් ගන්න මම යෝජනා කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔය කාරණා දෙකටම ලියුම් දැම්මානම් හරි මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියටයි, සම්බන්ධීකරණ කමිටුවටයි. සම්බන්ධීකරණ කමිටුව කැඳෙව්වම අපිට කරන්න පුළුවන් ලිඛිතව දැනුම් දීම විතරයි.

**<u>ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමාගේ යෝජනා</u>**

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ- 17.** මාර්ග සංවර්ධනය කිරීමේදී අසාධාරණ ලෙස අත්හරිනු ලැබූ පහත දක්වා ඇති මාර්ග සහ මාර්ග කොටස් සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

I. පරණ ගෙදර වත්ත උපුල් මහතාගේ නිවස අසල මාර්ගයේ ඉතිරි කොටස
II. පරණ ගෙදර වත්ත ඉඳුනිල් මහතාගේ නිවස අසල මාර්ගයේ ඉතිරි කොටස
III. ජස්ටින් කන්ද කෝන්ගහවත්ත මාර්ගයේ ඉතිරි කොටස
IV. රණවිරු ප්‍රියංකර මාවතේ අවසන් අතුරු මාර්ගයේ ඉතිරි කොටස
V. ගොඩකන්ද පන්සල පාරේ පතිරගේ මහතාගේ නිවස අසල මාර්ගයේ ඉතිරි කොටස

VI. පැල්පොල වත්ත පස්වන පටුමගේ ඉතිරි කොටස
VII. කජ්ජුගහවත්ත මැද පාරේ ඉතිරි කොටස
VIII. පැතුම් උයන ගුණවර්ධන මහතාගේ නිවස අසල මාර්ගයේ ඉතිරි කොටස
IX. ගොඩකන්ද, සංඝරතන මාවතේ I,II,III යන අතුරු මාර්ගයන්වල ඉතිරි කොටස්
X. ගල්කැටිය ස්වර්ණලතා මහත්මියගේ නිවස අසල මාර්ගයේ ඉතිරි කොටස
XI. බදුවත්ත නාමල් මහතාගේ නිවස අසල මාර්ගයේ ඉතිරි කොටස

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** ඒ කොටස් ටික තමයි ඉතුරු වීම් ටිකට තියෙන්නේ. නැත්නම් නිවාස දෙකයි තුනයි කියලා මේ ටික අතහරීවී. පාර හදලා ඉවර වුණාට පලිගැනීමට තමයි ඒ වෙලාවේ අත ඇරියේ. ගෙවල් දෙකක් කියලා අත හැරියා. අත ඇරලා නිකං හිටියේ නෑ ලියනගේට කියලා හදාගන්නත් කිවුවා. මම දැන් මේ ටික හදවනවා.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** මුල් කොටසේ ඔක්කොම ටික එක්සත් ජාතික පක්ෂයේ අයද ඉන්නේ.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** මුල අත හැරලා අන්තිම කොටස්වල හැදුවා. ජස්ටින් කන්ද මාර්ගයේ ආරම්භක ටික අත හැරලා උඩ ඉඳලා අනෙක් පැත්තෙන් පහළට හැදුවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ- 18.** බෝගහවේල්ල පන්විලදූවවත්ත මාර්ගයේ IV වන අතුරු මාර්ගය සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ- 19.** බෝගහවේල්ල නිශාන් මහතාගේ නිවස අසල මාර්ගය සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ- 20.** ගිංතොට ජලයිවුඩ් ආයතනය සතු භූමිය අත්පත් කර ගැනීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** මෙක 2018-04-03 දින රටේ අවාසනාවට පත්වෙච්ච මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිවරයා විසින් අක්කර 17 ක භූමි ප්‍රමාණය ලබා දෙනවා නිදහස් ඔප්පුවකින්. අරගත්තේ යසසිරි කස්තුරිආරච්චි කියලා එක්කෙනෙක්. ඔප්පුවේ තියෙනවා. ඉතිං 2018-04-03 දින නිදහස් ඔප්පුවකින් ලබා දෙනවා. හැබැයි ගමේ අහිංසක දුප්පත් මනුස්සයෙකුට පර්චස් 10 ක් ලබා දෙන කොට ඒ භූමිය දෙන්නේ ප්‍රාදේශීය ලේකම්වරයාට යට කරලා. ප්‍රාදේශීය ලේකම්වරයාගේ බලය තියාගෙන දෙන්නේ. මෙවගේ නිදහස් ඔප්පුවක් කිසිම වෙලාවක දෙන්නේ නෑ. මේ අක්කර 17 නිදහස් ඔප්පුවකින් මේ රටේ අවාසනාවට පත්වෙච්ච සිරිසේන ජනාධිපතිවරයා ලබා දෙනවා.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** මුදලක් දාලා තියෙනවාද මන්ත්‍රීතුමා.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** මුදලක් දාලා තියෙනවා. අසූහත් ලක්ෂ හතළිස් පන්දහස් හාරසිය පනහක මුදලකට තමයි දෙන්නේ. යට ගනුදෙනු වෙලා තියෙනවා කියලා අපිට ආරංචි තියෙනවා. නුවර එළිය ප්‍රදේශයේ අරලිය හෝටලය සම්බන්ධ භූමියක ගනුදෙනුවක් ඒක. නීත්‍යානුකූලව හරිද වැරදිද කියන්න අපි දන්නේ නෑ. එහෙම ගනුදෙනු වෙලා ලංකාවේ අවශ්‍ය

තැනකින් භූමිය දෙනවා කියලා කතාව තියෙනවා දැන්. ඒකට හරියන්න තමයි මේ අක්කර 17 ක භූමිය දීලා තියෙන්නේ.

ඉතිං මේක ඊගාවට කැබලි තුනකට කඩනවා. 2018 වර්ෂයේ කැබලි තුනකට කඩනවා. අක්කර පහේ හයේ කෑලි වලට කඩලා එක කැබැල්ලක් නැවත කැබලි තුනකට කඩනවා. ඉඩමක් කැබලි කරලා සංවර්ධනය කිරීමේදී අක්කර 2.5 ට වැඩි නම් 10% ක ප්‍රමාණයක් සභාවට දෙන්න ඕන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒ වෙන්දේසි කිරීමේදී

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** මේක ගන්න කෙනා වෙන්දේසි කරනවා මේ අක්කර 2.5

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කොහෙද වෙන්දේසියක් කරන්නේ. කොතනද වෙන්දේසියක් යන්නේ. කොහේද වෙන්දේසි කරන්න දාලා තියෙන්නේ.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** මේක අක්කර 2.5 ට කඩන කොට, කෑලි තුනකට කඩලා විකුණලා තියෙන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කොහේද විකුණලා තියෙන්නේ. කොතනද විකුණලා තියෙන්නේ. මට පෙන්වන්න. මට පෙන්වන්න විකුණපු තැනක්.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** විකුණන්න මිනිස්සු මෙතනට හොයාගෙන ඇවිල්ලා තියෙනවා. අපි මෙතන ඉන්න කොට අහලා තියෙනවා මේක ගන්න නිදහස් එකක්ද කියලා. ඉතිං ඔබතුමා ඒක ගැන ලොකුවට හිතන්න එපා. ඔබතුමා අපිත් එක්ක ඉන්න. සභාව එක්ක ඉන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** සභාවේ ඔබතුමාලා එක්ක තමයි ඉන්නේ. නමුත් මටත් සීමාවක් තියෙනවා දෙයක් කරන්න. මෙන්න ෆයිල් එක තියෙනවා ඕන මන්ත්‍රීවරයෙකුට බලන්න පුළුවන්. අවසන් එකත් එවලා තියෙනවා මම අත්සන් කරාට පස්සේ. මේක තහනම් කරා මම. ඒකත් කියන්න ඕන. දීපු එක අවලංගු කරා. ඔබතුමා කියන්නකෝ. ඊට පස්සේ මම කියන්නම්.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** 2019-05-21 මේ සභාවේ මන්ත්‍රීවරු සියලු දෙනා එකතු වෙලා අපි තීන්දුවක් ගන්නවා මේක තවදුරටත් දෙන්න එපා කියලා. අපේ බලාපොරොත්තුවක් තිබුණා ගෝඨාභය රජපක්ෂ මැතිතුමා රටේ ජනාධිපති බවට පත්වෙයි කියලා. මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා මේක නිදහස් ඔප්පුවකින් ලබා දුන්නාට පස්සේ කිසිම කෙනෙක්ට ඒක වෙනස් කරන්න බැහැ. ජනාධිපතිවරයාම කැබිනට් පත්‍රයක් හරහා පවරා ගැනීම කරන්න ඕන හොයලා බලපු නීතියේ හැටියට. ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගෙන් ඉල්ලීමක් කරන්න හිටියා මේ පිළිබඳව. ඒ අතරතුර කාලයේ අපි සභා තීන්දුවක් ගත්තා 2019-05-21 මේ සභාවේ සියලු මන්ත්‍රීවරු ඒකමතිකව මේක සඳහා තවදුරටත් කැබලි කිරීම් වලට අනුමැතියක් දෙන්න එපා කියලා. හැබැයි 2019-10-11 දින මේ සභාව කැබලි තුනකට අනුමත කරලා තිබුණ එක ආයේ වතාවක් එක් බිම් කැබැල්ලක් කෑලි තුනකට කඩලා අනුමත කරනවා. ඉතිං දැන් එතන වැරැද්දට තමයි අපි සභාවට චෝදනා කරන්නේ. සභාවෙන් වෙච්ච වැරැද්ද එතනින් එහා එකක් නෙමෙයි තහනම් කරලා තිබුණ අවස්ථාවේ දීපු එක. ඉතිං දැන් අපි ජනාධිපතිවරයාගෙන් ප්‍රදේශයේ සංසරත්නයෙන් මේක නැවත රජයට පවරා දෙන්න කියලා ඉල්ලීමක් කරලා තියෙනවා. ඉතිං ඒ අතරේ සේවකයෝ 200 ක් විතර ඒ ආයතනයේ සක්‍රීය මට්ටමින් වැඩ කරනවා. මේක කැබලි කරලා විකුණන්න සැලසුම් කරනවා. ඒ නිසා මේ භූමිය සභාවට පවරා ගන්න කියලා මම යෝජනා කරේ.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** මම හිතන්නේ අපේ ලියනගේ මන්ත්‍රීතුමා කරපු කතාවේදී කිවුවා අපි 2019-05-21 සභාවට තමයි මේ යෝජනාව ගේන්නේ. කොට්ඨාශයේ මන්ත්‍රීවරයා විදියට යෝජනාව මම ගේන්නේ. ඒ යෝජනාව ඒකමතිකව සභා සම්මත වෙනවා සභාපතිතුමා ඇතුළු සියලු දෙනාගෙන්. නමුත් එහෙම තියෙද්දි තමයි මේක කැබලි තුනකට කඩලා දීලා තියෙන්නේ. මම දන්නේ නෑ එක් කොහොම වුණාද කියලා. අපි විශ්වාසය තැබුවා සභාව හා සභාපතිතුමා කෙරෙහි මේක දෙන එකක් නෑ කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** දැන් දුන්නා කියලා ඔබතුමා අදහස් කරන්නේ මොකක්ද?. මට ඒක කියන්නකෝ. දීම කියන එකෙන් අදහස් කරන්නේ මොකක්ද?.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** මම කියන එක අහන්නකෝ සභාපතිතුමා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඉතිං ඔබතුමාලා කියන්නේ නැහැනේ. කොටසක් හංගලානේ කියන්නේ. ඒකනේ වැඩේ.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** නෑ. නෑ. හංගලා නෙමෙයි කියන්න හදන්නේ. කියන්න අදහසක් එන්න දෙන්න එපැයි. අදහසක් එන්නේ නැතුව මේක කතාකරන්න බෑනේ. ඇත්තටම අපි දන්නේ නෑ මේක දීලද නැද්ද කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එහෙම නම් මොනවාද කියන්නේ.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** පොඩ්ඩක් ඉන්නකෝ. ඒක තමයි මේ කියන්න හදන්නේ. මම මේ කියන්නේ ගමේ මිනිස්සු කියන විදියට. මම මේක බලලා නෙමෙයි කියන්නේ. මම ඒ ප්‍රදේශයට ගියපු අවස්ථාවක පන්සලේ හාමුදුරුවොත්, ගුරුවරු ඔක්කොමත් කියනවා මහත්තයා අන්න අර ඔයාලට වෙන්දේසි කරන්න එපා කියපු ඉඩම අන්න දීලා තියෙනවා කියලා. මම ඇහුවා කොහොමද එහෙම දෙන්නේ අපි සභාවක් විදියට තීන්දුවක් අරගෙන තියෙනවා ඒක දෙන්න එපා කියලා. අපි ඒ කිව්වේ සභාවක් විදියට සභාව ගැන විශ්වාසය තියලා. ඊට පස්සේ ගිහින් බලන කොට ඇත්ත තමයි. ඒක දීලා යම් යම් කටයුතු ඒකේ සිද්ධ වෙනවා.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** ඒක කාටද දීලා තියෙන්නේ නිදහස් ඔප්පුවකින්.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** යසසිරි කස්තුරිආරච්චි කියන නමට තමයි දීලා තියෙන්නේ මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා. මම කියන්නේ වෙන මොකක්වත් නෙමෙයි. අපි සභාවක් විදියට හැල්ලුවට පත් වෙන ඒවා. මම එදත් කිව්වේ ප්‍රාදේශීය සභාව තියෙන්නේ බෝපෙ පෝද්දල ජනතාවට සේවය කරන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** හරි ඔබතුමා කියන එක කියන්නකෝ. දැන් වෙලා තියෙන දේ කියන්නකෝ මට. එතකොට වෙච්ච දේ කියන්නම්.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** දැන් මම මේ කියන්න හදන්නේ මෙහෙමයි. අපි සභාවක් විදියට තීන්දුවක් ගත්තා නම් ඒ තීන්දුව වෙනස් කරන්න එපා. ඒ තීන්දුව වෙනස් කරලානේ ඔබතුමාලා මේ අනුමැතිය දීලා තියෙන්නේ කැබලි තුනකට කඩන්න. කොටින්ම කියනවානම් ඒක මේ ප්‍රසිද්ධ දෙයක්. පත්තරේ යනවා මේක. පත්තරේ ගියපු කතන්දරේ මේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** වෙන්දේසි කරන්න දෙන්න එපා. කොහොද වෙන්දේසි කරන්න දීලා තියෙන්නේ. වෙන්දේසි කරන්න දීපු තැනක් මට ලිඛිතව පෙන්වන්න.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** අපිට කියන්න පුළුවන් මන්ත්‍රීවරු විදියට වෙන්දේසි කරන්න දෙන්න එපා කියලා තමයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔව් ඉතිං වෙන්දේසි කරන්න දීලා නෑ.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** වාණිජ භාවිතය සඳහා දීලා තියෙන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මොකක්ද වාණිජ භාවිතය සඳහා කියන්නේ. වාණිජ භාවිතය සඳහා කියන එකේ තේරුම කියන්නකෝ. මොකක්ද වාණිජ භාවිතය කියන්නේ.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** ඕනම ව්‍යාපාරයක් කරන්න පුළුවන් කියන එක. නිදහස් ඔප්පුවකින් දුන්නම ඒක කැබලි කරන්නත් පුළුවන්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කොහොමද කැබලි කරන්න පුළුවන්. වාණිජ භාවිතයට දුන්නම කැබලි කරපු තැනක් මට පෙන්වන්නකෝ. එයාට නීත්‍යානුකූලව දීපු ඔප්පුව අනුව, ලිඛිතව දීපු ඔප්පුව අනුව ඒක පුද්ගලික ඉඩමක්. එයාට ඒ අයිතිය තියෙනවා. නමුත් සභාවෙන් අනුමත කරලා නෑ.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** මේක සභාපතිතුමා තර්ක කරන්න යන්න එපා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** නෑ මම නිකන්ම ඉන්නම්. ඔය ගොල්ලෝ කියන ඔක්කොම පිළිගන්නම්. හරි ඔයගොල්ලෝ කියන එක කියන්නකෝ. මටත් උත්තර දෙන්න අවස්ථාව දෙන්නකෝ.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** මේක වෙන්දේසි කරන්න ඉඩ දෙන්න එපා මොන විදියකින්වත්. ඒක අත්පත් කර ගන්න. ඊට පස්සේ මේ රටේ ජනතාවට වැඩ කරන්න පුළුවන් ආයතනයක් බවට පත් කරන්න. ඒක තමයි අපේ බලාපොරොත්තුව.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** හරි නේ දැන් ඒක ඉවරයිනේ. මම දැන් උත්තර දෙන්නද?. මම උත්තර දෙන්නද කියලා ඇහුවේ.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** හරි දෙන්න ඒක ප්‍රශ්නයක් නෑ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මේකේ කිසිසේත්ම ඉඩම් වෙන්දේසියක් වෙලා නෑ. වගකීමෙන් කියනවා වෙන්න දෙන්නෙත් නෑ. මේකට මුලින්ම දීලා තියෙන්නේ 2018 ඔක්තෝම්බර් මාසයේ කැබලි තුනකට අනුමැතිය. ඒ දීලා තියෙන්නේ මාර්ග සංවර්ධන අධිකාරියේ සියලු සුදුසුකම් සම්පූර්ණ කරලා මෙහෙට ෆයිල් එක ආවාට පස්සේ. වෙන්දේසියක් නෙමෙයි. බොහොම පැහැදිලිවම තියෙනවා. මෙන්න ෆයිල් එක තියෙනවා. ෆයිල් එක ඕන කෙනෙකුට බලන්න පුළුවන්. සම්පූර්ණයෙන්ම පුද්ගලික ඉඩමක් මේක. 1994 දී තමයි පුද්ගලික ඉඩමක් බවට පත් කරලා තියෙන්නේ.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** 1994 දී පුද්ගලික ඉඩමක් නෙමෙයි. බොරු චෝදනා කරන්න එපා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** චුට්ටක් ඉන්න කියන්න. 1994 දී පුද්ගලික ඉඩමක් බවට පත් කරලා ඔප්පු දීලා තියෙන්නේ 2018 දී.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** ඔප්පුවකින් දෙනකම් පුද්ගලික ඉඩමක් වෙන්නේ කොහොමද?.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම ඒ ටික කියන්නම්. ඔබතුමාලට ගැටළුවක් තියේ නම් ලිඛිතව සියලු දේ තියෙනවා. මම කියන්නම්. ඊට පස්සේ මම අවලංගු කරා. ඒ කැබලි සියල්ලම කැබලි 06 කට කැඩිලා තිබුණේ. මුලින් තුනයි පස්සේ තුනයි. සියලු දේ අවලංගු කරා 2019-12-05 වෙනිදා. අවලංගු කරාට පස්සේ නැවත එවනවා මට ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවෙන් 2019-12-12 වෙනිදා ගිංතොට පිහිටි යශෝධා එන්ටර්ප්‍රයිසස් පුද්ගලික සමාගමේ ඉඩම් හිමිකම් පැවරීම සම්බන්ධයෙන්. රජයේ ඉඩම් ආඥා පනතේ දෙවන වගන්තිය යටතේ අදාළ ඉඩම සඳහා නිකුත් කර ඇත්තේ පූර්ණ අයිතිය ඇති නිදහස් දීමනා පත්‍රයක් බැවින් ඉඩම සම්බන්ධව සිදු කරන පසු කටයුතු සම්බන්ධව රජයේ මැදිහත්වීමක් අවශ්‍ය නොවන බවටත්, එම දීමනා පත්‍රය මගින් බැහැර කර ඇති ඉඩම පුද්ගලික ඉඩමක් ලෙස සලකා කටයුතු කළ හැකි බව දන්වලා.

මේක ගැන දෙපාරක් අපිට ලියුම් එවලා තියෙනවා. මුලින් මම පෙන්වන්නම්. මේක මේ මාව හිරකරන්න කරන වැඩක්. කවුරුවත් මම වෙනුවෙන් පෙනී ඉන්නේ නෑ නඩුවක් වැටුණ ගමන්. නමුත් මම අවලංගු කළා. අවලංගු කරා කියලා එතන බෝඩ් එකකුත් දාලා තියෙනවා. ඕන කෙනෙකුට බලන්න පුළුවන්. නමුත් මම දැනටත් කියන්නේ මේක පුද්ගලික ඉඩමක්.

❖ යශෝධා එන්ටර්ප්‍රයිසස් පුද්ගලික සමාගම සතු ගිංතොට පිහිටි ඉඩමේ පිඹුරුපත් හා අනුබෙදුම් තාවකාලිකව අත්හිටුවීම සම්බන්ධව එම ආයතනය විසින් ප්‍රාදේශීය සභාවට යොමු කරන ලද ලිපිය සභාගත කරන ලදී.

ඒ සියලු ලේඛන මෙතන තියෙනවා දැනට ඒක පුද්ගලික ඉඩමක්.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** සභාපතිතුමා කියනවානම් ඒක පුද්ගලික ඉඩමක්. ඒක හරි. හැබැයි පුද්ගලික ඉඩමක් වුණේ 2018-04-03 වෙනිදා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** නෑ මේකේ කිවුවා සුද්ද සිංහලෙන්. 1994 දී ගැසට් පත්‍රයකින් දුන්නේ. එතකොට පුද්ගලිකයි.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** 2018 වෙනකම් මේ ඉඩම තිබුණේ 99 අවුරුදු බද්දට.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මේකේ තියෙනවා මන්ත්‍රීතුමා. මේකේ තියෙනවා ටෙන්ඩර් කරපුවා. අනිත් අය අත්සන් කරපු ඒ ඔක්කොම තියෙනවා. කොහොම හරි මන්ත්‍රීතුමා

මෙහෙමයි. ඔබතුමා මට චෝදනා කරා තැනින් තැන, දැනටත් චෝදනා කර කර යනවා. ඒක මම දන්නවා. දිල්රුක් සභාපති මේක විකුණලා ලක්ෂ 50 ක් ගත්තා කිය කිය ඔබතුමාලා යනවා. මම ඉතාමත් වගකීමෙන් කියනවා.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** මම ඒ වගේ මෝඩයෙක් නෙමෙයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමාගේ ෆේස්බුක් එකවුන්ට් එකෙත් දාලා තියෙනවා නේ. ඔබතුමා දාලා තියෙනවා ප්‍රාදේශීය සභාවේ සභාපති කියලා. මන්ත්‍රීතුමා අනුමැතිය දීලා තියෙන්නේ මේකට. මේක තේරුම් ගන්න. මේ අයට ලෝන් එකක් ගන්න ඕන. ඒකට මේක කැබලි කරලා තැන් තැන් වලින් ණය මුදල් ලබා ගන්නේ. නැතුව කිසිසේත්ම වෙන්දේසියකට අවසර දීලත් නෑ. දෙන්නෙත් නෑ. නමුත් මම ඒ කැබලි 06 ට ලබා දීපු අනුබෙදුම් අනුමැතියත් අවලංගු කරා. ඒකත් තාවකාලිකව අත්හිටුවලා තියෙන්නේ. හැබැයි මෙහෙම දෙයක් තියෙන්නේ. ඔය කවුරුවත් පෙනී ඉන්නේ නෑ මම වෙනුවෙන්. මේකේ මට නඩුවක් දැම්මොත් මේ සභාවේ කවුරුවත් පෙනී ඉන්නේ නෑ. ඒකත් මම දන්නවා.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා ඔය වගේ දේකට ඒ කැප කිරීම කරනවා වගේම මේ කොට්ඨාශය පුරා තියෙනවා ප්‍රශ්න. මේ එහා පැත්තේ වතුර ප්‍රශ්නයක් තියෙනවා. ඊළඟට අර බෝගහවෙල්ලේ වතුර ප්‍රශ්නයක් තියෙනවා. මහජන ගැටළු වලට ඔය තරමට කතා කරනවා නම් අපි ඔබතුමා එක්ක ඉන්නවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඇයි කරේ නැද්ද?. ඔබතුමා මෙතන නිකං හිටියා. දැන් එතකොට සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි ස්තුති කරේ මම නිකං හිටපු හින්දද?. මන්ත්‍රීතුමා ඔබතුමා කරන්න පුළුවන් හැම දේම ගන්නවා. ඔබතුමා ප්‍රතිපාදනත් ගන්නවා. ඔක්කොම ගන්නවා. ඔබතුමා තරම් කුහක මන්ත්‍රීවරයෙක් නෑ මන්ත්‍රීතුමා.

(සභාව පැහැදිලි නොවීය.)

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** නමුත් මන්ත්‍රීතුමා, සභාපතිවරයා විදියට මටත් මේක හිර කරන් ඉන්න පුළුවන් කාලයක් තියෙනවා. ඔබතුමාම කියයි මම මේක හිර කරන් ඉන්න කොට මෙන්න සභාපතිතුමා සල්ලි ගන්න හිරකරන් ඉන්නවා කියලා.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** මේ සභාවට බැරි වුණා එදා ගනිපු තීන්දුව අනුව ඉඩම පවරලා දෙන්න කියලා මෛත්‍රීපාල සිරිසේන මහත්තයාගෙන් ඉල්ලලා ලියුම යවා ගන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මොකක්ද?

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** අපි යෝජනාවක් ගෙනාවා මේ ඉඩම පවර ගන්න කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කවදද? ඉල්ලීම කරලා තියෙන්නේ.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** සභා වාර්තා අරන් බලන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** 2018 තුන්වෙනි මාසයේ දීලා තියෙන්නේ. ඔබතුමා මොනවද කතා කරන්නේ.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** හැබැයි ඒ ලියුම මේ සභාවෙන් තැපැල් කර ගන්න බැරි වුණා අපිට. ඊට පස්සේ පෞද්ගලිකව ලිපියක් හදලා තමයි යැවුවේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අනිත් එක මම වගකීමෙන් කියනවා වෙන්දේසි කරන්න නෙමෙයි. ඔබතුමා වෙන්දේසියකත් කැබලි වෙන් කිරීමකත් වෙනස කියන්න මට.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** වාණිජ භාවිතය සඳහා දුන්නම එයාලට ඕන දෙයක් කරන්න පුළුවන්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මොනවද ඕන දෙයක් කරන්න පුළුවන් වෙන්නේ. වෙන්දේසියක තියෙන මූලික ලක්ෂණ මට කියන්නකෝ. ඔබතුමා ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරයෙක් කියලා කියා ගන්නවානේ. මට ඔබතුමා කියන්න වෙන්දේසියක් කරන විදිය. ඔබතුමා බැරි හින්දා

දඟලන්නේ. බැරිනම් බැරියි කියන්න. වෙන්දේසියයි මේක අතරයි වෙනස කියන්නකෝ. මොකක්ද කරන්න පුළුවන් මේක දුන්නහම.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** මේ ඉඩම වෙන්දේසි කරන්න කලින් වක්‍රාකාරව මේ දේවල් කරන්නේ. අක්කර 17 ක ඉඩම එක පාර කැබලි කරලා විකුණන්න දැම්මොත් මේ මනුස්සයා 10% ක් මේ සභාවට ලබා දිය යුතුයි. ඒකේ කපටි කමට තමයි මේ මනුස්සයා මුළු ඉඩම මූලික වශයෙන් කොටස් තුනකට කඩන්නේ. එක කොටසක් එතකොට අක්කර 06 ක් 05 ක් වෙනවා. ඊට පස්සේ ඒ එක් කැබැල්ලක් නැවත කඩනවා අක්කර 02 ක් වෙන්න. එතකොට අක්කර 2.5 ට අඩුයි. එතකොට සභාවටවත් බිම් අඟලක් එන්නේ නැති වෙන්න ඕක කැබලි කරලා විකුණන්න හදන්නේ මේ ගොල්ලෝ. දැනට කරලා නැති වුණාට ඉදිරියේදී වෙන්නේ මේක.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** නේවාසික භාවිතයෙයි, වාණිජ භාවිතයෙයි වෙනස මට කියන්නකෝ ඔබතුමා. වාණිජ භාවිතයට දුන්නහම පුළුවන්ද ඉඩම කැබලි කරලා නේවාසික භාවිතයට විකුණන්න.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** ඔබතුමා වාණිජ භාවිතයට දීලා තියෙන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔව්. වාණිජ භාවිතයට දීලා තියෙන්නේ. වෙන්දේසියකට යන්න නම් නේවාසික භාවිතයට ගන්න ඕන.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** ඊට පස්සේ නේවාසික භාවිතයට ඉල්ලන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඊට පස්සේ දෙන්නේ කොහොමද?.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** ඊට පස්සේ ඉල්ලනවානේ මේ අය.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම කියන්නේ මේකයි මන්ත්‍රීතුමා. අද වුණත් මේ ලියුම බලපාන්නේ නෑ නැවත පවරා ගැනීමකට. නැවත පවරා ගැනීමක් කරනවා නම් මේ ලියුම බලපාන්නේ නෑ.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** පවරා ගන්න යෝජනාවක් ගෙනාවේ. මේවා ගැන කතා කරන්න නෙමෙයි. මේ ඉඩම පවරා ගන්න සභාවේ මන්ත්‍රීවරු යෝජනාවක් ගෙනාවා. ඒක ඒකමතිකව සම්මත කරන්න කියන යෝජනාව මම ගෙනාවේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමාගේ යෝජනාව නෙමෙයි ඊට වැඩිය පිළිවෙලට ගෙනාපු යෝජනාවක් තියෙනවා. ඒක සම්මත කරමු. මේක සභාවට පවරා ගන්න නෙමෙයි නැවත ආණ්ඩුවට පවරා ගන්නයි ඕන. ඔබතුමාට තේරෙන දෙයක් කරන්න. සභාවට පවරා ගන්න බෑ. මේක විහිළුවට ලක් කරන්න එපා. මේක නැවත රජයට පවරා ගන්නයි ඕන.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** රජයට පවරා ගන්න යෝජනාවක් ගෙනාවා අපි මීට කලින්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කොහෙද ගෙනත් තියෙන්නේ.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** සුගත් මන්ත්‍රීතුමා ගෙනාවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එහෙමනම් මොකටද තව එකක් ගේන්නේ. ඔබතුමා දැන් ගෙනාවේ සභාවට පවරා ගැනීමටනේ.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** සභාවට පවරා ගන්න මම ගෙනත් තියෙන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** තුසිත මන්ත්‍රීතුමා පිළිවෙලට යෝජනාවක් ගෙනල්ලා තියෙනවා. ඒක හරියට තියෙනවා.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** නෑ. සුගත් මන්ත්‍රීතුමා මාස හයකට කලින් ගෙනල්ලා තියෙනවා. ඒ යෝජනාව තමයි මේ පත්තරේ ගියෙත්. තුසිත මන්ත්‍රීතුමාට යෝජනාවක් ගේන්නත් බෑ මාස හයකට කලින් ඒ පිළිබඳව. ඒකයි සභාවට පවරා ගන්න කියලා ගෙනාවේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමාලා වෙන්දේසි කරන එක නවත්වන්න ගෙනල්ලා තිබුණේ.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** නෑ. ගෙනාවා. වෙන්දේසි කිරීම නවත්වලා රජයට පවරා ගන්න සුගත් මන්ත්‍රීතුමා ගෙනාවේ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** මේකට එක එක්කෙනා කුලල් කා ගන්න නෙමෙයි තියෙන්නේ.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** මේක ගැන තර්ක කරන්න නෙමෙයි මෙතනට ඇවිල්ලා තියෙන්නේ ගිංතොට ඉඩමේ අයිතිකාරයාගේ පැත්තෙන් වගේනේ. අපි කියන්නේ සභාවක් හැටියට මේක පවරා ගන්න කියලා.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** "ගිංතොට පිහිටි රජයට අයත්ව තිබූ තුනී ලෑලි සංස්ථාව පසුගිය රජය සමයේ ඉතා අඩු මුදලකට යසසිරි කස්තුරිආරච්චි මහතා වෙත විකුණා ඇත. එම කර්මාන්ත ශාලාව පිහිටි මෙම ඉඩම දැනට විකිණීමට සූදානමක් පවතින බව දැනගන්නට ලැබී ඇත. මෙම ප්‍රදේශයට ඇති එකම කර්මාන්ත ශාලාව වන මෙය විකිණීම ජාතික අපරාධයක් වන බැවින් මෙම කර්මාන්ත ශාලාව නැවත රජයට පවරා ගන්නා මෙන් යෝජනා කරමි" කියලා කරලා තියෙන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කවදද ගෙනල්ලා තියෙන්නේ. ඔය මොහොක එකක්ද කියන්නේ. ඔබතුමා මේ අද සභාවේ තියෙන යෝජනාවක් නේ කියෙව්වේ. අද තියෙන යෝජනාවක් කියෙව්වේ. හරි හරි කමක් නෑ.

මම යෝජනාවක් කරනවා මේක නොදීම මත, මේ යශෝධා එන්ටර්ප්‍රයිසස් ආයතනය සතු ඉඩම නොදීම තුළින් මගෙන් වන්දියක් ඉල්ලලා ඇවිත් ඒ වන්දිය ගෙවීමට සිදු වුණොත් ඒක සභා අරමුදලින් ගෙවන්න කියලා.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම ඒක අවලංගු කරා. මම අවලංගු කරලා තියෙන නිසා පවරා ගැනීමටත් මමම යෝජනා කරන්නම් ඉතුරු ටික කරන්න.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඔබතුමා මේ ප්‍රශ්නය නිවැරදිව ඉදිරිපත් කරානේ. කරුණු කාරණා හරි. ඉදිරිපත් කරපු කරුණු කාරණා ගොනුවට අනුව හරි. මෙතන ප්‍රශ්නය වුණේ මේක 1991 දී පවරන්න කලින්, 1994 දී ගැසට් පත්‍රයකින් යශෝධා එන්ටර්ප්‍රයිසස් එකට පවරන්න කලින් මේක රජය සතු තුනී ලෑලි සංස්ථාව. රාජ්‍ය දේපලක්. එතකොට දැන් අපේ ප්‍රශ්නය වුණේ තිබ්බ්ච රාජ්‍ය දේපලක් වුණ මේක රජයට ලැබුණොත් ඒ ප්‍රදේශවල ඉඳපු ඉඩම් හිමියන්ගෙන් වෙන්න ඇති. ඒ මොහොතේ තිබුණ තත්ත්වය අනුව රටේ ප්‍රතිපත්තිමය තීන්දුවක් මත අඩු තරමේ අයිතිකාරයන්ට ගෙවන්නේ නැතුව වෙන්න ඇති පවර ගන්නේ. අපි ඒ කරපු පරිත්‍යාගයට සාධාරණය ඉෂ්ඨ කරන්න ඕන. මේක රාජ්‍ය දේපලක්ව තිබුණා. ඊට පස්සේ තමයි මේක රාජ්‍ය සමාගමක් බවට පරිවර්තනය කරන්නේ. එතනින් පස්සේ තමයි තීන්දු කරලා මේක පරිපාලනය කරගෙන යන්න බැරි නිසා පෞද්ගලික අංශයට පවරන්නේ. මේක කරපු ක්‍රමවේදය ඔබතුමා ඉදිරිපත් කරා නිවැරදිව. අපි කියන්නේ ඔබතුමා සද්භාවයෙන් පෙනී හිටින්න ඕන මේක ජනතාව සතු කරන්න ආපහු.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අනිවාර්යයෙන්ම. මෙහෙමයි අනිවාර්යයෙන්ම මම පෙනී ඉන්නවා. නාගරික සංවර්ධන අධිකාරිය එක්කත් අපි කතා කරා. එයාලට වුණත් කර ගන්න දෙයක් නෑ මේකේ. ඇත්ත කතාව ඒක. මේකේ සියලු කටයුතු නීත්‍යානුකූලව සිද්ධ වෙලා දැන් පුද්ගලික ඉඩමක් බවට පත් වෙලා තියෙන්නේ. දැන් නීත්‍යානුකූල විදියට ඉල්ලන්නේ. නමුත් මන්ත්‍රීතුමා අපි සභාවේ තීන්දු ගත්තත් වැඩක් නෑ. දේශපාලන අධිකාරියට දැන් හරි පුළුවන්. මේ සභාවේ තීරණය අදාළ වෙන්නේ නෑ. වර්තමාන දේශපාලන අධිකාරියට ගැසට් එකක් කරලා මේ කටයුත්ත සිද්ධ කරන්න පුළුවන්. ඒක හින්දා මම මගේ නියෝගයකින් ඒක අවලංගු කරා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඔබතුමා මේ ප්‍රශ්නයේදී අසරණයි. අපිට පුළුවන් සභාවක් හැටියට යෝජනා කරලා මේ ක්‍රියාවලියට මැදිහත් වෙන්න. අපේ මේ ප්‍රදේශයට තියෙන එකම රාජ්‍ය සම්පත මේක. ඉතා විශාල වටිනාකමක් තියෙනවා මේකට.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** සුගත් මන්ත්‍රීතුමාගේ යෝජනාව නීත්‍යානුකූල නම් ඒක හරි. ලියනගේ මන්ත්‍රීතුමාගේ යෝජනාවට වැඩිය මේකේ හොඳ යෝජනාවක් තියෙනවා. එතුමා කියන්නේ සභාවට පවරා ගන්න කියලා. මේක නැවත සභාවට පවරා ගන්න බෑ. පවරගන්න ඕන ආණ්ඩුවට. තුසිත මන්ත්‍රීතුමාගේ යෝජනාවේ තියෙනවා ඒක.

"ගිංතොට පිහිටි රජයට අයත්ව තිබූ තුනී ලෑලි සංස්ථාව පසුගිය රජය සමයේ ඉතා අඩු මුදලකට යසසිරි කස්තුරිආරච්චි මහතා වෙත විකුණා ඇත. එම කර්මාන්ත ශාලාව පිහිටි මෙම ඉඩම දැනට විකිණීමට සූදානමක් පවතින බව දැනගන්නට ලැබී ඇත. මෙම ප්‍රදේශයට ඇති එකම කර්මාන්ත ශාලාව වන මෙය විකිණීම ජාතික අපරාධයක් වන බැවින් මෙම කර්මාන්ත ශාලාව නැවත රජයට පවරා ගන්නා මෙන් යෝජනා කරමි" කියලා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා මෙතුමා ඉදිරිපත් කරලා තියෙන්නේ සභාවට පවරා ගන්න කියලා නෙමෙයි. මේක අත්පත් කර ගන්න කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එතුමා දැන් කිවුවේ සභාවට පවරා ගන්න කියලා නේ.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** අත්පත් කර ගන්න කියලා ලිඛිතව දීලා තියෙන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** දැන් කිවුවානේ සභාවට පවරා ගන්න කියලා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** මේ යෝජනාව තියෙනවා. මේ යෝජනාව කියවන්නකෝ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔය යෝජනා දෙකම එකයිනේ. මම කියන්නේ ඕන එකක්.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** මේක මේ එක එක්කෙනාගේ පෞද්ගලික දේ මත බෑ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** තර්ක නෙමෙයි. සභාව විදියට එකඟව මේ දෙකෙන් ඕන එකක්.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** මුළු සමස්ත සභාවටම මම කියන්නේ මෙහෙමයි. මේක සම්බන්ධව අදහසක් තියෙනවානේ. මෙතුමා නියෝජනය කරන්නේ ගිංතොට ප්‍රදේශය. මෙතුමත් දන්නවා, අපිත් දන්නවා මේකේ ඉතිහාසය. ඒ නිසා ඔබතුමා අසරණයි මේ ප්‍රශ්නයේදී නීත්‍යානුකූලභාවය ඉස්සරහ. සභාවක් හැටියට තීන්දුවක් ගමු. ඒ තීන්දුව ක්‍රියාවට නගන්න අපි සද්භාවයෙන් මැදිහත් වෙමු. ඒ වෙනුවෙන් අපි යෝජනා කරේ.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, ඇත්තටම තුනී ලෑලි සංස්ථාව කිවුවම මගේ කොට්ඨාශයේ තියෙන ඉඩමක්. ඒ ඉඩමේ අපි දන්න කාලයේ ඉඳලම මුළු ලංකාවේම ප්‍රසිද්ධ තුනී ලෑලි සංස්ථාවක් තිබුණා. නමුත් කවුරුහරි මේක කස්තුරිආරච්චි මහතාට දීලා තියෙනවානම් ඒකට අපේ විරෝධතාවය ප්‍රකාශ කරනවා. මේක ඇත්තටම රජයේ සේවකයෝ විශාල දෙනෙක් සේවය කරපු ස්ථානයක්. එවැනි ස්ථානයක් මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා හෝ කවුරු හෝ පෞද්ගලික මතයට දෙනවා නම් ඒකට අපේ දැඩි විරෝධතාවය ප්‍රකාශ කරනවා. අඩු ගාණේ එවැනි කර්මාන්ත ශාලාවක්, භූමියක් දෙනවානම් අඩු ගාණේ ඒ ප්‍රදේශයේ ප්‍රාදේශීය සභාවෙන් අහන්න ජනාධිපතිතුමා දැන ගන්න ඕන. නිකං හරි සභාවට යෝජනාවක් දාලා අහන්න ඕන. එහෙම නැතුව එක පාරටම මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා මේක දීපු එක වැරදියි. මේක ආයේ ගන්න පුළුවන්. බැරිකමක් නෑ. ගෝඨාභය මහතා කතාකරලා කිවුවා වරාය ගන්න ඕන කියලා. ගන්න පුළුවන්. ඒක නිසා අපි කියන්නේ මේක දීපු එක නැවත ගන්න අපිට. රජයට ගන්න. රජයට පවර ගන්න ඒ අයට බැරි නම්. වෙන කර්මාන්ත ශාලාවක් හදන්න පුළුවන් මේ ඉඩමේ. කර්මාන්තශාලා එකක් නෙමෙයි. කර්මාන්තශාලා විශාල ප්‍රමාණයක් හදන්න පුළුවන් මේ ඉඩමේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අනිත් එක මන්ත්‍රීතුමා ඒකත් කියන්න ඕන. මේක මම නැවතත් කියනවා. මේක දුන්නේ කිසිම ඉඩම් වෙන්දේසියකට නෙමෙයි. ඒ අයට ක්ලියරන්ස් ගන්න ඕන ඔය කැබැල්ලක් පවා වෙන කෙනෙකුට පවරනවානම්. සභාවෙන් ක්ලියරන්ස් ගන්න ඕන. ඒ අය මේක ගත්තේ ලෝන් එකකට.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, ඒ දවස්වල සුනාමි ව්‍යසනයට සම්පූර්ණයෙන්ම ගිංතොට මහා විද්‍යාලය කැඩුණු අවස්ථාවේ ඉස්කෝලේ හදන්න ඉල්ලුවට දුන්නේ නෑ ඒක. ගරු සභාපතිතුමනි, 2004 සුනාමි ආපු වෙලාවේ ගිංතොට මහා විද්‍යාලය හේදිලා යනකොටත් මේක ඉඩම් නැති නිසා ඉස්කෝලෙට ගන්න ඉල්ලීමක් කරාට දුන්නේ නෑ. දැනටත් ගිංතොට මහා විද්‍යාලයට පිට්ටනියක් නෑ. අඩුම ගාණේ ඒකේ පිට්ටනි කෑල්ලක් හරි හදන්න දෙන්න තිබුණා ඉස්කෝලෙට. ඒකේ පිට්ටනියක් හදලා ළමයින්ට සෙල්ලම් කරන්න ඒකේ කොටසක් දෙන්න පුළුවන්. ඒ නිසා අපි කියන්නේ මේක රජයට අරගෙන රජයේ කර්මාන්ත ශාලාවක් හදන්න. ඒ වගේ ප්‍රයෝජනයකට ගන්න. සභාවේ ඒකමතික තීන්දුවක් අරන් අපි යවමු.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** මේකේ යෝජනාවට මොකද වෙන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමා සභාවට කියනවානම් මම දන්නේ නෑ. මම දන්න මට්ටමින් නම් සභාවට බෑ.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** මගේ යෝජනාව සම්මත වුණා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** යෝජනාව සම්මත වූණේ නෑ. මම නම් කියන්නේ සභාවට පවරා ගන්න නම් මීට වැඩිය විධිමත් විදියට ගේන්න.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** සභාවට පවරා ගන්න කියලා නෑ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමා එහෙම කියලානේ යෝජනාව දාලා තියෙන්නේ.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** සාකච්ඡා කරලා තීන්දුවකට එන්න තමයි අත්පත් කර ගන්න කියලා දැම්මේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** හරි එතකොට ගැටළුව තියෙන්නේ ඔබතුමා කිව්වා සුගත් මන්ත්‍රීතුමා ගෙනල්ලා තියෙනවා කියලා මාස හයකට කලින් යෝජනාවක්. ඒ හින්දා මේක නීත්‍යානුකූල නෑ කිව්වා. එතකොට ඔබතුමාගේ ඒ යෝජනාව කරානම් හරි. ඔබතුමාගේ යෝජනාව ස්ථිර කරානම් හරි. සුගත් මන්ත්‍රීතුමාගේ යෝජනාව මාස හයකට කලින් ගෙනල්ලා තියෙනවානම් ඒක යවමු.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** එහෙනම් මේක දාපු එකත් වැරදියි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම කියන්නේ මන්ත්‍රීතුමා ඒක නෙමෙයි. මොකක් හරි යවන එක හරියට යවමු. ඔබතුමාගේ මේ යෝජනාවේ මොකක්ද තියෙන හරිකම. මොකක්ද කියන්න මේ යෝජනාවේ තියෙන හරිකම.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** මොකක්ද යෝජනාවේ තියෙන වරද කියන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමා හරියට කියන්නේ නෑ මොකක්ද කියලා. "ගිංතොට ප්ලයිවුඩ් ආයතනය සතු ඉඩම අත්පත් කර ගැනීමට යෝජනා කරමි." එච්චරයි.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** මේක සාකච්ඡා කරලා එක තීන්දුවක් ගන්න තියෙන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** පේනවාද යෝජනා දෙකක් දාන කොට තියෙන වෙනස. කටින් කියන්නේ එකක්. මෙතන කියන්නේ එකක්. කරුණාකරලා අනිත් දවසේ යෝජනා දානකොට හැම යෝජනාවක්ම මට දාලා දාන්න ඕන. හැම යෝජනාවක්ම මගේ අනුමැතිය අරන් තමයි දාන්න ඕන. ඕක මම අනිවාර්යයෙන්ම කරනවා. ඔබතුමාලා කියන්නේ එකක් යෝජනාව දාන කොට යෝජනා දෙකක් තියෙන කොට. මේ මන්ත්‍රීවරයා මෙතුමාට කියලා තියෙන්නේ සභාවට කියලා. දැනුත් කිව්වේ ඒකයි. අනිත් දවසේ මගේ අනුමැතිය නැතුව එක යෝජනාවක්වත් දාන්න බෑ.

හරි දැන් ඕන සභා තීන්දුවක් ගන්න. මේ සම්බන්ධව විධිමත් ඕන සභා තීන්දුවක් ගන්න. මගෙන් බාධාවක් නෑ.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා මෙහෙමයි. අපි මේක අත්පත් කර ගන්න කියලා යෝජනා කරන්නේ. මන්ත්‍රීවරු තුන්දෙනෙක් යෝජනා කරනවා. තුනම එක සේ සලකලා සභාවේ සියලුම මන්ත්‍රීවරු මන්ත්‍රීවරියන් සුදුසු විදියට නමින් මේ යෝජනාවට පක්ෂව ඡන්දය ලබා දෙන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම දන්නේ නෑ විධිමත් යෝජනාවක් මෙතන තියෙද්දි සංශෝධන වලට යන්න ඕන ඇයි කියලා. ඒක මට තේරෙන්නේ නෑ.

මේක බුද්ධිමත් මන්ත්‍රීවරුන්ගේ අවධානය පිණිසයි. වැරැද්දක් වෙලා තියෙනවා. එහෙමනම් යෝජනාව දාන්න ඕන සභාවට කියලා. නමුත් ඒ වැරැද්ද වෙලා තියෙනවා. මම ඒ වගකීම ගන්නවා. මේ සියලු මන්ත්‍රීවරුන්ගෙන් ඉල්ලා සිටිනවා. බුද්ධිමත් මන්ත්‍රීවරුන්ගෙන් ඉල්ලා සිටිනවා. මේ යෝජනා දෙකෙන් වඩාත්ම යැවීමට සුදුසු යෝජනාව මොකක්ද?.

"ගිංතොට ප්ලයිවුඩ් ආයතනය සතු භූමිය අත්පත් කර ගැනීමට යෝජනා කරමි." එකක්

"ගිංතොට පිහිටි රජයට අයත්ව තිබූ තුනී ලෑලි සංස්ථාව පසුගිය රජය සමයේ ඉතා අඩු මුදලකට යසසිරි කස්තුරිආරච්චි මහතා වෙත විකුණා ඇත. එම කර්මාන්ත ශාලාව පිහිටි මෙම ඉඩම දැනට විකිණීමට සූදානමක් පවතින බව දැනගන්නට ලැබී ඇත. මෙම ප්‍රදේශයට ඇති එකම කර්මාන්ත ශාලාව වන මෙය විකිණීම ජාතික අපරාධයක් වන බැවින් මෙම කර්මාන්ත ශාලාව නැවත රජයට පවරා ගන්නා මෙන් යෝජනා කරමි." එකක් මම අහන්නේ වඩාත්ම හොඳ, සාර්ථක යෝජනාව මොකක්ද?

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** සුගත් මන්ත්‍රීතුමාගේ යෝජනාවක් තියෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** දැන් ඕන ඔබතුමාට මේක දියාරු කරලා යවන්නද?. වැඩේ අවුල් කරන්නද ඕන.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** දියාරු කරන්න නෙමෙයි කියන්නේ. ගරු සභාපතිතුමා, අපි මේක දැනුම් දෙන කොට විධිමත්ව සැලසුම් සහගතව ලිපියක් හදලා නිවැරදිව ඒක යොමු කරන්න. මේක යෝජනාවක් නේ. යෝජනාවක් කරාම යෝජනාව යවන්නේ නෑනේ අපි. අපි යවන්නේ විධිමත්ව ලිපියකින්. ඒක හරියට කරන්න. මේ අදහසනේ ගන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** හරි. මම ඔය දෙකම යෝජනා කරනවා. ලියුමක් හදලා යැව්වහම හරිනේ. දෙකටම සභා තීන්දු ගන්නවා. මම ලියුමක් හදලා යවන්නම්.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මේ යෝජනාව මේවා කරන්න. මේක හොඳ යෝජනාවක්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම දැන් යෝජනාවක් නැවත කරන්නේ මොකටද?. අවශ්‍ය රජයට පවරා ගන්න නේ. ඒක මම හදලා යවන්නම්. මේක එක තීන්දුවක් වෙන්නෙත් නැත්නම්, ඔක්කොම එකතු කරලා එක යෝජනාවක් යවන්නත් බැරිනම් මොකක්ද මේ කියන්නේ. මොකක්ද මට මේ කියන්නේ කියලා කියන්නකෝ. ඒ පාර කලින් එකකුත් කියනවා. මෙතන දෙකකුත් කියනවා. ඔය තුනම එකතු කරලා එකක් හදන්න.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** ඔය තුනම එකතු කරලා සභාවේ යෝජනාවක් විදියට දාන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** හරි.

**ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, යෝජනා තුනේම තියෙන්නේ රජයට පවරා ගන්න කියලා. එක එක්කෙනාගේ මානසික තත්ත්වය අනුව, දක්ෂතාවය අනුව එක්කෙනෙක් ගලපලා දාලා තියෙනවා. එක්කෙනෙක් දාලා තියෙනවා රජයට පවරගන්න කියලා. මේකේ අදහස තියෙන්නේ එක අර්ථයයි. ඒ අර්ථය තමයි මේක රජයට පවරගන්න කියන එක. ඒ යෝජනාව කවුරුත් එකඟ වෙලා සභා සම්මත කර ගන්න.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, ගරු මන්ත්‍රීවරුනි මෙහෙමයි. මේකේ පෙර යෝජනාවක් සුගත් මන්ත්‍රීතුමාගේ තිබුණා. අපි ඒක කියවලා බැලුවා. ඒක හොඳයි. මේ අද දවසේ ඔබතුමාගේ යෝජනාව තියෙනවා. තුසිත මන්ත්‍රීතුමාගේ යෝජනාවකුත් තියෙනවා. නමුත්

මේකේ ගැටලුව ඇති වුණහම මේ යෝජනා තුනම අපි හොඳින් කියවලා බැලුවම මේ තුනේම යම් යම් අඩු පාඩු තියෙනවා. මේක ආසන්න යෝජනා හැටියට තමයි යෝජනා තුනම තියෙන්නේ. කාරණය ඒකයි. කාරණය ඒක වුණාට අපි මේ ලියුම යොමු කරන්නේ සභාවෙන් අතිගරු ජනාධිපතිතුමාට, ඉඩම් අධ්‍යක්ෂක ජනරාල්තුමාට. එතකොට මේ සභාවෙන් හොඳම යෝජනාව අපි යොමු කරන්න ඕන. ඒක අපේ කාර්යය වෙන්න ඕන. මේ කරුණු, ලිපි ලේඛන පරීක්ෂා කරලා මෙම ඉඩම, ගිංතොට තුනී ලෑලි සංස්ථාව පිහිටි භූමිය අහවල් දින අහවලාට, අහවලා විසින් විකුණා ඇත, අයිතිය පවරා ඇත. එහෙම එපැයි මේක එන්න ඕන. දිනයක් වකවානුවක් තියෙන්න ඕන. ඊගාවට ඒක අහවල් දින නැවත පවරා ගන්න සභාවෙන් අනුමැතිය ඉල්ලා ඇත. එහෙම දීර්ඝ විස්තරයක් සහිත යෝජනාවක් හදලා ඒ යෝජනාව සුදුසු පරිදි ඉදිරිපත් කරන්න වගකීම ලේකම්තුමාටයි, සභාපතිතුමාටයි පවරන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඕක මෙහෙම කරහම ඉවරයි. මේකට එකඟද?. නැත්නම් නැහැයි කියන්න. මම මේක අවලංගු කරපු විදිය කියන්නම්. අවලංගු කරන්න මිනිස්සුන්ගේ අත්සන් ලේඛනයක් ගත්තා. අත්සන් ලේඛන අරගෙන මහජන විරෝධතාවයක් ඉදිරිපත් වෙලා තියෙනවා මේක විකුණන්න යනවා කියලා. ඒක උඩ තමයි මේක අවලංගු කරේ. ඒක එක කාරණාවක් විදියට ගන්නම්. සභා තීන්දුව එක කාරණාවක් විදියට ගන්නම්. මේ දෙක හින්දා මේක රජයට අත්පත් කර ගන්න කියලා යවන්නම්. ඉතිං ඉවරයිනේ ඇති මන්ත්‍රීතුමා.

**ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා ඃ-** ඔබතුමා නීතිඥ උපදෙස් ගන්න. එතකොට වැඩේ ඉවරයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** හැබැයි මෙහෙමයි. මේක මම දන්න කාරණය නම් මේක මේ ලියුම් යවලා පවරා ගන්න කාලයට වඩා දේශපාලන අධිකාරියට පුළුවන් ඔය ගැසට් පත්‍රය අවලංගු කරන්න.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** ඒක තමයි සභාපතිතුමා කිවුවේ මේකේ ඉන්න සභාපතිතුමා, උප සභාපතිතුමා, මන්ත්‍රීවරුන්ට ඒකේ අයිතියක් තියෙනවා. ශක්තියක් තියෙනවා. මේක යෝජනා කරලා නමින් ගන්න කැමති කවුද කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** නමින් වැඩක් නෑ. ඒකමතිකව ඕන. මම ඕනනම් ඉතිං තවත් එකතු කරන්නම් අපිට ඕන ආදාහනාගාරයයි, කසළ පුච්චන මැෂිමයි ඔක්කොම එකට දෙන්න කියලා. හරි එහෙම නම් සභා තීන්දුවක් ගමු අපි මේක නවත්වපු හේතුත් දාලා. සභා තීන්දු තුනත් එකතු කරලා සියලු කාරණා එකට දාලා රජයට පවරා ගැනීමට කියන යෝජනාව කරනවා.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** යෝජනාව කරන්න ඕනද? ඔබතුමා යෝජනා කරනවාද?.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** සභාවට දාලා ගන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එතකොට තව මාසයක් යාවි හොඳේ. එතකොට කියාවි සභාපතිතුමා හිතුමතේ මාසයක් ප්‍රමාද කරා කියලා.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** සංශෝධන සහිතව ගන්න මේක රජයට පවර ගන්න කියලා.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** රජයට පවර ගන්න බෑ. අත්පත් කර ගැනීමක් තමයි කරන්න වෙන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක තමයි යෝජනා වුණේ සියලු අඩුපාඩුකම් හදලා යවන්න.

බෝපෙ පෝද්දල බල ප්‍රදේශය තුල ගිංතොට පිහිටි රජයට අයත්ව තිබූ තුනී ලෑලි සංස්ථාව පිහිටි භූමිය හා කර්මාන්ත ශාලාව පසුගිය රජය සමයේ ඉතා අඩු මුදලකට යසසිරි කස්තුරිආරච්චි මහතා වෙත විකුණා ඇත. එම කර්මාන්ත ශාලාව පිහිටි මෙම ඉඩම දැනට වෙන්දේසිකර විකිණීමට සූදානමක් පවතින බව දැනගන්නට ලැබී ඇත. මෙම ප්‍රදේශයට ඇති එකම කර්මාන්ත ශාලාව වන මෙම භූමිය වෙන්දේසිකර විකිණීම ජාතික අපරාධයක් වන බැවින් වෙනත් කර්මාන්තයකට හෝ වෙනත් සුදුසු කාර්යයක් සඳහා යෙදවීමට මෙම කර්මාන්ත ශාලාව පිහිටි භූමිය නැවත රජයට අත්පත් කරගන්නා ලෙස එම යෝජනාවට මම සංශෝධනයක් එකතු කරනවා.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** එම සංශෝධනය මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම සංශෝධිත යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමාගේ යෝජනා</u>**

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ- 21.** අප බල ප්‍රදේශයේ සිදුකරන සියලුම වෙන්දේසි ඉඩම් සංවර්ධනය කිරීමේදී ළිං ජලය ලබාදීම තහනම් කර ඒ වෙනුවට නල ජලය ලබාදීම අනිවාර්යය කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** බැනේ. එතකොට නල ජලය දෙනකන් මුකුත් කරන්න බැ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මේ යෝජනාව ගරු සභාපතිතුමා අපි කලිනුත් ගෙනල්ලා තියෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කලිනුත් ගෙනල්ලා තියෙනවා. නමුත් ප්‍රායෝගික නෑ. ඉඩම් වෙන්දේසි කරන එක නවත්වන්න ඕන.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඒකට ආධාරකයක් විදියට තමයි අපි කියලා තියෙන්නේ ඇස්තමේන්තුවක් අරගෙන මුදල් මෙහේ තැන්පත් කරන්න කියලා. නැත්නම් අපිටයි දෙන්න වෙන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඇස්තමේන්තුවක් දෙන්නේ නැනේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඇස්තමේන්තුවක් ගන්න ඕන. ආයතනයත් එක්ක කතා කරන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඇස්තමේන්තු දෙන්නේ නෑ. මම කතා කරා. විජේසිංහ මන්ත්‍රීතුමාට කියන්න කියන්නකෝ දෙනවද කියලා. එහෙම දෙන්නේ නෑ.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, මට තියෙන ගැටළුව මේකට වතුර දෙන්න සල්ලි ටික කොහෙන්ද කියන එක නෙමෙයි. මොකක් හරි ආණ්ඩුවකින් වතුර ටික පස්සේ හරි දෙන්න පුළුවන්. නමුත් කරන්නේ කොහෙන් හරි ළිඳක් කපලා වතුර දෙන එක. ඒ ජලයේ ප්‍රමිතියක් නෑ. ඒ ළිඳෙන් නෙමෙයි වෙන කොහෙන් හරි වතුර ටික ගෙනියලා ප්‍රමිතිය සනාථ කර ගෙන වතුර ටික දෙනවා. ඒ නිසා මම යෝජනා කරනවා එහෙම ජලය ලබා දෙන කොට සභාවේ මන්ත්‍රී මණ්ඩලයක් පත් කරලා, ඒ ජල සාම්පලය ගන්න කොට අපිත් ගිහිල්ලා ඒ ළිඳෙන්ම ජලය ලබා ගන්න වැඩපිළිවෙලක් හදන්න කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔව් ඒක කමක් නෑ.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** වෙන කොහෙන් හරි වතුර ගෙනල්ලා තමයි පාස් කර ගන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එහෙමනම් තාක්ෂණ නිලධාරි හා ආදාළ කොට්ඨාශයේ මන්ත්‍රීවරයා පත් කරමු.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** ඒ කාර්යය තාක්ෂණික සේවා කමිටුව කරන්න ඕන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කවුද යන්නේ තාක්ෂණ කමිටුවේ. ඕක යනවාද?

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** සියලු මන්ත්‍රීවරු දැනුවත් කරන්න. කැමති අයට එන්න කියන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** ඒක කර කර ඉන්න පුළුවන්ද අබේසේකර මන්ත්‍රීතුමා. මන්ත්‍රීවරු 22 ක් දැනුවත් කරන්නේ කොහොමද වතුර එකක් ගන්න. අදාළ කොට්ඨාශයේ මන්ත්‍රීවරයා දැනුවත් කරමු.

**ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා :-** ගරු සභාපතිතුමා මේ වතුර එකේ සාම්පල් එක චෙක් කර ගන්න දැඩි උනන්දුවක් තියෙන්නේ වෙන්දේසිකරුවට. ඒක නිසා මෙහෙන් නියෝගයක් දාන්න තාක්ෂණ කමිටුවේ කවුරු හරි කතා කරලා මෙන්න මෙයා අරගෙන ගිහිල්ලා වැඩේ කර ගන්න කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** මමත් සහභාගි වෙන්නම්. මමයි අදාළ කොට්ඨාශයේ මන්ත්‍රීවරයයි, තාක්ෂණ නිලධාරිවරයයි යන්නම්.

**ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා :-** ඒ වගේ එකක් කපුහෙම්පල කරලා තියෙනවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා :-** කපුහෙම්පල එකේ එක වහාම වෙනස් කරන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** අප බල ප්‍රදේශයේ සිදුකරන සියලුම වෙන්දේසි ඉඩම් සංවර්ධනය කිරීමේදී ළිං ජලය හෝ නල ළිං ජලය ලබා දීමට අදහස් කරනවා නම් අදාළ කොට්ඨාශය භාර තාක්ෂණ නිලධාරි, අදාළ කොට්ඨාශය නියෝජනය කරන ගරු මන්ත්‍රීවරයා හා ගරු සභාපතිතුමාගේ අධීක්ෂණය යටතේ එම ජල සාම්පලය ලබා ගැනීමේ තැන සිට පරීක්ෂණ වාර්තාව ලබා ගැනීම දක්වා කටයුතු සිදු කිරීම අනිවාර්ය කරන ලෙස එම යෝජනාවට මම සංශෝධනයක් එකතු කරනවා.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා :-** එම සංශෝධනය මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** එම සංශෝධිත යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා :- 22.** මුලන අංක 16 නිවස ඉදිරිපිට මාර්ගයේ කොටසක් සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා :-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා :- 23.** නරාවල මාටින් පෙරේරා මාවතේ කපිල මහතාගේ නිවස ඉදිරියේ ඇති බෝක්කුව සහ ජලය බැසයන පිටවාන සැකසීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රිනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය :-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා :- 24.** මුලන මංජු මහතාගේ නිවස අසල මාර්ගය සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා :-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා :- 25.** පන්විල කැන්දගහ වත්ත මාර්ගය සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා :-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා :- 26.** කාසල්හිල් වත්තේ කනත්ත මාර්ගය තාර දමා සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා :-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ- 27.** කාසල්හිල් වත්තේ නො. 265 නිවස අසලින් ඇති කාණුව සකස්කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ- 28.** කාසල්හිල් වත්තේ ශාමලී මහත්මියගේ නිවසට මායිම්ව ඇති කාණුව සකස් කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ- 29.** මුලන මල්ලිකා මහත්මියගේ නිවස අසල සිට වැලි හන්දිය දක්වා මාර්ගය දෙපස කාණු සකස් කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රීනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ- 30.** කාසල්හිල් වත්ත ගීතානි මහත්මියගේ නිවස අසල මාර්ගය සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ- 31.** පන්විල දෙණිය වත්ත විල්බට් මහතාගේ නිවස හරහා ඇති පිටවාන සැකසීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ- 32.** නරාවල සිට්‍රුස් හන්දිය ආශ්‍රිත ප්‍රදේශ වැසි ජලයෙන් යටවීම වැළැක්වීම සඳහා සිට්‍රුස් හන්දිය පාලම පළල් කිරීමටත්, බෝක්කුව සඳහා පෙට්ටි බෝක්කු යෙදීමටත්, සිට්‍රුස් හන්දිය ප්‍රධාන මාර්ගයේ බෝක්කු දක්වා කාණු පද්ධතිය පළල්කර පිරිසිදුකර විධිමත්ව සකස් කිරීමටත් යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක පළාත් මාර්ග සංවර්ධන අධිකාරියට නේද අයිති.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** බෝක්කු ටික පළාත් මාර්ග සංවර්ධන අධිකාරියට අයිති.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක පළාත් මාර්ග සංවර්ධන අධිකාරියට යන්න ඕන.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** කොට්ඨාශයේ පොඩ්ඩයි මේ යෝජනා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

<u>ගරු මන්ත්‍රී ඩබ්.පී. චමින්ද මැතිතුමාගේ යෝජනා</u>

**ගරු මන්ත්‍රී ඩබ්.පී. චමින්ද මැතිතුමා ඃ- 33.** පන්නමග මාර්ගය කුඩාවෙල්ල පිවිසුම් මාර්ගයේ සිට සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී ඩබ්.පී. චමින්ද මැතිතුමා ඃ-** දැනට තාර දමා තිබෙන්නේ. ඒක නැවත තාර දමා සකස් කිරීමට යෝජනා කරේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ඩබ්.පී. චමින්ද මැතිතුමා ඃ- 34.** ගොඩපරගහවත්ත මාර්ගය සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ඩබ්.පී. චමින්ද මැතිතුමා ඃ- 35.** පෝද්දල, මිල්ලගහවත්ත මාර්ගය සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ඩබ්.පී. චමින්ද මැතිතුමා ඃ- 36.** ජනගහනය වැඩිවීමක් මේ ප්‍රදේශය තුල දක්නට ලැබෙන බැවින් ජනතා අවශ්‍යතාවය අනුව ගලි බවුසරයක් මිලදී ගැනීම සඳහා යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

<u>ගරු මන්ත්‍රී යූ.එල්.තුසිත චාමින්ද මැතිතුමාගේ යෝජනා</u>

**ගරු මන්ත්‍රී යූ.එල්.තුසිත චාමින්ද මැතිතුමා ඃ- 37.** දූවවත්ත මාර්ගයේ ඇති බැම්ම සහ මාර්ගය සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රීනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී යූ.එල්.තුසිත චාමින්ද මැතිතුමා ඃ- 38.** බන්දුසේන වීරක්කොඩි මහතාගේ නිවසට යන මාර්ගය සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රීනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

ඒ පාරේ පොඩි ගැටළුවක් තියෙනවා. හවුල් ඉඩමක නඩුවක් තියෙනවා. ඒ නඩුවේ තීන්දුව ලැබිලා මැනලා තියෙනවා වෙන් කරන්න. මමත් ඒ යෝජනාව කලින් දාලා මුදලුත් පාස් වෙලා පස්සේ නැවැත්වුවා ඒ නඩුව නිසා. මම හිතන්නේ ඒ යෝජනාවට නම් ටිකක් කල් යයි පාර හදන එකට. මම ගොඩක් සතුටු වෙනවා මට වෙන් වෙච්ච මුදලින් ඒක කරගන්න බැරි වුණ එකට. ඒක ආපස්සට ගියා සංශෝධනයක් වෙලා. ගොඩක් සතුටු වෙනවා අවුරුදු ගාණක් තිස්සේ පාරක් නැතුවම තිබුණ කොටසක් මේ. දූව වත්ත දක්වාම සංවර්ධනය කරන්න සංශෝධනය වුණා නම් හොඳයි කියලා හිතෙනවා. දැන් මේකේ තියෙන්නේ බන්දුසේන වීරක්කොඩි මහතාගේ නිවසට යන මාර්ගය සංවර්ධනය කිරීමට නේ. ඒ යෝජනාව දාන්න වක්වැල්ලේ සිට කැටදූව හරහා මහලදූවට යන මාර්ගය කියලා. එහෙම දැම්මා නම් වඩා සුදුසුයි කියලා මම හිතනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී යූ.එල්.තුසිත චාමින්ද මැතිතුමා ඃ- 39.** උක්වත්ත, පරණවත්ත, අද්දරවත්ත මාර්ගය සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රීනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

( ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා සභා ගර්භයෙන් පිටවීම සිදුවිය.)

**ගරු මන්ත්‍රී යූ.එල්.තුසිත චාමින්ද මැතිතුමා ඃ- 40.** උක්වත්ත, දීගොඩ, වැවේවත්ත මාර්ගය තාර දමා සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රීනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී යූ.එල්.තුසිත චාමින්ද මැතිතුමා ඃ- 41.** කම්මලවත්ත මාර්ගය සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රීනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී යූ.එල්.තුසිත චාමින්ද මැතිතුමා ඃ-** අංක 42 යෝජනාව මම ඉල්ලා අස්කර ගන්නවා.

<u>ගරු මන්ත්‍රී එන්.එම්.අනිල් බන්දුතිලක මැතිතුමාගේ යෝජනා</u>

**ගරු මන්ත්‍රී එන්.එම්.අනිල් බන්දුතිලක මැතිතුමා ඃ- 43.** කපුහෙම්පල නන්දිමිත්‍ර විද්‍යාලයේ ඉඩම අවසතුවීම සම්බන්ධයෙන් මෙතෙක් පැවති පරීක්ෂණවල අවසන් තීරණය කුමක්දැයි සහ ඒ සඳහා ප්‍රාදේශීය සභාව ගන්නා තීරණය කුමක්දැයි පැහැදිලි කරන ලෙස යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී එන්.එම්.අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** මම මේ යෝජනාව ඉදිරිපත් කරන්නේ මීට කලින් තිබුණ සභා වාරය අවසානයේදී ලේකම්තුමා විසින් කිවුවා නන්දිමිත්‍ර විද්‍යාලය සම්බන්ධ ඉඩම නැවත අශෝක කුලරත්න කියන පුද්ගලයාට ලබා දෙන්න කියලා සභාව දැනුවත් කරලා තියෙනවා කියලා. මට දැන ගන්න ඕන මේක ගැන සභාවේ තීරණය කුමක්ද? ඒ සඳහා ඒක දෙන්න වෙලා තියෙන්නේ කොහොමද කියන එක තමයි දැන ගන්න ඕන.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා, අපි විශේෂයෙන්ම කියන්න ඕන නන්දිමිත්‍ර විද්‍යාලය පිළිබඳව. ඒක අවසතු කිරීමේ වැරදි ක්‍රමය පිළිබඳව කවුරුත් ඉන්නේ එක තැනක, එක මතයක. විශේෂයෙන්ම ස්තුති කරන්න ඕන අපේ වැවිලි කර්මාන්ත අමාත්‍ය රමේෂ් පතිරණ මැතිතුමා පහුගිය දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේදී මේ පිළිබඳව යෝජනා ගෙනැල්ලා තියෙනවා මම දන්න ආකාරයට. මම හිතන්නේ මේක ඉතාම වැදගත් දෙයක්. එතුමා දැන් ඇමතිවරයෙක්. ඒ වගේම එතුමාගේ තාත්තා මේක රැකගෙන ආපු දෙයක්. ඒ නිසා ගරු සභාපතිතුමනි ඔබතුමා මේ පිළිබඳව විශේෂ අවධානයක් යොමු කරලා මේකේ තත්ත්වය ටිකක් පැහැදිලි කිරීමක් කරන්න. ඒ කරන අතරේ මේ පිළිබඳව මැදිහත් වෙන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** දැන් මෙහෙමයි. මේකට දැන් නඩු දෙකක් දැම්මා. නඩු දෙකම ඉවරයි. ඒ පාර තමයි අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවෙන් පරීක්ෂණයක් ඉල්ලලා දැම්මේ. ඒකටත් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවෙන් නැවත එවලා තියෙනවා මේකට නඩු නිමිත්තක් නෑ කියලා. නීතිපතිගෙන් උපදෙස් පැතුවා. නීතිපති අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට එවලා තියෙනවා නඩු නිමිත්තක් නෑ මේක මෙතනින් එහාට පුද්ගලික ඉඩමක් කියලා. ඒක එවලා තියෙනවා. ඒක තමයි තත්ත්වය.

රමේෂ් පතිරණ ඇමතිතුමා කියලා තියෙනවා ඒක පවර ගන්නවා කියලා. ඒක ගැසට් පත්‍රයකින් අවලංගු වෙන්න ඕන. එතකන් ටිකක් බලන් ඉන්නවා.

**ගරු මන්ත්‍රී එන්.එම්.අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** අපරාධ පරීක්ෂණ එකෙන් එවපු ඒ ලියුම සභාවේ අපිට ඉදිරිපත් කරන්න එපැයි. අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවෙන් එවලා තියෙනවාද එහෙම දෙයක්. ඒක අපිට ලැබෙන්න එපැයි. අපිනේ ඒ සම්බන්ධව ඉන්නේ. අපි දැනුවත් වෙන්න එපැයි ඒ ඉඩමට මොකක්ද වෙන්නේ කියන එක ගැන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මේ පිළිබඳව නොදන්න මන්ත්‍රීවරු ඉන්නවා. ඒ පිළිබඳව දැනුවත් කරන්න ඕන. මේ කපුහෙම්පල නන්දිමිත්‍ර විද්‍යාලයේ ඉඩම අවසතු කිරීම පිළිබඳ ප්‍රශ්නය. නැත්නම් මමත් මේක වෙන්දේසි කරන්න නැවත දුන්නා කියන එක තමයි කියන්නේ අන්තිමට. මේකට මම එන්නත් කලින් සංවර්ධන බලපත්‍රය දීලා තියෙනවා.

**ගරු මන්ත්‍රී එන්.එම්.අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** සභාපතිතුමාට ස්තුතිවන්ත වෙනවා. ඔබතුමා මේකේ සභාපති වුණාට පස්සේ මේ ඉඩම අත්පත් කර ගන්න ආපු හැම වෙලාවකම මැදිහත් වෙලා ඒක නතර කරපු එකට.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔව් එහෙම නතර කරා. නතර කරපු හේතුව විදියට අපි දැක්වුයේ මේ අහවල් නඩුව ඉවර වෙනකන් කියලා. එහෙම තමයි නැවැත්වුයේ. ඊට පස්සේ නඩු දෙකම නිශ්ප්‍රභා වුණා. දාපු නඩු දෙකම අයින් කරා. එතකොට දෙන්න ඕන තත්ත්වයක් තමයි තිබුණේ. ඒක උඩ තමයි මම නැවැත්වුයේ. මම නීතිඥතුමා එක්කත් කතා කරාම ඒකට පොඩි අවස්ථාවක් තිබුණා. නැවත ඒ පාර අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවෙන් ඉල්ලීමක් කරා මේක පිළිබඳව වර්තමාන තත්ත්වය දෙන්න කියලා. ඒ අය 2019-08-19 දින ලියුමක් එවුවා අපිට ඒක නීතිපති දෙපාර්තමේන්තුවට යොමු කරයි කියලා.

ඒ පාර මගෙන් මිලියන 100 ක් වන්දි ඉල්ලලා එවුවා හිතාමතා මේක පැහැර හරිනවා කියලා අශෝක කුලරත්න කියන අයිති කෙනා. එන්තරවාසියක් එවුවා. ඒ පාර මම කිව්වා මේක අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට යවලා තියෙන්නේ කියලා. ඊට පස්සේ මිලියන 200 ක් වන්දි ඉල්ලලා එවුවා. ඒ පාර මම නැවත දැම්මා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට යොමු කරලා තියෙනවා. ඒකෙන් ඒක නීතිපති වෙත යොමු කරලා තියෙනවා ඒ උත්තරය ආවම ඉදිරි කටයුතු කරන්නම් කියලා. දැනට උත්තරය ඇවිල්ලා තියෙනවා.

- කපුහෙම්පල නන්දිමිත්‍ර විද්‍යාලයට අයත් භූමිය අවසතු කිරීමේ ප්‍රශ්නය පිළිබඳව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් සභාව දැනුවත් කරන ලද ලිපිය සභාගත කරන ලදී.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේනේ. අල්ලස් හා දූෂණ එකෙත් පරීක්ෂණයක් යනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක ගැන අපිට දැනුම් දීමක් මුකුත් කරලා නෑ. ඔන්න ඕකයි තත්වය.

**ගරු මන්ත්‍රී එන්.එම්.අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** මට කියන්න තියෙන්නේ මෙහෙමයි. මේක ගැන ඇත්තටම ගරු සභාපතිතුමනි, ඔබතුමා හා මේ මන්ත්‍රීවරු සියලු දෙනා ඒ ඉඩමට ගියාට පස්සේ දැක්කා ඇත්තටම මේක මංකොල්ලාකෑමක් තමයි. කලින් කතා වුණ ගිංතොට ප්ලයිවුඩ් එකේ ඉඩම වගේම තමයි. හිටපු ජනාධිපති, වර්තමාන අගමැති මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ කාලේ අති විශේෂ ගැසට් එකකින් මේ ඉඩම අහවල් පුද්ගලයාට පවරලා තියෙනවා. හිටපු ඉඩම් ඇමති ජනක බණ්ඩාර තෙන්නකෝන් මහතා ඒක අත්සන් කරලා තියෙනවා. එතුමා දන්නේ නෑ මේ ඉඩම කොහේද තියෙන්නේ කියලවත්. ප්‍රශ්නය තියෙන්නේ මේක දැන් ගිය ආණ්ඩුවෙන් නීතිපති දෙපාර්තමේන්තුව හරහා හෝ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව හරහා රැකගෙන හිටියට අර බලයත් එක්ක මේක පෙරලිලා ආවම ඒ අයගේ ගනුදෙනු විදියටම බේර ගන්නවා ඒ ගොල්ලෝ. ඇවිල්ලා සතියක් යන්න කලින් ඒ ගනුදෙනු ටික බේර ගන්නවා. හැබැයි මම විශ්වාස කරනවා අබේසේකර මන්ත්‍රීතුමා කියපු විදියට අපේ ගරු අමාත්‍යතුමා කිව්වා කියලා. එතුමාගේ විශ්වාසය උඩ තවදුරටත් විශ්වාසය තියලා තියෙනවා නැවතත් මේක රජයට අත්පත් කරගෙන නැවත පාසලට ලබා දෙයි කියලා. එහෙම නොවුණොත් අපි හිතනවා අර මෛත්‍රීපාල සිරිසේන මහත්තයා ගිංතොට ඉඩම දුන්නා වගේ මහින්ද රාජපක්ෂ මහත්මයා කපුහෙම්පල ඉඩම ගජ මිතුරෙකුට දුන්නා කියන බලාපොරොත්තුව තමයි අපිට කියන්න තියෙන්නේ ඒ හරහා වෙච්ච සිදු වීමක් නිසා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අමාත්‍යතුමා කිව්වා අපි එතකම් බලාගෙන ඉමු.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, ඔබතුමාගේ දැන ගැනීමටයි මේවා කියන්නේ. කපුහෙම්පල නන්දිමිත්‍ර විද්‍යාලයේ විදුහල්පතිතුමත්, උපුල් ගොඩගේ මැතිතුමත්, ඒ

වගේම අජිත් අතුකෝරල මැතිතුමත් අල්ලස් හා දූෂණ කොමිෂන් සභාවේ දැනට මාස හතරකට විතර උඩ්දී පැමිණිල්ලක් කරලා ඒකේ පරීක්ෂණ යනවා. බොහොම පැහැදිලිවම ඒකේ පරීක්ෂණය යනවා. ඉතිං ඒ වගේම ඒක යන බව ඔබතුමාව දැනුවත් කරන්නේ වෙන දෙයක් නිසා නෙමෙයි මේක ආවොත් ඒ අයව දැනුවත් කරන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අබේසේකර මන්ත්‍රීතුමා මෙහෙමයි දැන් මේක නවත්වන්න පුළුවන් මට්ටමේ නෑ. මේකේ සියල්ල ගිහිල්ලා තියෙන්නේ. එකම දෙයයි මම බලාපොරොත්තු වෙන්නේ. රමේෂ් පතිරණ මැතිතුමා මට කියනකම් මම අවසර දෙන්නේ නෑ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඒ ඇති.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එතකම් මම නවත්තගෙන ඉන්නවා. හැබැයි මොකක් හරි ගැටළුවක් වුණොත් වන්දියක් ගෙවන්න වුණොත් මේක සභා අරමුදලින් ගෙවන්න ඕන. අන්තිමට ඔය කවුරුත් නිදහස් වෙයි. කාංචනා කියලා නීතිඥවරියක් හරහා එවලා තියෙනවා මිලියන 100 ක් ඉල්ලලා. ඒක නොදුන්නම මිලියන 200 ක් ඉල්ලලා එවලා තියෙනවා. මේවා ගෙවන්න නම් මට පුද්ගලික හැකියාවක් නෑ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මුළු සභාවම වගකියන්න ඕන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔව් ඒක මම දැනටත් යෝජනා කරනවා ගැටළුවක් වුණොත් සභා අරමුදලින් ගෙවන්න ඕන.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, මේ පිළිබඳව දේවල් වාර්තාවේ සටහන් විය යුතුයි. අපේ ගරු රමේෂ් පතිරණ ඇමතිතුමාගෙන් වුණත් අපි ඉල්ලා සිටිනවා. ඔබතුමා ඇතුළු සියලු මන්ත්‍රීවරු දැනුවත් කරන්න බොහොම පැහැදිලිවම මේ ඉඩම පවරා ගැනීමක් නෙමෙයි කරන්න ඕන. මේකේ දූෂණයක් වෙලා තියෙනවා සභාපතිතුමනි. තමන්ට අයිති නැති දෙයක් තමයි තුන්වෙනි පාර්ශවයකට පවරලා තියෙන්නේ. කුලරත්න කියන කෙනාට අයිතියක් නෑ. එහෙම නම් පවරන්න ඕන සුදිරුක්කු ජයවික්‍රම මැතිතුමාට හරි විදිය නම්. එහෙම නෙමෙයි කරලා තියෙන්නේ. මේක දූෂණයක්. ඒ නිසා අල්ලස් හා දූෂණ එකේ මේ පිළිබඳව පරීක්ෂණයක් යනවා. ඊළඟට ගරු සභාපතිතුමනි මේක දැන් පවරා ගැනීමට ගියොත් රමේෂ් පතිරණ මැතිතුමා දැනුවත් කරන්න ඕන අපි කට්ටිය ඔක්කොම ගිහින් හරි මේ වැඩේ කරන්න ඕන විදිය. පවරා ගැනීමක් කරොත් වෙන්නේ නැවතත් අශෝක කුලරත්නට ගෙවනවා වාණිජ වටිනාකමට. වෙළඳ වටිනාකමට ගෙවන්නේ. නිකම්ම ගෙවන්නේ නෑ. මේ කොහේවත් හිටපු තක්කඩියාට යනවා මේක. ඒ නිසා ඔබතුමා මේවා ගැන රමේෂ් පතිරණ මැතිතුමාව දැනුවත් කරන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ- 44.** 2020 වර්ෂය සඳහා ප්‍රාදේශීය සභාව විසින් පවත්වාගෙන යන පෙර පාසල් දෙකෙහි ළමුන්ගේ නිල ඇඳුම් ලබාදෙන ලෙස යෝජනා කරමි.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** ඒකට සභාපතිතුමා එකඟ වුණා ලබා දෙනවා කියලා මේ වර්ෂයේදී.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒ නිල ඇඳුම් වලට මිල ගණන් කැඳවලා තියෙන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ- 45.** වැලිපත මංසන්ධියෙන් හැරී කපුහෙම්පලට යන මාර්ගයේ මීටර් 100ක පමණ දුරින් නැවත ගොඩදූව මාර්ගයට වැටෙන ඇල්හේනවත්ත මාර්ගයේ ඇති ගස්වල අතු ඉතා විශාල ලෙස මාර්ගයට නැමී ඇති බැවින් එම අතු කපා ඉවත්කරන ලෙස යෝජනා කරමි.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** ගියපාර කපුහෙම්පල මාර්ග සුද්ධ කරන්න කම්කරුවන් යොදවපු වෙලාවේ මාර්ගයේ දෙපස ශුද්ධ කරා. ගස්වල අතුකපන්න බෑ කිව්වා ඒ අයට.

විශාල ගස් ප්‍රමාණයක් තියෙනවා. රාත්‍රී කාලයේ ඉතා කලුවරයි. මේකේ වීදි ලාම්පුවක්වත් දාන්න විදියක් නෑ. විදුලි රැහැන් කණු තියෙන්නේ වෙල මැදින්. මාර්ගයේ අයිනේ දෙපස ඉඩ නැති නිසා එහෙම කරලා තියෙන්නේ. ගස් ටික කපලා හරි දෙන්න. වංගුවේදි එන වාහනයක්වත් පේන්නේ නැහැ. ඒක සභාවේ කාටහරි කපන්න බැරිනම් මම යෝජනා කරනවා වෙනත් මාර්ගයකින් හරි ඒ ගස් වල අතු කපලා ඉවත් කරලා දෙන්න කියලා.

ඒ වගේම මහ කැන්නදුව පාර සම්බන්ධව නඩු තීන්දුව ඇවිල්ලා තියෙනවා. ඒකෙ පිටපත මම මේ වෙලාවේ ගරු සභාපතිතුමාට ඉදිරිපත් කරනවා. ඒ සම්බන්ධව හොයා බලන්න. මීට මාස හතරකට විතර උඩදී මම ඒ යෝජනාව ඉදිරිපත් කරා. ඒ පාර සභාවට පවරා ගෙන සංවර්ධනය කරලා දෙන්න කියලා ඒ ලැබුණ නඩු තීන්දුවේ පිටපතක් ලබා දුන්නේ. උප සභාපතිතුමාගෙනුත් මම ඉල්ලනවා මේ සම්බන්ධව අවධානය යොමු කරන්න කියලා. ඒ පාර සම්බන්ධව එතුමා ඊට කලින් කොටසක් නිම කරලා තියෙනවා. මැදින් තියෙන පාර අයිනෙන් අරගෙන හරි, ඊළඟට පාවිච්චි කරන පාර සභාවට පවරාගෙන හරි සංවර්ධනය කරලා දෙන්න. දැනට පාවිච්චි කරන පාර සංවර්ධනය කරලා දෙන්න තමයි නඩු තීන්දුවේ තියෙන්නේ.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, අපේ අනිල් මන්ත්‍රීතුමා මතුකරපු අවසාන යෝජනාව ගැන කතා කරන්නේ. මාර්ගවල තියෙන ගස්වල අතු කැපීම සම්බන්ධයෙන් බෝපෙ පෝද්දල බල ප්‍රදේශය පුරාවටම මේ ප්‍රශ්න තියෙනවා. නරාවල පැත්තේ ගොඩක්ම තියෙනවා. පාරවල් වලට අව්ව වත් වැටෙන්නේ නෑ. පාරවල්වල ආයුකාලය අඩු වෙනවා ඒකෙන්. තෙත ගතිය නිසා පාරවල් වල පැවැත්ම අඩු වෙනවා. ඒ නිසා සභාවේ කම්කරු මහත්වරු දාලා කරන්න බැරිනම් කුලී පදනම මත අරගෙන හරි ක්‍රමවේදයකට කරන්න. විදුලිබල මණ්ඩලය කරන ක්‍රමවේදයට හරි කරන්න. මේ ගස් වල පාරට තියෙන අතු ටික කපන්න. ඉර අව්ව වත් වැටෙන්න පාරට.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** මතු වෙච්ච යෝජනාව පිළිබඳව අදහස් දක්වන්නේ. අර මාර්ග වලට වැවී ඇති ගස් වල අතු ඉවත් කිරීමේ ගැටළුවක් තියෙනවා. මේ සඳහා විසඳුමක් විදියට මීට අවුරුද්දකට ඉහත සභාවකදී යෝජනාවක් සම්මත කර ගත්තා. මා විසින් යෝජනා කරා මේකට අර කොකු පිහියක් / වක් පිහියක් අමුණන ලද කොක්කක් නිෂ්පාදනය කරගෙන ඒ මගින් යම් උසක් දක්වා, අඩි 10 ක් විතර උසට හරි කුඩා අතු හෝ ඉවත් කරන්න කටයුතු කරන්න කියලා. කීප අවස්ථාවකදීම මතක් කරා. නමුත් ඒ සඳහා ඒ උපකරණ දෙකක් හදා ගන්න බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාවට අද දවස වෙනකම් නොහැකි වුණා. ඒකට මගේ දැඩි අප්‍රසාදය මේ මොහොතේ පල කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඉතිං බැනර් කපන වක් පිහි තියෙනවානේ මන්ත්‍රීතුමා.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** බැනර් කපන එකෙන් බෑ සභාපතිතුමා. ඒක ශක්තිමත් මදි. අර වක් පිහිය අඟලේ විතර යකඩ බටයකට තමයි පාස්සන්නේ. එතකොට ශක්තිමත් නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>ගරු මන්ත්‍රී ජේ.ඒ.චන්ද්‍රකුමාර මැතිතුමාගේ යෝජනා</u>**

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ- 46.** රත්නගිරිවත්ත ව්‍යාපෘති මාර්ගය දෙපස කාණු එක්ස්කැවේටර් යන්ත්‍රයක් යොදාගෙන කැපීමට යෝජනා කරමි.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>(ඊ) කාරක සභාවල වාර්තා</u>**

**<u>01. මුදල් සහ ප්‍රතිපත්ති සැකසුම් කමිටුව.</u>**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ- I.** 2019.11.27 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති සැකසුම් කමිටු වාර්තාව.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** අපි කමිටු තීරණ වලට විරුද්ධයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එහෙම නම් 2019-11-27 දින පැවති මුදල් ප්‍රතිපත්ති හා සැකසුම් කමිටු වාර්තාව සම්මත කිරීම සඳහා බෙදීමකට යනවා.

ඉන්පසු ඡන්ද විමසීම ආරම්භ වූ අතර ඡන්දයේ ප්‍රතිඵලය පහත පරිදි විය.

පක්ෂව - 13
විපක්ෂව - 05
ඡන්දය ලබා දීමෙන් වැළකී සිටි - 03
සභා ගර්භයේ රැඳී නොසිටි - 01

**2019-11-27 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති සැකසුම් කමිටු වාර්තාව සම්මත කිරීම සඳහා පක්ෂව ඡන්දය ලබා දුන් පිරිස**

01. ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා
02. ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා
03. ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා
04. ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා
05. ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා
06. ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා
07. ගරු මන්ත්‍රීනි එම්. ගයාත්‍රි කාංචනා මැතිණිය
08. ගරු මන්ත්‍රීනි ඩී.ජී. වාසනා උදයංගනී මැතිණිය
09. ගරු මන්ත්‍රී යූ.එල්. තුසිත චාමින්ද මැතිතුමා
10. ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා
11. ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා
12. ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා
13. ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා

**2019-11-27 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති සැකසුම් කමිටු වාර්තාව සම්මත කිරීම සඳහා විපක්ෂව ඡන්දය ලබා දුන් පිරිස**

01. ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා
02. ගරු මන්ත්‍රී කේ.යූ.ජී. යසරත්න මැතිතුමා
03. ගරු මන්ත්‍රීනි පී. ටෙක්ලා ශ්‍යාමලී මැතිණිය
04. ගරු මන්ත්‍රීනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය
05. ගරු මන්ත්‍රීනි ඒ.ආර්.එස්. සංජීවනී අතුකෝරල මැතිණිය

**2019-11-27 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති සැකසුම් කමිටු වාර්තාව සම්මත කිරීම සඳහා ඡන්දය ලබාදීමෙන් වැළකී සිටි පිරිස**

01. ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා
02. ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා
03. ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා

**2019-11-27 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති සැකසුම් කමිටු වාර්තාව සම්මත කිරීම සඳහා ඡන්දය විමසීමේදි සභා ගර්භයේ රැඳි නොසිටි පිරිස**

01. ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** 2019-11-27 දින පැවති මුදල් ප්‍රතිපත්ති හා සැකසුම් කමිටු වාර්තාව වැඩි ඡන්ද අටකින් සභා සම්මත විය.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** II. 2019.12.13 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති සැකසුම් කමිටු වාර්තාව.

ඒක සහා න්‍යාය පත්‍රය හදලා බෙදපු හින්දා සභාවේ න්‍යාය පත්‍රයට ඇතුළත් කරන්න බැරි වුණා. නමුත් සභාවට කලින් කමිටුව තියලා තියෙනවා. ඒකට සභාවේ එකඟත්වය මොකක්ද ඒක අද සභාවට ඉදිරිපත් කරන්න. කමිටු වාර්තාව ඔබ සියලු දෙනාටම ලබා දීලා තියෙනවා.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** ඒක අපි අනුමත කරාට වරදක් නෑනේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** විරෝධතා නෑ නේද මේක ඉදිරිපත් කරනවාට. කමිටු වාර්තාවට විරෝධතා තියෙනවාද?.

2019.12.13 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති සැකසුම් කමිටු වාර්තාව ඒකමතිකව සහා සම්මත විය.

**<u>02. තාක්ෂණික සේවා කමිටුව</u> ඃ-** නැත

**<u>03. නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටුව</u> ඃ-** නැත

**<u>04. පරිසරය සහ පහසුකම් කමිටුව</u> ඃ-** නැත

**<u>(උෟ) ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ, එකතු කල ආදායම් පිළිබඳ ප්‍රගති වාර්තා සහ ප්‍රාදේශීය සභාවට ඉදිරිපත් කිරීමට නියමිත වෙනත් ලේඛන ඉදිරිපත් කිරීම හා සලකා බැලීම ඃ-</u>**

**<u>01. ලැබීම් පිළිබඳ මාසික ප්‍රකාශ</u>**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** 2019 වර්ෂයේ නොවැම්බර් මස මාසික ඒකාබද්ධ ලැබීම් සාරාංශය (ප්‍රා.ස. 16)

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** එම වාර්තාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම වාර්තාව ඒකමතිකව සහා සම්මත විය.

**<u>02. වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ</u>**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** 2019 වර්ෂයේ නොවැම්බර් මස මාසික ඒකාබද්ධ වැය සාරාංශය (ප්‍රා.ස.14)

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** එම වාර්තාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම වාර්තාව ඒකමතිකව සහා සම්මත විය.

**<u>03. එකතු කල ආදායම පිළිබඳ ප්‍රගති වාර්තාව</u>**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** 2019 වර්ෂයේ නොවැම්බර් මස මාසික ඒකාබද්ධ හිඟ ආදායම් ප්‍රකාශය (ප්‍රා.ස. 07)

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** එම වාර්තාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම වාර්තාව ඒකමතිකව සහා සම්මත විය.

( ගරු මන්ත්‍රී කේ.යූ.ජී. යසරත්න මැතිතුමා සභා ගර්භයෙන් පිටවීම සිදුවිය. )

**<u>04. වෙනත් ලේඛන</u>**

<u>I. ප්‍රගතිය</u>

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** 2019 වර්ෂයේ දෙසැම්බර් මස මහා සභා රැස්වීමට ඉදිරිපත් කරන ලද ප්‍රගතිය

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** ප්‍රගතියේ තියෙනවා සභාපතිතුමා නො. 60/1බී, පියදිගම, උක්වත්ත ගිංතොට පාරේ දුරකථන කුළුණක් ඉදිකිරීම කියලා. ඒකෙ විස්තර මුකුත් නෑ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒකට මහජන විරෝධතා තියෙනවාද?

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** බලන්න ඕන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒකට අවසර දෙන්න එපා. මට ඒක පුද්ගලිකවම කියලා දාන්න. අස්සෙන් දාන්න එපා. මට කියලම දාන්න. මේ තොප්පිය අස්සේ තව තොප්පි දාන්න එපා. කියලා දාන්න. ඒකට මම ඉල්ලීමක් කරනවා. සභා තීන්දුවක් ගන්නකම් දෙන්න එපා. සභා තීන්දුවක් ගන්නකම් ගිංතොට කුළුණට අවසර දෙන්න එපා.

**ගරු මන්ත්‍රීනි පී. ටෙක්ලා ශ්‍යාමලී මැතිණිය ඃ-** ගරු සභාපතිතුමා ඇතුළු සියලුම මන්ත්‍රීවරුන්ගෙන් අවසරයි. මගේ ඥාති සොහොයුරාගේ අවසාන කටයුතු සඳහා සහභාගි වූ සැමටත්, පැමිණීමට නොහැකි වී හැමදෙනාටමත් ස්තුතිවන්ත වෙනවා. ඒක කරන්න දෙයක් නෑ. අත්‍යාවශ්‍ය කාරණාවක්. රෝගී තත්ත්වයේ පසු වුණේ. අවමංගල්‍ය කටයුතු සඳහා සහභාගි නොවූ අය ගැන මම කණගාටුවට පත් වන්නේ නෑ. ඒ වගේම ගරු සභාපතිතුමා ඇතුළු පක්ෂ විපක්ෂ නොබලා පැමිණි සියලු දෙනාටත්, විශේෂයෙන්ම මීපාවල කොට්ඨාශය භාර චමින්ද මැතිතුමාටත් ස්තුතිවන්ත වෙනවා. එතුමා දින දෙකක් සංග්‍රහ කටයුතු කරා. එතුමාට අපි විශේෂයෙන්ම ස්තුතිවන්ත වෙන්න ඕන. ඒ වගේම දිවා රෑ නොබලා සියලුම උපකාර කළ සභාපතිතුමාටත්, කාංචනා මන්ත්‍රීතුමියටත්, ඩඩ්ලි මන්ත්‍රීතුමාටත්, අබේසේකර මන්ත්‍රීතුමාටත්, යසරත්න මන්ත්‍රීතුමාටත්, රංගනී මන්ත්‍රීතුමියටත්, ශ්‍යාමිකා මන්ත්‍රීතුමියටත් ස්තුතිවන්ත වෙනවා. විශේෂ උපකාර කරා ඒ අවස්ථාවේ සභාපතිතුමා. ඒ ගෞරවය විශේෂයෙන්ම පුද කරන්න ඕන. විශේෂ ගෞරවය හිමිවන්න ඕන. මරණය වෙච්ච වෙලාවේ ඉඳලා අපේ චනක චමල් මන්ත්‍රීතුමා විශේෂයෙන්ම තරුණ පිරිස් සමඟ එකතු වෙලා උදවු උපකාර කළා. අපිට ඒ කණගාටුදායක අවස්ථාවේ කර ගන්න කිසිම දෙයක් තිබුණේ නෑ. ඒ පුතා අවුරුදු 22 ක පසුවෙන දරුවෙක්. ඒ කටයුතු වල අවසාන කටයුතු දක්වා අප සමඟ ඉඳලා අපිට බොහොම උපකාර කළා. බණ ගෙදර දක්වා ඒ කටයුතු කළ හැම දෙනාටම ස්තුතිවන්ත වෙනවා. ඒ වගේම චමින්ද මන්ත්‍රීතුමා කරපු සේවය අපි අගයන්න ඕන. දින දෙකක් ආහාර සැපයීම කළා. දින දෙකක් අපේ ගෙදරට පිටින් කෙනෙක් ආවත් සංග්‍රහ කිරීම අපහසු කටයුත්තක්. ඒ කර්තව්‍ය භාර අරගෙන ඒ කටයුත්ත කිරීම පිළිබඳව එතුමාට ගෞරවය පුද කරනවා.

ඒ වගේම මම කියන්න කැමතියි ඔබතුමා කිවුවා අපේ කොට්ඨාශයේ වැඩක් කරනවා නම් සභාව බල බලා ඉන්න එපා කියලා. අපි සාමාන්‍යයෙන් මාස දෙකකට වරක් අපේ කොට්ඨාශයේ ශ්‍රමදානයක් කරනවා. අපි සභාව බලාපොරොත්තු වෙන්නේ නෑ. අපි අපේ ගස් කපලා, පස් කණ්ඩි ඇදලා පාරවල් පළල් කරලා හොඳට වැඩ කරා. හැම තිස්සෙම සභාවෙන් බලාපොරොත්තු වුණොත් ඒ වැඩේ කරන්න බැහැ. ඒක නිසා අපි ඒ කටයුත්ත කරනවා. විසි දෙනෙක් විතර ඉන්නවා සමිතියේ. ඒ සමිතිය හරහා අපි වැඩ කටයුතු කරගෙන යනවා. අපි අරයට මෙයාට ඇඟිල්ල දිගු කර කර ඉන්නේ නෑ. සභාපතිතුමාට කරදර කරන්නේ නෑ. ඒ වගේ ඔබතුමාලත් ඔබතුමාලාගේ කොට්ඨාශයේ ඒ වගේ සමිතියක් පිහිටුවා ගෙන වැඩ කටයුතු කරන්න කියලා ඉල්ලා සිටිනවා. අපිට කාටවත් ඇඟිල්ල දිගු කරන්න ඕන නෑ. අපි සමිතියක් පිහිටුවා ගෙන අපේ ගම් ප්‍රදේශය මාසෙකට සැරයක් දෙකක් අපි කොට්ඨාශය ශුද්ධ කර ගන්නවා නම් අපිට කාටවත් ඇඟිල්ල දිගු කරලා කියන්න ඕන නෑ. අසා සිටි ඔබ සැමට ස්තුතියි.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, ගිය සභාවකදී මම ඉල්ලීමක් කරා තොටගොඩ ලන්සිගේවත්ත මාර්ගය ගැසට් කරන්න කියලා. මම හිතන්නේ ඒක තාම සිදු වුණේ නෑ. දැන් මෑත කාලයේ ලොකුවටම ගැටළුවක් වෙලා තියෙනවා ඒක. එක කට්ටියක් එක්ක කතා කරලා විසඳුමකට එන්න බෑ ඒ පාර හදන එකට. උදේ දෙන අදහස නෙමෙයි හවස දෙන්නේ. මොන ආකාරයෙන් හරි ඒක ගැසට් කරන්න කටයුතු කරලා දෙන්න. කීප වතාවක්ම ඉල්ලීම් කරා. ඒකට මොකද සභාපතිතුමා කරන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒකට ලොකු ක්‍රියාදාමයකට යන්න ඕන. එක පාරක් කරත් එකයි, බෝපෙ පෝද්දල ඔක්කොම පාරවල් කරත් එකයි. ඒ මට්ටමේ තියෙන්නේ.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** ඒකට මොකක් හරි විසඳුමක් ලබා දෙන්න බලන්න. මම නැවත ගිහින් කතා කරන්නම්.

ඊළඟ කාරණය තමයි කපුහෙම්පල සායන ගොඩනැගිල්ලේ වතුර ටැංකිය තව වෙනතුරු සවි කරලා නෑ. ඉල්ලීම කරා සවි කරනවා කිවුවා තාම නෑ.

ඊළඟට ලබුදූව ක්‍රීඩාංගනයේ හා කපුහෙම්පල සායන ගොඩනැගිල්ලේ නාම පුවරු තාම නෑ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** නාම පුවරු ටික නම් හදලා ඇත්තේ.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** තව පොඩි කරුණක් ඔබතුමාගේ විශේෂ අවධානයට යොමු කරනවා. මට මේ පඩිපෙල නගින කොට ලොකු අපහසුතාවයක් තියෙනවා. පුළුවන්නම් අර බාර් එකක් සවිකරලා දෙන්න. ඒක ලොකු උදව්වක්. එන පාරෙම බාර් එකක් වෝල් ප්ලග් දාලා සවිකර ගත්තා නම් හරි බිත්තියේ පැත්තකට. ඒක මට ලොකු පහසුවක් උඩට නගින්න. ඊළඟ සභාවට ඉස්සෙල්ලා කරලා දෙන්න කියලා ඉල්ලීම කරනවා.

( ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා, ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා සභා ගර්භයෙන් පිටවීම සිදුවිය. )

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මෙයා මාර ඉල්ලීම්නේ කරන්නේ. එක්කෙනෙකුට ඔච්චර දේවල් කරන්න පුළුවන්ද?.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** එහෙමනම් සභාව පහළට ගේන්න.

**ගරු මන්ත්‍රී ඩබ්.පී. චමින්ද මැතිතුමා ඃ-** ඒක මහා දෙයක් නෙමෙයි. ඒක කරලා දෙන්න.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, ප්‍රථමයෙන්ම උප සභාපතිතුමාගේ වැඩේ කරලා දෙන්න කියලා මම ස්ථිර කරනවා. ඊළඟට අපේ ගුණසේකර තාක්ෂණ නිලධාරිතුමා කපුහෙම්පල කොට්ඨාශයේ 2020-01-01 ඉඳන් වැඩ බලනවා. මට දැන ගන්න ඕන කසළ ව්‍යාපෘති කරන්න ඕන එහෙන්ද මෙහෙන්ද කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එහෙන්. කොට්ඨාශ වෙන් වුණේ නෑ තාම. එක දිගටම එහෙන් යන්නේ. අපි සභා තීන්දුවක් ගත්තට ජනවාරි 01 දා ඉඳන් ග්‍රාම සේවා වසම් ටික මේ පැත්තට ගන්නවා කියලා අපි ඒක එදා නැවැත්වූයේ වරිපනම් ප්‍රශ්නය නිසා.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** අපි ඒක නැවැත්වූයේ වරිපනම් ප්‍රශ්නය හින්දා. හරි ඒක පස්සේ බලන්න ගැටලුකාරි නම්.

පසුගිය රජයේ මුදල් ප්‍රතිපාදන යටතේ සභාවට ගෙන්වූවා වීදි පහන් 60 ක වගේ ප්‍රමාණයක්. ගරු සභාපතිතුමනි මම සභාවක් විදියට ඉල්ලනවා ඒ බඩු අපි දැකපු විදියට ප්‍රමිතියෙන් තොරයි. ගෙනාපු වීදි පහන්වල කිසි ප්‍රමිතියක් නෑ කියලා තමයි මම දැක්කේ. එවැනි භාණ්ඩ මිලදී ගත්තේ මොන නිර්ණායක යටතේද?. ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් තමයි ඒ මිලදී ගැනීම් සිදු කරේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මොන ඒවාද?.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හරහා ආපු ඒවා. ඒ ටික ගැන පරීක්ෂණයක් කරන්න කියලා ඉල්ලීම් කරනවා. මම ඉල්ලීමක් කරනවා මේක සම්බන්ධීකරණ කමිටුවට යවන්න කියලා. මුදල් දාපු එකේ ප්‍රශ්නයක් නෙමෙයි තියෙන්නේ. ඒ මිලදී ගැනීමේ ප්‍රශ්නය තියෙන්නේ ගෙනාපු ඒවා දැකපු විදියට.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒකේ මන්ත්‍රීතුමා වෙන්න ඇති දේ මම කියන්නද?. දැන් අපි දන්නවා ඔය පිළිබඳව ඒ ටු ඉසෙඩ්. පයිප්ප වර්ග තියෙනවා රුපියල් හයසීයේ ඉඳගෙන රුපියල් දෙදාහ විතර වෙනකම්. අර මිල ගණන් කැඳවලා ගන්නවා නම් ගන්නේ අර රුපියල් හයසීයේ පයිප්පය.

( ගරු මන්ත්‍රීනි ඒ.ආර්.එස්. සංජීවනී අතුකෝරල මැතිණිය සභා ගර්භයෙන් පිටවීම සිදුවිය. )

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** මම දන්න විදියට නම් රජයේ මිලදී ගැනීමක් කරන කොට ප්‍රමිතියක් තියෙන්න ඕන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඕක වෙන්න ඇත්තේ පයිප්පයට ගේජ් එක නොදාපු නිසා.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** මිල ගණන් කැඳවද්දි විස්තර ටිකක් ඇතිනේ. මම කියන්නේ සම්බන්ධීකරණ කමිටුවට ඉල්ලීම කරන්න. සභාවෙනුත් ඉල්ලීමක් කරන්න. සභාපතිතුමා ඒකට ඉල්ලීමක් කරන්න සම්බන්ධීකරණ කමිටුවට.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒ කාරණයේදී ඒවා එවපු මන්ත්‍රීවරු ඒකට කටයුතු කරන්න ඕන.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** අපි දකිනවා නම් යම් අඩුපාඩුවක් ඇයි සභාපතිතුමා ඒකට කටවහ ගෙන ඉන්නේ. මොකක්ද තේරුම මේකේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** සම්බන්ධීකරණ කමිටුව කැඳවාවි.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** මම සභාවෙන් ඉල්ලීම කරපු විදියට දාන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එහෙම දාන්න බෑ මන්ත්‍රීතුමා. මේක සහෝදර ආයතන දෙකක්. ඕක ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් සම්බන්ධීකරණ කමිටුව කැඳෙව්වම යන්න.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** ආයතන සහෝදරයෝ වුණාට මන්ත්‍රීවරු සහෝදරයෝ නෙමෙයිද සභාපතිතුමා. මේ මහජන මුදල් සභාපතිතුමා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අපේ මුදල් වියදම් වෙලා නැනේ.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** මහජන මුදල්නේ. අපේ මුදල් නෙමෙයි කියන්නේ මොකක්ද?.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** මෙහෙට එවන්න ඕන නැනේ එහෙම නම්. ඇයි සභාවට එවුවේ.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** අඩුපාඩුවක් කතා කරන්න බැරිනම් මොකක්ද මේ මන්ත්‍රීකමේ ඇති වැදගත්කම. මට මේක ප්‍රශ්නයක් නෑ. සභාවට එවුවේ මේවා. සභාවෙන් මේවා හයිකරන්නේ. ඒවා මිනිස්සු දන්නේ නෑ නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මෙතුමාගේ යෝජනාවක් විදියට යවන්න.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, මෙතනට ආවට පස්සේ ලැබුණ යෝජනාවක් මේ. බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාවයි, අක්මීමන ප්‍රාදේශීය සභාවයි වෙන් වෙන තොටගොඩ පාලම ළඟ අඳුරු ස්වභාවයක් තියෙනවා. එතනට ටිකක් ලොකු වීදි ලාම්පුවක් සවි කරන්න කියන ඉල්ලීම කරනවා.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා, මම කලින් යෝජනාවක් ගෙනාවා මහා සභාවකදී කරාපිටිය පන්සලේ පෝය දවසට එක්රැස්වන කුණු සභාවේ කසළ ට්‍රැක්ටරයෙන් අදින්න පුළුවන්ද කියලා. ඒකට අපිට පියවරක් ගන්න විදියක් නැද්ද?.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අර පාර්කින් එක නොමිලේ කරනවා නම් පියවරක් ගමු.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** එහෙම නෙමෙයි අපිට දෙයක් කරන්න පුළුවන් නම් හොඳයි. නායක හාමුදුරුවෝ ඔබතුමාගෙන් අහන්න කිවුවා. මතක් කරා අද සභාව තියෙනවා නේද කියලා. ඇත්තටම අපිට දෙයක් කරන්න පුළුවන් නම් හොඳයි. එතන පෝය දවසට සිල් ඇත්තන්ට දෙන කෑමවල ඉතුරුවීම් තියෙන්නේ. ඒ ටිකට මොකක් හරි දෙයක් කරන්න පුළුවන්නම් ඇත්තටම ගොඩක් හොඳයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒ ටික ගන්නේ කොහොමද?. ගන්නයි අදින්නයි බෑ. අපිට වෙනම කෙනෙක් දාන්න වෙනවා ඒකට ඒ පාර. එළියේ කොහේ හරි තැනකින් තියා ගන්නවා නම් හරි.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** පන්සල ඇතුලේ තියෙන්නේ. අපිට එළියේ තියන්න පුළුවන් ඊට පස්සේ දවසට අයින් කරනවා නම්. එතන ධර්මශාලාවේ එක්රැස්වන කුණු ප්‍රමාණය විතරයි තියෙන්නේ. උදේ, දවල් දානේ බෙදලා සිල් ඇත්තන්ට, ඊට පස්සේ එකතු වෙන ඉඳුල්, රොඩු ලොකු ප්‍රමාණයක් තියෙනවා. වෙන් කරලා තියෙන්නේ. කඩදාසි වෙනම තියෙනවා. බත් වෙනම තියෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** පෝය දවසට පස්සේ දවසේ ගන්නම්. ගියපු ගමන් දා ගන්න පුළුවන් විදියට හදන්න.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** පෝය දවසේ බාස්කට් වෙන වෙනම තියලා තියෙනවා. ඉඳුල් වෙනම දාන්න, කඩදාසි වෙනම දාන්න, පොලිතීන් වෙනම දාන්න.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** අපි සියල්ලෝම ඇවිල්ලා ඉන්නේ මහජනතාවට සේවය කරන්න. හොඳ ප්‍රශ්නයක් විදියට ජලය පිළිබඳ ප්‍රශ්නය ගෙනාවා. අපි කැන්වසින් යනකොට ඒක අවශ්‍යතාවයක් වුණා. ඊළඟට ජ්ලයිවුඩ් එකේ ප්‍රශ්නය. ඒකත් අපිට සම්පතක්. ඒක රැකගන්න ඔබ සියලු දෙනාම සහයෝගය දැක්වූවා. මට කියන්න තියෙන්නේ 2020 වර්ෂය ලබන්නේ. අපේ රජයක් තුළ අපිට යහපත් ප්‍රතිචාර දක්වලා තියෙනවා. මේ තාක්කල් අපිට සත පහක් වත් ලැබුණේ නෑ. අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාටත්, අගමැති මහින්ද රාජපක්ෂ මැතිතුමාටත්, බැසිල් රාජපක්ෂ මැතිතුමාටත් අපි මේ වෙලාවේ ස්තුතිය පුද කරනවා. මේ වෙලාවේ මට සහයෝගය දක්වපු ගරු සභාපතිතුමාට, ලේකම්තුමාට, නිලධාරි මණ්ඩලයට හා තමුන්නාන්සේලාට සුභ පතනවා. මගේ කොටසේ සංවර්ධන කටයුතුවල මොකක්වත් මට අඩුවෙලා නෑ. සභාපතිතුමා මගේ බාප්පත් නෙමෙයි. පුංචි අම්මගේ පුතත් නෙමෙයි. මම ලක්ෂ හතළිස් දෙකකට ආසන්න ප්‍රමාණයකට සංවර්ධන කටයුතු කරලා තියෙනවා. මම බලාපොරොත්තු වෙනවා 2020 දී මගේ කොට්ඨාශයට තව වැඩ කරන්න. මම සභාපතිතුමා ඇතුළු නිලධාරි මණ්ඩලයටත්, මන්ත්‍රී මණ්ඩලයටත් ලබන්නා වූ 2020 වර්ෂය සුභ නව වසරක් වේවා කියලා ප්‍රාර්ථනා කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ප්‍රගති වාර්තාව ස්ථිර කරන්න.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** එම වාර්තාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

**II. ගෙවීම් අනුමැතියට ඉදිරිපත් කිරීම**

**1. පොදු ගෙවීම්** ඃ-

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ- 01.** බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභා සුහද සුභ සාධක සංගමය රු. 100,000.00

අපේ සභාවේ සුහද සුභ සාධක සංගමය මඟින් රු. 100,000.00 ක මුදලක් ඉල්ලීම කරලා තියෙනවා. අයවැයෙන් මේක වෙන් කරලා තියෙනවා. පහුගිය සභාවකදී මේක ලබා දෙනවාට මන්ත්‍රීවරු විරෝධතාවය පල කළා මන්ත්‍රීවරු සම්බන්ධ කර ගන්නේ නැත්නම් මේක දෙන්න ඕන නැහැ කියලා.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** ඒ ගෙවීම මම ස්ථිර කරනවා.

ඉදිරිකාලයේදී මන්ත්‍රීවරුන්ටත් ලබා දෙන්න කියලා ඉල්ලා සිටිනවා. පුළුවන්නම් මේ අවුරුද්දෙම ලබා දෙන්න කියලා ඉල්ලා සිටිනවා.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** මේක අනුමත කරලා දෙන්න. හැමදාම දීලා අපි නොදී ඉන්න එක හොඳ නෑනේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම ගෙවීම ඒකමතිකව සභා සම්මත විය.

**2. කර්මාන්ත ගෙවීම්** ඃ- නැත

**3. සේවක ණය ගෙවීම්** ඃ-නැත

**III. ඇස්තමේන්තු අනුමැතියට ඉදිරිපත් කිරීම** ඃ-

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ- 01.** නරාවල මාටින් පෙරේරා මාවත සංවර්ධනය කිරීම. රු. 655,000.00

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** එම ඇස්තමේන්තුව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම ඇස්තමේන්තුව ඒකමතිකව සහා සම්මත විය.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ- 02.** නරාවල කාසල් වත්ත නො.265 නිවස අසල පොදු කාණුව සංවර්ධනය කිරීම. රු. 475,000.00

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** එම ඇස්තමේන්තුව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම ඇස්තමේන්තුව ඒකමතිකව සහා සම්මත විය.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ- 03.** නරාවල කාසල් වත්තේ ශාමලී මහත්මියගේ නිවස අසළ පොදු කාණුව සංවර්ධනය කිරීම. රු. 235,000.00

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** එම ඇස්තමේන්තුව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම ඇස්තමේන්තුව ඒකමතිකව සහා සම්මත විය.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ- 04.** මීපාවල බෝගහදූව පාර සංවර්ධනය කිරීම. රු. 500,000.00

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** එම ඇස්තමේන්තුව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම ඇස්තමේන්තුව ඒකමතිකව සහා සම්මත විය.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ- 05.** පෝද්දල දෙණියවත්ත හන්දිය සංවර්ධනය කිරීම. රු. 535,000.00

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** එම ඇස්තමේන්තුව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම ඇස්තමේන්තුව ඒකමතිකව සහා සම්මත විය.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ- 06.** මගදෙණිය මාටින් පෙරේරා මාවතේ කපිල මහතාගේ නිවස අසල පොදු කාණුව සංවර්ධනය කිරීම. රු. 500,000.00

**ගරු මන්ත්‍රී ඩබ්.පී. චමින්ද මැතිතුමා ඃ-** එම ඇස්තමේන්තුව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම ඇස්තමේන්තුව ඒකමතිකව සහා සම්මත විය.

**IV. මිල ගණන් කැඳවීම්** :- නැත

**V. ලිපි ඉදිරිපත් කිරීම** :-

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ- 01.** 2020 වර්ෂයේ සැපයුම්කරුවන්ගේ නාමලේඛනය සභාගත කරනවා.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** එම වාර්තාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම වාර්තාව ඒකමතිකව සහා සම්මත විය.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ- 02.** මීපාවල දූව වත්ත මාර්ගයේ ජල සැපයුම ලබා දීම සඳහා කාණු කැපීමට ප්‍රාදේශීය සභාවේ ජේ.සී.බී. යන්ත්‍රය යොදා ගැනීම. (තාක්ෂණ නිලධාරි දිනූෂ රත්නප්‍රිය මයා)

ගම්වාසීන්ට ජලය ලබා දීමට සභාවේ බැකෝ යන්ත්‍රය යෙදවීම සඳහා යෝජනා කරනවා.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ- 03.** බැකෝ යන්ත්‍රය ලබා ගැනීම සඳහා. (ගරු උප සභාපති, ජේ. ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා)

තොටගොඩ මිතුරෝ සංවිධානය මුලිකත්වයෙන් අක්මීමන, තොටගොඩ, අඹගහ වත්ත, කටුගහහේනේ පදිංචි පී. ජී. අජිත් මයා හට නිවසක් තනා දීමේ ව්‍යාපෘතිය සඳහා මේ ඉල්ලන්නේ. මේ ගමේ අය එකතු වෙලා අසරණ කෙනෙකුට ගෙයක් හදලා දෙනවා උප සභාපතිතුමාගේ මූලිකත්වයෙන්. සියලු දේ ගමේ අය එකතු වෙලා දෙන්නේ. ඒකේ අඩිතාලමේ පස් පුරවන්න මේ ඉල්ලන්නේ. මේ අය ටිපර් යන්ත්‍රය යොදා ගන්නවා. අල්ලපු ඉඩමකින් පස් කපලා පස් ටික පුරවා ගන්න ඉල්ලීමක් කරන්නේ.

**ගරු මන්ත්‍රිනි එම්. ගයාත්‍රි කාංචනා මැතිණිය ඃ-** ගරු සභාපතිතුමනි, උප සභාපතිතුමා කරපු යෝජනාව මම ස්ථිර කරනවා. උප සභාපතිතුමා, මම වගේ පස් කැපුවට කමක් නෑ විකුණගන්න එපා කියලා මම ආදරයෙන් මම ඉල්ලා සිටිනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**04.** ප්‍රාදේශීය සභාව සතු බැකෝ යන්ත්‍රය යොදවා පස් කැපීම සම්බන්ධව. (ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඇතුළු ගරු මන්ත්‍රීවරු කිහිපදෙනෙක්)

මේක දැන් ආවේ වෙන විදියකට, ගියේ වෙන විදියකට. ඒ පිළිබඳව කියන්න ඕන.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** පළාත් පාලන කොමසාරිස්ට ගිහින් තියෙනවා ඔය ප්‍රශ්නය.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කොන්ද කෙලින් තියාගෙන ඔබතුමාම මේක දුන්නා නම් නම්බුයි මීට වැඩිය. ඔබතුමාම මේක හදලා එතනට එකක් කරනවා. මෙතන සද්ද නැතුව ඉන්නවා. ඇත්තටම අබේසේකර මන්ත්‍රීතුමා ඔබතුමා එතනට දීලා තියෙන්නේ වෙන එකක්. පස් කියුබ් 90 ක් විකුණ ගත්තා කියලා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඒවා කොහොමද එහෙම කපන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඇයි කපන්න බැරි. සිරිධම්ම විද්‍යාලයෙන් නොවැම්බර් මාසයේ ඉල්ලීම කරා. දෙමවුපියෝ ඉඩමක් හොයා ගන්නම් කිවුවා.

- මේ සම්බන්ධව සිරිධම්ම විද්‍යාලයේ විදුහල්පතිතුමා විසින් කරන ලද ඉල්ලීම් ලිපිය සභාගත කරන ලදී.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මේක සභාවකට දැම්මද?.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** නෑ දැම්මේ නෑ. කොතනද සභාවට දාන්න ඕන කියලා තියෙන්නේ. සභාවට දාන්න අවශ්‍යතාවයක් නෑ.

**ගරු මන්ත්‍රිනි එම්. ගයාත්‍රි කාංචනා මැතිණිය ඃ-** අබේසේකර මන්ත්‍රීතුමා දන්නේ නැත්නම් දැන ගන්න. මන්ත්‍රීවරයෙක්ගේ යෝජනාවක් ජේ. සී. බී. යන්ත්‍රය යොදවලා කරන්න සභාවට දාන්න ඕන නෑ. මම හිතුවේ ඔබතුමා දේශපාලනයෙන් පරිණතයි කියලා. ඔබතුමාට ඉගෙන ගන්න තමයි මම මේ කියන්නේ. අපි මෙතෙක් දවසක් නිහඬව හිටියා. අවුරුදු දෙකක් දැන් දේශපාලනය කරා. කවදාවත් ඔබතුමන්ලාගේ කොට්ඨාශවල කරන්නේ මොනවාද කියලා හෙව්වේ නෑ. අපි ලක්ෂ ගණන් මාසෙට අතින් වියදම් කරලා දේශපාලනය කරා. සිරිධම්ම විද්‍යාලයට පස් විකුණගෙන කන්න තරම් අපි අභිකුණ්ඨකයෝ වෙලා නෑ. ඔබතුමන්ලාට පුළුවන් හැමදාම චෝදනා කරන්න විතරයි. ඔබතුමන්ලාගේ චෝදනා අපි හැමදාම අහන් හිටියානේ. මම ඒ චෝදනා වලට නිහඬව ඉන්නේ නෑ. මොකද මම බොහොම ලස්සනට දේශපාලනය කරා. අපි දේශපාලනය කරන්නේ එහෙමයි. ගමේ ඉස්කෝලෙට, මගේ දරුවෝ හතර දෙනා ඉගෙන ගන්න ඉස්කෝලෙට අපිම ලබා දීපු ඉඩමකින් පස් ටික දීලා තියෙන්නේ. සුමිත් උප සභාපතිතුමා දන්නවා ඇති එතුමාගේ කලින් කොට්ඨාශය නිසා. ඔබතුමාලා එහෙම චෝදනා කරන්න එපා. ගෑණු කෙනෙක් එක්ක හැප්පෙන්න එපා. මම සියලු දෙනාගෙන්

ඉල්ලන්නේ. හරිම ලැජ්ජ වෙන්න ඕන කාන්තාවක් එක්ක හැප්පෙන කොට. මේවා හොයලා බලලා චෝදනා කරන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමා ගිහින් කොමසාරිස්ට දුන්නා. ඔබතුමා ඇහුවද අපෙන්. ඔබතුමා හැමදාම යට ගේම් ගැහුවේ.

**ගරු මන්ත්‍රිනි එම්. ගයාත්‍රි කාංචනා මැතිණිය ඃ-** එහෙම කරන අයට, එහෙම හම්බ කරන අයට මේ චෝදනා කරන්න. මම නිහඬව ඉන්නේ නෑ. මට මඩපාරක් මේක, දේශපාලනයෙන් හම්බ කර ගන්නවා කියලා. මට කිසි කෙනෙක් ගැහුවොත් මම ඒකේ කෙළවරට යනවා. මම බොහොම අවංකව දේශපාලනය කරන්නේ. මගේ අතින් මාසෙකට ලක්ෂයක් විතර වියදම් වෙනවා. මුළු බෝපෙ පෝද්දල හැමතැනම බැලුවම මම උදවු නොකරපු තැනක් නෑ. එහෙම අපිට චෝදනා කරන කොට ලොකු වේදනාවක් එනවා. කාන්තාවක් එක්ක හැප්පෙන කොට හොයලා බලලා චෝදනා කරන්න කියලා මම ආදරයෙන් ඉල්ලා සිටිනවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ගරු මන්ත්‍රීතුමියනි, ඔබතුමියට මම චෝදනා කරේ නෑ කොහේවත්. මම ඔබතුමියට චෝදනා කරේ නෑ. අද පස් අදින්න නිදහස දීලා තිබුණට පස් කපන්න අවසර ගන්න ඕන. පස් කපන්න අවසර අරගෙන නෑ.

**ගරු මන්ත්‍රිනි එම්. ගයාත්‍රි කාංචනා මැතිණිය ඃ-** ඒක මගේ හැකියාව.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඒක හොඳ හැකියාවක්. පස් කපන්න අවසර අරගෙන ඕන අදින්න. අපි දන්නවා කවුරු කිවුවත් නොකිවුවත් පස් කොච්චර එතනට ගියාද කියලා. පස් කපපු තැන දැන් බලයි. බැලුවම කියන්න පුළුවන් කොච්චර කපලා තියෙනවද, එතනින් ගියාම තව කොච්චර පිටට ගිහිල්ලද කියන එක. පරීක්ෂණයක් කරොත් එහෙම ඔබතුමියට තමයි වඩාත්ම හොඳ. සභාපතිතුමාට තමයි වඩාත්ම හොඳ. පරීක්ෂණයෙන් නිදහස් වුණාම ඒක නිදහස්.

**ගරු මන්ත්‍රිනි එම්. ගයාත්‍රි කාංචනා මැතිණිය ඃ-** අබේසේකර මන්ත්‍රීතුමා ආත්ම ගෞරවය එක්ක මේ සෙල්ලම් කරන්නේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඔබතුමියට නම් මම කොහොමත් චෝදනා කරේ නෑ.

**ගරු මන්ත්‍රිනි එම්. ගයාත්‍රි කාංචනා මැතිණිය ඃ-** අද උදේ සංවර්ධන නිලධාරි කෙනෙක් කතා කරලා කියනවා කාංචනා මන්ත්‍රීතුමිය පස් විකුණගෙන මාට්ටු වෙලා තියෙනවා කියලා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** කවුද කියලා තියෙන්නේ.

**ගරු මන්ත්‍රිනි එම්. ගයාත්‍රි කාංචනා මැතිණිය ඃ-** මම නම් වශයෙන් කියන්නේ නෑ. මෙතන ඉන්න මන්ත්‍රීවරයෙක් කේලම් කිවුවා කියලා තියෙන්නේ. ගෑනු කෙනෙක් වෙලත් මම කේලම් කියන්නේ නෑ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මම නම් ඔබතුමියට කියලා නෑ. මම කියලා තියෙන්නේ සභාවේ ක්‍රමයක් නෑ කියන එක. එහෙම කිවුවා නම් කියන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මෙහෙම සභාවක්. මන්ත්‍රීවරු පොදුවේ අනිත් අය හිතන්න මෙහෙම යන්න පුලුවන්ද කුහක මට්ටමින්. උඩ වොලිබෝල් කෝඩ් එකක් හදනවා පුද්ගලික ඉඩමක. ඉස්කෝලෙට ඒකේ පස් ටික යනවා. මේ වගේ කුහක මන්ත්‍රීවරු එක්ක සභාවක් යන්න පුළුවන්ද?. කුහකකම පිරිලා. මේක කරන්න ගියාම තමයි ඔක්කොම. එතනට පෙත්සම ගහනවා. අපෙන් අහන්නෙත් නෑ. මෙතනට වෙන කෙනෙක් හරහා යෝජනා ඉදිරිපත් කරනවා. මොන තරම් බාල වැඩක්ද?. පිහියෙන් අනින්න මන්ත්‍රීතුමා ඔයිට වැඩිය හොඳයි. ඉස්සරහට ඇවිල්ලා පිහියෙන් අනින්න කුහක හැත්තකුත් එක්ක එකතු වෙලා.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා, ප්‍රාදේශීය සභාවක් කියන්නේ මහජනතාවට සේවය සපයන ආයතනයක්. මම හිතන්නේ ඔය වගේ පහත් වැඩ කවුරුවත් කළ යුතු නෑ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** උප සභාපතිතුමා, ඔබතුමාගේ රැකියාවට ගහන්න හදපු මිනිස්සු ඔය. ඔබතුමා තොටගොඩ විද්‍යාලයේ පස් විකිණුවා කියලා ඔබතුමාගේ රස්සාවට ගහන්න හදපු මිනිස්සු මේ.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** අපි වැඩක් කරන කොට කල්පනා කරන්න ඕන මේක කා වෙනුවෙන්ද කරන්නේ කියලා. මන්ත්‍රීවරු අතර පෞද්ගලික අමනාපකම් වෙනම තියාගන්න. හැබැයි මේ කාර්ය මොකක්ද කියලා හිතන්න. සිරිධම්ම විද්‍යාලයේ අවශ්‍යතාවයට සභාවෙන් ඒ සම්පත් දුන්නා. ඒක නීත්‍යානුකූලව සභාපතිතුමා බලලා දීලා තියෙන්නේ. හැබැයි පහත් විදියට ඔය වගේ වැඩ කරන්න එපා අබේසේකර මන්ත්‍රීතුමා. කාටත් කියන්නේ. මේ ජනතාව ලොකු සේවයක් අපේ සභාවෙන් බලාපොරොත්තු වෙනවා. ඒ දෙමවුපියෝ ඒ ඉල්ලීම කරා. ඉල්ලීමට ඇහුම්කන් දීපු සභාපතිතුමා ඒක දුන්නා. ඇයි අපි මේ පහත් විදියට ඒ වැඩේ කරන්නේ. මම ජේ.සී.බී. එක ඕන වුණහම නීත්‍යානුකූලව ඉල්ලීම සභාවට දැම්මා අද. අසරණ රෝගියෙකුගේ නිවස කඩාගෙන වැටුණා. දරුවෝ දෙන්නෙක් ඉන්න දෙමව්පියෝ ඒ. ඒකයි මම ඉල්ලුවේ. සභාවක් හැටියට ඒ දේවල් දෙන්න ඕන. වාර්ෂිකව දරුවන්ට පොත් කට්ටලය දෙන්න ඕන. ඒක නීත්‍යානුකූලද බලලා කොමසාරිස්තුමා ගාවට යවලා, ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය අරගෙන දෙන්න ඕන. නිවාසයක් හදන්න වාර්ෂිකව කොට්ඨාශයට. සභාවෙන් ගන්න ඒ අවශ්‍ය සම්පත්. අරගෙන කරලා දෙන්න. සභාවේ එක්කෙනෙක් වැඩ කරන කොට තව කෙනෙක් කකුලෙන් අදින එක මහ පහත් වැඩක්. ඒවා අයින් කරලා එකමුතුව වැඩ කරමු. එච්චරයි මම ඉල්ලන්නේ. බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාවේ බලය අපිට අවුරුදු හතරකට ජනතාව දීලා තියෙන්නේ. ඇයි මේ තුට්ටු දෙකේ වැඩ කරන්නේ. ඒවා කරන්න එපා. මගේ නම් අත්සනකුත් නෑ. කතාවකුත් නෑ. මම ඔය වගේ තැන්වල හිට ගන්නෙත් නෑ. ජනතාවට සේවය කරන්න එකතු වෙන්න. බොහොම ස්තුතියි.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, විද්‍යාලයට පස් දෙනවාට මම විරුද්ධ නෑ. හැබැයි එහෙම දෙන්න ඕන වුණාම ක්‍රමයක් තියෙනවා. ඔබතුමා හිතන්න. අරහේ ගෙදර අසරණයි කියලා මෙහෙම දෙන්න ගියහම කොහොමද මම අහන්නේ කරන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඉතිං ඒක තමයි මම තාක්ෂණ නිලධාරිව දාලා එතුමාගේ අධීක්ෂණය යටතේ කරේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** හෘද සාක්ෂියක් තියෙනවා නේද?.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** හෘද සාක්ෂියක් තියෙනවා.

**ගරු මන්ත්‍රී ඩබ්.පී. චමින්ද මැතිතුමා ඃ-** ඔබතුමාටත් හෘද සාක්ෂියක් තියෙනවානේ මහත්තයෝ. ඔබතුමා කරන වැඩත් ඒ හෘද සාක්ෂිය අනුව කරන්නකෝ.

( ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා සභා ගර්භයෙන් පිටවීම සිදුවිය. )

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අබේසේකර මන්ත්‍රීතුමා මට බලය නැත්නම් මාසයක් බලන් ඉන්නේ නැතුව මේක කරන්න මම මෙතන ඉන්නවට වැඩිය හොඳයි මේක දාලා යන එක. මම මාසයක් බලන් ඉන්න ඕනද පස් ටික කපලා දෙන්න. ඉස්කෝලේ පටන් ගන්න කලින් ඒ ටික කර ගන්න බැරි නම් මම මාසයක් බලන් ඉන්න ඕනද පස් ටික දාන්න.

**ගරු මන්ත්‍රී ඩබ්.පී. චමින්ද මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, ඔබතුමා කොන්ද කෙලින් තියාගෙන වැඩ කරන්න. ඔබතුමා වැරදි කරාම අපි වැරදියි කියනවා. හැබැයි කකුලෙන් අදින ඕන කුහකයෙකුට විරුද්ධව ඔබතුමා එක්ක නැගී සිටින්නට, ඔබතුමා සමඟ මන්ත්‍රී කණ්ඩායමක් ඉන්නවා කියලා මතක තියා ගන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම එක්සත් ජාතික පක්ෂයේ අනෙක් මන්ත්‍රීවරුන්ගෙනුත් ඉල්ලා සිටිනවා හෘද සාක්ෂියට අනුව වැඩ කරන්න. මේ වගේ කුහක සභාවක් යන්නේ. ජනතා විමුක්ති පෙරමුණත් ඒ තත්ත්වයට වැටිලා. ඒකයි අපිට කණගාටු.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, මේ ලියුම ඉදිරිපත් කිරීම පිළිබඳව කතා කරන්න ඕන. අපේ සහෝදර මන්ත්‍රීවරයා, ඉන්දික විජයවික්‍රම මැතිතුමා මේක ඉදිරිපත් කරේ. ඇත්තටම මේකේ පස් දීපු එකේ වැරැද්ද නෙමෙයි තියෙන්නේ. ඉස්සෙල්ලා බලන්න ඕන රටේ නීතිය කියලා එකක් තියෙනවානේ. ඒ නීතිය පස් ප්‍රවාහනය කරන්න ඉවත් කරලා තියෙනවා. හැබැයි පස් කපන්න බලපත්‍ර තියෙනවාද නැද්ද බලන්න එපැයි ඉස්සෙල්ලා. දැන් මෙතුමිය කිවුවා මගේ හැකියාව කියලා ඒ. එහෙම හැකියාවක් මේ මන්ත්‍රීතුමියට කොහොමද එන්නේ. රටේ නීතියක් කියලා එකක් නැද්ද?.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** රටේ නීතිය නෙමෙයි, අඩි 04 කට වඩා අඩු පස් කපන්න පර්මිට් ගන්න ඕන නෑ.

**ගරු මන්ත්‍රී ඩබ්.පී. චමින්ද මැතිතුමා ඃ-** මන්ත්‍රීතුමා කිව්වා පස් අදින්න පර්මිට් ඕන නැති වුණාට පස් කපන්න පර්මිට් ඕන කියලා. පස් අදින්නත් පර්මිට් ඕන වගේම කුඹුරු ගොඩකරන්නත් පර්මිට් දීලා නෑ. කුඹුරු ගොඩ කිරීම නිසා සිදු වෙච්ච දේවල්, හෝළුවාගොඩ සිදු වෙච්ච දේවල් තියෙනවා. කරුණාකරලා ගිහිල්ලා ඒවත් බලන්න.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** ඔබතුමාලගේ කොට්ඨාශයේ එහෙම දෙයක් වෙලා නම් ඔබතුමාලාගේ යුතුකම තමයි ඒක සභාවට ඇවිත් කියන එක. හැබැයි මෙච්චර කාලයකට කියලා නැතේ ඔබතුමාලා. මේ ඩීල් එකක් ගහන්නේ. දෙපැත්තකට බේදිලා ගාණට ගහනවා ඩීල් එක.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම දෙන්නම් සිරිධම්ම විද්‍යාලයේ විදුහල්පතිතුමාට මොකක්ද ඩීල් එක කියලා. එතුමා එතකොට එතුමාගේ විද්‍යාලය ගැන බලයි. හොඳ කරන්න ගිහිල්ලා අන්තිමට අපිට කෙළවෙනවා. මම එතුමාට කියන්නම්.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** ඩීල් එක කියලා මම මතුකරේ ඒක නෙමෙයි ගරු සභාපතිතුමා. ඔබතුමා කේන්ති ගන්න එපා. මම අහනවා මෙතුමිය ඉඳගෙන කියනවා මෙතුමියට අවසර ගන්න ඕන නෑ කියලා. ඔබතුමා කියනවා අඩි 04 ට අඩු කණ්ඩියක් කපන්න අවසර ඕන නෑ කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම සභාපතිවරයා විදියට සිරිධම්ම විද්‍යාලයට පස් වුවමනා වුණාම මම බැකෝ යන්ත්‍රයක් දාලා පස් කැපුවා. ඔබතුමා ඕන දෙයක් කරන්න. මම ඉදිරියටත් මිනිස්සුන්ට සාධාරණය කරනවා.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** සිරිධම්ම විද්‍යාලයට පස් ඉල්ලපු එකේ වැරැද්දකුත් නෑ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමාලා ඔය මට්ටමට එන්න එපා මන්ත්‍රීතුමා.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** සිරිධම්ම විද්‍යාලයෙන් පස් ඉල්ලපු එකේ වැරැද්දකුත් නෑ ඔබතුමා දීපු එකේ වැරැද්දකුත් නෑ. මම අහන්නේ දැන් මෙතුමිය කියපු කාරණය.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කලිනුත් පස් ප්‍රවාහනය කරන්න බලපත්‍ර ඕන වුණේ නෑ. කලිනුත් අපි බැකෝ යන්ත්‍රය දාලා කැපුවා අපිට ඕන තැන්වල.

**ගරු මන්ත්‍රීනි එම්. ගයාත්‍රි කාංචනා මැතිණිය ඃ-** අනිල් මන්ත්‍රීතුමා නීතිය දන්නේ නැතුව කතා කරන්නේ. පස් කියුබ් 35 ට අඩුවෙන් පස් කපනවා නම් ග්‍රාම නිලධාරි මහත්තයාට පුළුවන් අවසර දෙන්න. ඒක මම ග්‍රාමනිලධාරි මහත්තයා එක්ක කතා කරලා කරාද, පොලීසිය එක්ක කතා කරලා කරාද කියන එක අදාළ කාරණයක් නෙමෙයි මම හිතන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමාලා 3% ට බැස්සා මන්ත්‍රීතුමා. 3% ට ලංකාවේ ප්‍රතිශතය බැස්සේ කුහක ප්‍රතිපත්තිය හින්දා. තවදුරටත් ඔහොම යන්න එපා. දැන්වත් ඕක වෙනස් කරන්න. දකින විදිය වෙනස් කරන්න. 1% ක් වත් ඉතුරු වෙන එකක් නෑ මේ විදියට ගියොත්.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** 3% ට වඩා පහළට බහිනවාද කියන එක නෙමෙයි ප්‍රශ්නය.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කුහක වැඩ කරන්න එපා. ළමයි දහස් ගණනක් ඉගෙන ගන්න ඉස්කෝලේ මේ.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** මම අහන්නේ සිරිධම්ම විද්‍යාලයට පස් දීපු එකේ වැරැද්දක් නෙමෙයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමාලා කොහොමත් කියන්නේ ඔහොමනේ. ඒක වැරැද්දක් නෙමෙයි. මේක වැරදි. ඔය විදියට කරන්න බෑ මන්ත්‍රීතුමා දෙයක්.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** ඔබතුමා කියන්නේ සිරිධම්ම විද්‍යාලයට පස් කියුබ් කීයක් දැම්මා කියලද?.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** පස් කියුබ් 25 යි.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා :-** පස් කියුබ් 25 ද එතකොට කැපුවේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** බලන්න ගිහින්. වරුවක් යනකොට බැකෝ එක ඇවිල්ලත් ඉවරයි මෙතනට සිරිධම්ම විද්‍යාලයේ පස් ටික තුනී කරලා. ඔබතුමා කොහොමද කියන්නේ. දවසට පස් කියුබ් කීයක් කපන්න පුලුවන්ද බැකෝ එකකින් එතකොට. පෙ.ව 10.00 ට මෙතනින් ගියා. ප.ව 03.00 ට මෙතනට ඇවිල්ලත් ඉවරයි. පස් කියුබ් 25 ඇදලා තුනී කරලත් ආවේ. පැය 05 ක් තුල පස් කියුබ් 25 කට වැඩිය කපන්න පුළුවන්ද?. තුනී කරන්න පුළුවන්ද?. මේක ගැන මන්ත්‍රීතුමා විහිළු කතා කරන්න එපා.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා :-** ඕක ගැන සභාවට කියන්න තිබුණානේ ඔබතුමාට. දැන්නේ කිවුවේ. ඔය ලියුම එනකම් කිවුවේ නැනේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** ඒක තමයි දැන් කිවුවේ. සභාවක් තියෙන්න එපැයි කියන්න. කියන්නේ මොකටද?. ප්‍රශ්නයක් එන්න එපැයි උත්තර දෙන්න. මම අංජනම් බලන්න ඕනද?.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා :-** ඕවා සිල්ලර වැඩ මන්ත්‍රීතුමා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** විහිළු කතා කියන්න එපා මන්ත්‍රීතුමා. කරුණාකරලා වාඩි වෙන්න. මේක විහිළු කරන වෙලාවක් නෙමෙයි.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා :-** මේක ඔබතුමාලාගේ පටන්ගැනිල්ල.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** අපි එහෙම තමයි වැඩ කරන්නේ. අපි වෙනුවෙන් වැඩ කරන්නේ. අපි අදටත් කියනවා ගිය ආණ්ඩුව දාපු මේ නීතිය තද වැඩියි. ගිය ආණ්ඩුව පස් වලට දාපු නීතිය තද වැඩියි. ඒක අඩු වෙන්න ඕන. අපි අදටත් ඉන්න මතය එච්චරයි. අපි එච්චර තද කරන්නේ නැනේ ඉතිං. අපි ලිහිල් කරලා මිනිස්සුන්ට කරන්න පුළුවන් දේ කරනවා. හැබැයි වැරදි දෙයක් තියෙනවා නම් පෙන්වලා දෙන එකත් ඔබතුමන්ලාගේ යුතුකම. අපි එහෙම කවදාවත් බාධා කරන්නේ නෑ. වෙන වැරැද්දක් සිද්ධ වුණේ නෑ. ඉතාමත් වගකීමෙන් කියන්නේ. සුමිත් උප සභාපතිතුමා ඉස්කෝලෙට යන පාරක් කැපුවා කියලා මෙතුමාට විරුද්ධව අබේසේකර මන්ත්‍රීතුමා නොගිය තැනක් නෑ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා :-** ඒක නීති විරෝධියි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** නොගිය තැනක් නෑ මන්ත්‍රීවරයාගේ රස්සාව නැති කරන්න. ඇත්ත කතා කරමු. ඔබතුමා මට දැන් කියනවා ඔබතුමත් එක්ක මමත් හිටියා කියලා. මම නමුත් තෝරා බලලා ගනිපු ඒවාට විතරයි අත්සන් කරේ. අද වුණත් කියන්න පුළුවන්. මෙතුමාට රස්සාව නැති වෙන එකට මම අත්සන් කරේ නෑ. අදටත් ඒ ගැන සතුටු වෙනවා. අස්කරන්න ලියුම් ගැහුවේ. රස්සාව නැති කරන්න ලියුම් ගැහුවේ.

හැබැයි අබේසේකර මන්ත්‍රීතුමා කරන දෙයක් අහන්න. හැංගි හොරා ඕන නෑ. සභාපතිතුමා මෙහෙම කැපුවද නැද්ද කියලා අහන්න. ඔබතුමා හැංගිලා ඉඳලා ඉන්දික මන්ත්‍රීතුමා ලවුවා ලියුම එවනවා. සභාවේ ඇවිල්ලා කෑ ගහන්නේ තවත් මන්ත්‍රීවරයෙක්. සභාවේ ඇවිල්ලා කෑ ගහන්නේ පස් විකුණුවා කියලා වෙනත් මන්ත්‍රීවරයෙක්. අද එතුමා නිශ්ශබ්දයි. ඔන්න මම කිවුවම නැගිට්ටා.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා :-** මම ඇවිල්ලා ඇහුවා.

(සභාව පැහැදිලි නොවීය.)

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා :-** තාක්ෂණ නිලධාරි දන්නේවත් නෑ මේ ගැන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** තාක්ෂණ නිලධාරි දන්නවා.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා :-** තාක්ෂණ නිලධාරි නිවාඩුයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** තාක්ෂණ නිලධාරි නිවාඩු වෙන්නේ කොහොමද?

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා :-** ලියුමට අත්සන් කරේ ඊයේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** තාක්ෂණ නිලධාරි ලියුම් වලට අත්සන් කරනවාද, මම දාලා යවන නියෝගය ක්‍රියාත්මක කරනවා ඇරෙන්න එතුමා මේවා අත්සන් කරනවාද, ඔබතුමා මෙතෙක් නිශ්ශබ්දව හිටියා. ඔබතුමා මගෙන් ඇහුවේ නෑ එදා ඇවිල්ලා. ඔබතුමා වීරයෙක් වගේ කෑ ගැහුවා පස් විකුණලා කියලා. පස් කපලා පස් විකුණලා කියලා ඔබතුමා මෙතන වීරයෙක් වගේ කෑ ගැහුවා. අපිට කොන්ද කෙලින් තියන් කතා කරන්න පුළුවන්. ඔබතුමාලා දැන් යන්න. මට පෙන්වන්න පස් පිටට දාපු එක තැනක්. පිටට පස් දැම්මානම් දැන් යමු. ගිහින් පෙන්වන්න මෙතනට දැම්මා කියලා. ඔබතුමා මගෙන් ඇහුවාද මෙතෙක්.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** මම ඉතිං ක්‍රමවේදය ඇහුවේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමා අබේසේකර මන්ත්‍රීතුමාට කියලා එතුමා ලවුවා ලියුම යැව්වා. ඒ තරම් පහත් තත්ත්වයට වැටෙන්න එපා මන්ත්‍රීතුමා. මම ඉල්ලීමක් කරේ ඒකයි. ප්‍රශ්නයක් තියෙනවානම් කතා කරලා බේරගමු අපි.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** මම අබේසේකර මන්ත්‍රීතුමාට කතා කරලා කිවුවේ නෑ. මම කතා කරේ නෑ.

**ගරු මන්ත්‍රීනි එම්. ගයාත්‍රි කාංචනා මැතිණිය ඃ-** ගරු සභාපතිතුමා එහෙම නම් පහුගිය කාලේ අපිට කතා කරලා කිවුවා අන්න මන්ත්‍රීතුමිය උළුවිටිකේ ඉස්කෝලේ ගාව පස් කපලා විකුණනවා කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔන්න කතා. උළුවිටිකේ පස් කපලා විකුණනවා කියලා කොච්චර පැමිණිලි ආවද?. අපි කාටවත් කිවුවද?

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** පහුගිය සභා වාර්තා අරගෙන බලන්න කවුද කැපුවේ කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** උළුවිටිකේ ඉස්කෝලේ අයිනේ පස් කපලා විකුණුවා කියලා ලොකු චෝදනාවක් ආවා පහුගිය කාලේ. ඔබතුමාලා ඒවා කරන්නයි අනිත් අයට තර්ජනය කරන්නයි.

**ගරු මන්ත්‍රීනි එම්. ගයාත්‍රි කාංචනා මැතිණිය ඃ-** අපි කිසිම මන්ත්‍රීවරයෙකුට හානියක් කරන්නේ නෑ. අපි දන්නවා ඒක බොරුවක් කියලා. අපි චෝදනා කරේ නෑ බොරුවට කෑ ගහලා. පස් විකුණනවා කියලා අපිටත් දාන්න තිබුණා. අපි එහෙම කරේ නෑ. අදටත් සාක්කි එක්ක ඉදිරිපත් කරන්න පුළුවන් කතා කරලා කියපු කට්ටිය.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමා මෙතන ඇවිල්ලා කෑ ගැහුවට මගෙන් නිකමට ඇහුවද?

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** මම ලේකම් මහත්තයාගෙන් ඇහුවා මෙහෙම සිද්ධියක් වෙලාද කියලා. ගුණසේකර මහත්තයාගෙන් ඇහුවා. දන්නේ නෑ. එතකොට ඔහොම ජේ. සී. බී. එක යවන්න පුළුවන්ද කියලා මම ඇහුවේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඉතිං ලේකම්තුමා දන්නේ නෑ. එතුමාට නියෝගයක් දීලා තියෙන්නේ මම.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** කාටද නියෝගය දීලා තියෙන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** තාක්ෂණ නිලධාරීට. තාක්ෂණ නිලධාරීට නියෝගයක් දීලා තියෙන්නේ.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** මම ජේ. සී. බී. එක ඉල්ලලා තිබුණා රොඩු සුද්ධ කරන්න. අර කුණු දාපු තැන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කාගෙන්ද ඉල්ලුවේ. මගෙන් ඉල්ලලා නෑ.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** සභා යෝජනාවක් දාලා තියෙනවා. කොච්චර කල්ද? ටයර් එක කැපිලයි කියලා හිටියා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමා කොහොමත් වැඩ කරන්නේ වෙනත් අයගෙන් ඉල්ලලානේ. නොවෙන කොට මට චෝදනා කරනවා. වැඩේ නොවෙන කොට මට චෝදනා කරනවා. මන්ත්‍රීතුමා දෙයක් තියෙනවා නම් මගෙන් අහන්න. ඒක නොවෙනවා නම් වෙනත් ඕන කෙනෙක්ගෙන් අහන්න සභාපතිවරයා කියන දේ ඇත්තද කියලා.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** ඔබතුමා හිටියේ නෑ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** හිටියේ නැත්තේ මොකද මම හිටියා.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** හිටියේ නෑ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඉතිං ඔබතුමාට දුරකථනයෙන් දැනුම් දෙන්න තිබුණා නේ. අනිත් හැමදේම දුරකථනයෙන් දැනුම් දෙන ඔබතුමාට ඒකත් අහන්න තිබුණානේ. සභාපතිතුමා මෙන්න පස් කපනවා. කොහොමද එහෙම කපන්නේ කියලා අහන්න තිබුණනේ. හිතේ දෙයක් තියෙන කොට මන්ත්‍රීතුමා එහෙම අහන්න බෑ. ඇත්ත කතාව ඒකයි. මගේ හිතේ දෙයක් නෑ. මම විවෘතව කතා කරනවා. හෙට එන ඕන දේකට විවෘතව මුහුණ දෙනවා. මගේ හිතේ මුකුත් නෑ.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** මම කියන්නේ පාර දෙපැත්තේ එකතු කරපු කුණු ටික ගෙනියන්න බැරි වුණා. ඊයේ පෙරේදා හතර දෙනෙක් හම්බ වුණා ඇරෙන්න රොඩු ටික සුද්ධ කරගන්න විදියක් නෑ අපේ කොට්ඨාශයේ. අර පාර දෙපැත්තේ ගොඩ ගහලා තියෙන කුණු ටික අස් කර ගන්න බැරි වුණා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඇයි ඒක බැරි වුණේ. කාගෙන්ද ඉල්ලීම කරේ.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** බැරි වුණා ඉතිං. ඉල්ලීම කරා. ටයර් එක කැපිලා කියලා හිටියා. විජේපාල මහත්තයාට කිව්වා. ලේකම් මහත්තයාට කිව්වා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමා අවශ්‍ය කෙනාගෙන් ඉල්ලීම කරලා නෑනේ. ඔබතුමා මගෙන් ඉල්ලීම කරලා නෑනේ.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** ඉදිරි කාලය තුළවත් ඕක කරලා දෙන්න. ජේ.සී.බී. එකෙන් දාලා ට්‍රැක්ටරයට පටවලා අයින් කරන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** හරි කරලා දෙන්නම්. ප්‍රශ්නයක් තියෙනවා නම් කරලා දෙන්නම්. ලේකම්තුමා මේක බලලා කරලා දෙන්න. එහෙම ප්‍රශ්නයක් තියේ නම් කරලා දෙන්න.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** ටයර් එක කැපිලා කියලා දැන් මාස දෙකක් විතර වෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමා දන්නවා ටයර් දෙක දාලා සති දෙකක් තුනක් වෙන්නේ කියලා. ඔබතුමාගේ වැරැද්දක් මම කියන්නම් මන්ත්‍රීතුමා. ඔබතුමා විජේපාල මහත්තයාගෙන් ඉල්ලනවා. එයාටත් උත්තරයක් දෙන්න බෑ. එයා ඒ පාර නිශ්ශබ්ද වෙලා ඉන්නවා. ඔබතුමා ලේකම්තුමාගෙන් ඉල්ලනවා. එතුමාටත් උත්තරයක් දෙන්න බෑ සමහර වෙලාවට. ඔබතුමා මගෙන් ඉල්ලන්නේ නැහැ. ඔබතුමා මගෙන් ඉල්ලලා නොකෙරුණොත් කියන්න. අනිත් මන්ත්‍රීවරු මගෙන් ඉල්ලනවා නම් ඇයි ඔබතුමාට ඉල්ලන්න බැරි. සුගත් මන්ත්‍රීතුමා මගෙන් ඉල්ලනවානේ. ඇයි ඔබතුමාට ඉල්ලන්න බැරි. ඉල්ලන්නකෝ. ඉල්ලලා නොකෙරුණොත් කියන්න.

<u>**(උ෴) රැස්වීම් කැඳවීම් දැන්වීමේ දක්වා ඇති වෙනත් කාරණා ඃ-**</u> නැත

මීළඟ මහා සභා රැස්වීම 2020.01.21 වන අඟහරුවාදා දින පෙ.ව 09.30ට බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේ පැවැත්වෙන බව දන්වා සිටිමින් මහා සභා රැස්වීම අවසන් කරන ලදී.

දිල්රුක් එන්. අබේකෝන්,
සභාපති,
බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාව.